ශීර්ෂය 126 - අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 126- අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව, 2025 අගෝස්තු 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින් , මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම ,විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම සඳහා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නියමිත දිනයට පහත සඳහන් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) වාර්ෂික මූල්‍ය ප්‍රකාශන		
(i) යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන		
1999 අංක 44 දරන යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල් පනතේ 9.2, 9.3 වගන්ති අනුව හා 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4.4 (අ)ජේදය හා 4.3 ජේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස දෙකක් ඇතුළත අරමුදලේ මූල්‍ය ප්‍රකාශන, කාර්යසාධන වාර්තාව සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණද 2015-2024 කාලසීමාවට අදාල වර්ෂ 10 ක මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ශ්‍රී ලංකා යුනෙස්කෝ කොමිෂන් සභාවේ ගණන්දීමේ නිලධාරී ලෙස මහලේකම් කටයුතු කල යුතු අතර එම තනතුර 2025 ජනවාරි සිට පුරප්පාඩුව පවතී. මහලේකම් පත් වූ පසු ගිණුම් අත්සන් කර විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය හා යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල් පනත ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වීම.
(ii) තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහනට (TEDP) අදාල මූල්‍ය ප්‍රකාශන		
අවබෝධතා ගිවිසුමේ 10 ජේදයට අනුව විදේශ ණය ව්‍යාපෘතියක් වූ තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහනට (TEDP) අදාල මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් 2022 වර්ෂයේ සිට එම මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023 හා 2024 වර්ෂ ඇතුලත 2019,2020 හා 2021 වර්ෂයන්ට අදාළව අවසන් ගිණුම් වාර්තා පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි. ඉතිරි වර්ෂයන්ට අදාලව අවසන් ගිණුම් වාර්තා සකස් කිරීම ද මේ වන විට ආරම්භ කර ඇති බව.	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය හා අවබෝධතා ගිවිසුම ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වීම.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) හෙළිදරව් නොකිරීම

යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගණුදෙනු ඇති අවස්ථාවලදී එම විශේෂිත ගණුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් "වාර්තාකරණ පදනම" යටතේ සිදුකල යුතු බවට, 2025 පෙබරවාරි 18 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් SA/MAA/02/01/01 දරන ලිපිය මඟින් නිකුත් කර ඇති 06/2024 දරන චක්‍රලේඛයට සිදුකරන ලද සංශෝධන යටතේ සඳහන් කර තිබුණු නමුත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල එසේ හෙළිදරව් කර නොතිබුණු අවස්ථා පහත පරිදි වී තිබුණි.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ඉදිකිරීම් කටයුතු අතරින් 2024 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකරමින් පවතින කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කරන ලද, කොන්ත්‍රාත් ව්‍යාපෘති සංඛ්‍යාව හා ඒවායේ නිමකල වැඩවල රු.මිලියන 13,970.39 ක් වූ වටිනාකම ඒ ඒ ව්‍යාපෘති අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකිරීම.	අදාළ සෑම කාර්යාලයකින්ම වාර්තා ගෙන්වා ගත යුතු අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය නිකුත් කරන ලද 2025 පෙබරවාරි 18 දින වන විට එය 2024 වර්ෂයේදී ප්‍රායෝගිකව කිරීම අපහසු වන බව.	මෙම වාර්තාවේ 1.3 ඡේදයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම යටතේ සඳහන් චක්‍රලේඛ විධිවිධාන පරිදි අධ්‍යාපන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ ඒ ඒ තීරණ ගැනීමේදී එම තීරණ වලට බලපෑම් විය හැකි සියලුම ප්‍රමාණාත්මක ගණුදෙනු හා සිද්ධීන් මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කිරීමට කටයුතු කල යුතු වීම.
(ii)	සුරක්ෂා සිසු රක්ෂණය යටතේ 2021/2022 කාලච්ඡේදයට අයත් 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 67.8ක නොගෙවූ හිමිකමක් පැවතීම පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කිරීමට කටයුතු නොකිරීම.	මෙම හිමිකම් මුදල නිශ්චිත වශයෙන් ප්‍රතිපූරණය කළ යුතුද නැද්ද යන්න පිළිබඳව තීරණය කර නොමැත. අවිනිශ්චිත තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් නොකරන බැවින් මෙම මුදල 2024 දෙසැම්බර් 31 මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර නොමැති බව.	-එම-
(iii)	NEMIS දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් SESIP වැඩසටහනේ උප විසර්ජන සබැඳි දර්ශක 53 ළඟාකර ගැනීම සඳහා ප්‍රසම්පාදනය කර තිබුණු රු.මිලියන 78.4ක් වටිනාකමැති ලැප්ටොප් පරිගණක 328ක් නඩු කටයුත්තක් හේතුවෙන් 2023 වර්ෂයේ භාරගත් දින සිට අවුරුදු එකහමාරක කාලයක් තිස්සේ මධ්‍යම ගබඩාව තුල ගබඩා කර තිබීම පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය නොකිරීම.	NEMIS සම්බන්ධ ලිපිගොනු හා වාර්තා විගණන විමසුම් හා මූල්‍ය කටයුතු අධ්‍යයනයන් සඳහා අදාළ පාර්ශ්වයන් විසින් ඉල්ලුම් කරන ලද සියලුම අවස්ථාවලදී ලබා දී ඇති බව හා පද්ධතියේ වර්තමාන තත්ත්වය පිළිබඳව ඕනෑම අවස්ථාවක වාර්තා කිරීමේ හැකියාව පවතින බව.	-එම-

(ආ) මූලධන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු (TVET) ක්ෂේත්‍රයේ රැකියා සැලසීමේ පසුබිමක් සකස් කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් වර්ෂය තුල වැය විෂයයන් දෙකක් යටතේ රු.මිලියන 600ක් හා කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සහ ගම්පහ කාර්මික විද්‍යාලය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 400 ක් වශයෙන් රු.මිලියන 1,000ක් ප්‍රතිපාදන වෙන්කර වියදම් දරා තිබියදී වියදම් වාර්තා ලබාගැනීමට නොහැකි වීම හේතුවෙන් එම වියදම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	TVET Career Platform ව්‍යාපෘතිය ට අදාලව ප්‍රගතිය යොමු කරන ලෙස අවස්ථා ගණනාවකදී KOICA ආයතනය වෙත ලිඛිතව හා වාචික ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා KOICA ආයතනය විසින් ප්‍රතිචාර දැක්වීමක් සිදු කර නොමැති බැවින්, අංශය විසින් පිළියෙල කරන ලද සියළු වාර්තාවල මෙම ව්‍යාපෘතියට අදාල මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීමට නොහැකි වී ඇති බව.	ගිණුම් කාලපරිච්ඡේදයක් සඳහා අදාළ වන සියළුම වියදම් වාර්තා කර ගැනීමට හැකි ක්‍රමවේදයක් ඇතිකර ගනිමින් ප්‍රතිපාදන වෙන් කරගත් ව්‍යාපෘතිවලට අදාළ වියදම් නියමිත පරිදි මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කළ යුතු වීම.
(ii)	ඉසුරුපාය අධ්‍යාපන අමාත්‍යාංශයේ ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ අදියර II සඳහා 2020 දෙසැම්බර් 31 කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු අතුරු ගෙවීම් සහතිකය (IPC) II අනුව අවසන් වරට ගෙවීම් කර තිබුණු වටිනාකම්හි එකතුව රු.මිලියන 218.5 ක් කෙරීගෙන යන වැඩ (WIP) යටතේ සටහන් කර වැඩිදියුණු කිරීම නිමකළ පසු ප්‍රාග්ධනිත කල යුතු වුවද එය අළුත්වැඩියා වියදමක් ලෙස 126-1-2-0-2001 වැය විෂයය යටතේ ගිණුම්ගත කර තිබුණි.	මෙම ගොඩනැගිල්ලේ 6,7 මහල් වැඩිදියුණු කිරීමක් වන බැවින් එහි ගෙවීම් කටයුතු සිදු කර ඇත්තේ 123-01-02-00-2001(11) වැය ශීර්ෂයෙන් වන බව.	6,7 මහල්වල සිදුකරන ලද නවීකරණ කාර්යයන් නිවැරදිව අදාළ අංශ මගින් ලබාගෙන ප්‍රාග්ධනිත කළ යුතු වැය විෂයයන් නිවැරදිව හඳුනාගෙන නිවැරදි වැය විෂයයන්වලට මූලධන වියදම් ගිණුම්ගත කිරීමට ඉදිරියේදී කටයුතු කල යුතු බව. .

(iii)	KOICA ආධාර ව්‍යාපෘතිය යටතේ නාරංගොල්ලේ ඉදිවන තාක්ෂණික ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට 2024 වර්ෂය තුලදී ලැබී තිබුණු රු.මිලියන **384.5**ක් වටිනාකමැති භාණ්ඩ හා උපකරණ සඳහා නව වැය විෂයයක් යටතේ ප්‍රතිපාදන වෙන් කරගෙන සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී ලැබුණු උපකරණවලට අමතරව ඊළඟ වර්ෂයේදී ලැබීමට නියමිතව තිබුණු රු.මිලියන 184.35ක වටිනාකමැති භාණ්ඩ හා උපකරණ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමටද කටයුතු කර නොතිබුණි.	2024 වර්ෂයේ දී වත්කම් ගිණුම්ගත කිරීමට ප්‍රතිපාදන ඉල්ලුම් කළද වර්ෂය අවසාන වන තෙක් ප්‍රතිපාදන නොලැබුණු බැවින්, මෙම භාණ්ඩ හා උපකරණ යන වත්කම් ගිණුම්ගත කිරීමට නොහැකි වුණි. කෙසේ නමුත්, 2025 වර්ෂයේ උක්ත භාණ්ඩ හා උපකරණ යටතේ වූ වත්කම් ගිණුම්ගත කිරීමට අවශ්‍ය වැය විෂයය හා වටිනාකම් ඉල්ලා ඇති අතර, එම වැය විෂයය හා ප්‍රතිපාදන වෙන්කළ වහාම වත්කම් ගිණුම්ගත කරන බව.	ගිණුම් කාල පරිච්ඡේදයක් සඳහා අදාල වන සියලුම වියදම් වාර්තා කර ගැනීමට හැකි ක්‍රමවේදයක් ඇති කර ගනිමින් වෙන්කර ගත් ප්‍රතිපාදන වලට අදාල වියදම් නියමිත පරිදි මූල්‍ය ප්‍රකාශන තුල ගිණුම්ගත කල යුතු වීම. ගිවිසුම්ගත වූ පරිදි නියමිත කාලවකවානු තුල ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කිරීමට කටයුතු කර, අදාල ගිණුම් කාල පරිච්ඡේදය තුල ගිණුම්ගත කිරීමට හා ගිවිසුම්ගත වී ඇති පරිදි ලැබීමට නියමිත භාණ්ඩ ආධාරවල වටිනාකමද මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත වන පරිදි හා හෙළිදරව් කරන පරිදි ක්‍රමවේදයන් ස්ථාපිත කළ යුතු බව.
(iv)	බහුවාර්ගික හා ත්‍රෛභාෂා අධ්‍යාපනය සහිත නව ජාතික පාසලක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 01 වන අදියර වෙනුවෙන් ඉන්දියානු රජය විසින් 2022 වර්ෂය සඳහා දරන ලද රු.මිලියන 10 ක වියදමද 2024 වර්ෂයට දරන ලද රු.මිලියන 11.9 ක වියදමද පිළිවෙලින් 2022 හා 2024 වර්ෂවල ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය රු.මිලියන 21.9 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	ඉන්දියානු රජය විසින් කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වී ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලය විසින් කොන්ත්‍රාත්කරු වෙත ඍජුවම ගෙවීම් කරනු ලබයි. 2022 වර්ෂයේ සිදුකර ඇති ගෙවීම් අත්තිකාරම් ගෙවීම් වේ. එහිදි 2022 වර්ෂය තුල ඉදිකිරීම් සිදුවී නොමැත. 2022 හා 2024 අවසානයේ ගෙවන ලද මුදලද අමාත්‍යාංශය වෙත වාර්තාකර තිබුණේ 2025 වර්ෂයේදීය. මෙම වර්ෂයේදී අදාල වියදම ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව.	ගිණුම් කාල පරිච්ඡේදයක් සඳහා අදාල වන සියලුම වියදම් වාර්තා කර ගැනීමට හැකි ක්‍රමවේදයක් ස්ථාපිත කර ගනිමින් වෙන්කර ගත් ප්‍රතිපාදන වලට අදාල වියදම් නියමිත පරිදි ඒ ඒ කාලච්ඡේදවල මූල්‍ය ප්‍රකාශන තුල ගිණුම්ගත කල යුතු වීම හා රු.මිලියන 21.9ක් වූ මූලධන වියදම ගිණුම්ගත කිරීම පිළිබඳව භාණ්ඩාගාරයේ උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කළයුතු වීම.
(v)	සමාලෝචිත වර්ෂය වන විට අමාත්‍යාංශයේ ඒ ඒ අංශවල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් භාවිතා කරනු ලබන එක් එක් පරිගණක මෘදුකාංග, පරිගණක වැඩසටහන්, පරිගණක දත්ත පද්ධති තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් භාවිතා කරනු ලබන එක් එක් පරිගණක මෘදුකාංග, පරිගණක වැඩසටහන්, පරිගණක දත්ත පද්ධති තක්සේරු කර 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	ගිණුම් කාල පරිච්ඡේදයට අදාල වන සියලුම ගණුදෙනු හා සිද්ධීන් තුලින් උද්ගත වන වියදම්, ආදායම් මෙන්ම වත්කම් හා වගකීම්ද වාර්තාගත වන පරිදි ඒ ඒ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර සියලුම අංශ මගින් තොරතුරු ලබාගෙන සමාලෝචිත කාල පරිච්ඡේදයට අදාල වත්කම්

			ගිණුම්ගත කිරීමට හැකි මනා පාලනයක් පවත්වාගැනීමට කටයුතු කල යුතු බව.
(vi)	කොරියානු වොන් මිලියන 2.15 ක ඇස්තමේන්තු වියදමක් යටතේ 2023 මැයි මස ආරම්භ වූ නියාගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය 2025 මැයි මස අවසන් කිරීමට නියමිතව ඇත. සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 478 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු මෙම අවසන් අදියරේ පවතින ව්‍යාපෘතිය වෙනුවෙන් කාලපරිච්ඡේදයට අදාලව දරන ලද වියදම් හඳුනාගැනීමට නොහැකිවීම මත වර්ෂයේ වියදම රු.මිලියන 17.5ක් පමණක් නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන අංශය විසින් ගිණුම්ගත කර තිබුණි.	අදාල ප්‍රදානය ලබාදුන් කොරියාවේ මානව සම්පත් ආයතනය විසින් ප්‍රගති වාර්තා ලබාදීමේ ප්‍රමාදය හේතුවෙන් එම වර්ෂයේ වියදම රු.මිලියන 17.48 ක් ලෙස වාර්තා වී ඇත. අදාල භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඇතුලත් වාර්තා අමාත්‍යාශය වෙත යොමු කිරීමෙන් පසු එම ව්‍යාපෘතියේ වියදම රු.මිලියන 421.74 විය යුතු බව.	ව්‍යාපෘතිය පිළිබඳව අමාත්‍යාංශ අධීක්ෂණය ප්‍රමාණාත්මක මට්ටමකින් පවත්වා ගත යුතු අතර මූල්‍ය, මෙහෙයුමේ හා කාර්යසාධන තොරතුරු පිළිබඳව යාවත්කාලීන වී, ගිණුම් කාල පරිච්ඡේදයට අදාල වන සියලුම ගණුදෙනු හා සිද්ධීන් තුලින් උද්ගත වන වියදම් ආදායම් මෙන්ම වත්කම් හා වගකීම්ද වාර්තාගත වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර සියලුම අංශ මගින් තොරතුරු ලබාගෙන සමාලෝචිත කාල පරිච්ඡේදයට අදාල වත්කම් ගිණුම්ගත කිරීමට හැකි මනා පාලනයක් ස්ථාපිත කර ගැනීමට කටයුතු කල යුතු වීම.

(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2024 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුමේ ශේෂය රු.මිලියන 3,049.18 ක් වූ නමුත් කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයට අනුව ශේෂය රු.මිලියන 3,043.66 ක් වූයෙන් රු.මිලියන 5.5 ක වෙනසක් පැවතුණි.	ශේෂය නිරවුල් කිරීම සඳහා අවස්ථා කීපයකදීම පළාත් අධ්‍යාපන කාර්යාල සහ කලාප කාර්යාලවල ප්‍රධාන ගණකාධිකාරීවරුන්, ගණකාධිකාරීවරුන් සහ විෂය නිලධාරීන් මෙම අමාත්‍යාංශය වෙත කැඳවා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, උපදෙස් ලබා දීම සිදුකළ අතර අදාළ වැඩමුළුවලදී උපදෙස් දුන් පරිදි මෙම ශේෂ හඳුනාගෙන නිවැරදි කරන ලෙස දන්වන ලද බව.	අත්තිකාරම් බී ගිණුමේ ශේෂය හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂය අතර වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කල යුතු වීම.

(ii)	භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් බී ගිණුමේ ශේෂය රු.මිලියන 3,104.62 ක් වූ නමුත් නිවැරදි කල අත්තිකාරම් පාලන බී ගිණුමේ ශේෂය රු.මිලියන 3,049.18ක් වූයෙන් මෙම ශේෂයන් දෙක අතර රු.මිලියන 55.44 ක වෙනසක් පැවතුණි.	අමාත්‍යාංශය විසින් පළාත් 9, කලාප 100, විද්‍යාපීඨ 20, උසස් අධ්‍යාපන, නිපුණතා හා පිරිවෙන් යන සියලුම අංශවල ඒකාබද්ධ ගිණුමක් සකස් කරන බැවින් ඉහත වෙනස සිදුවී ඇත්තේ කුමන අංශයෙන් ද යන්න සොයා බැලීමේ කටයුතු දැනට සිදු කරමින් පවතින අතර මෙම වෙනස ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව.	ඒ ඒ අංශය හෝ ඒකකය අනුව කිසියම් නිශ්චිත කාලච්ඡේදයකට වරක් සැසඳීම් සිදුකරන පරිදි ක්‍රමවේදයක් ස්ථාපිත කර කාලීනව ශේෂයන්හි වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කල යුතු බව.
(iii)	අත්තිකාරම් බී පාලන ගිණුමේ සංශෝධිත ශේෂය රු.මිලියන 3,104.62 ක් වන අතර සංශෝධිත කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.මිලියන 3,079 ක් වූයෙන් මෙම ශේෂයන් දෙක අතර රු.මිලියන 25.53 ක වෙනසක් පැවති අතර ඉකුත් වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වෙනස රු. 595,886 කින් වැඩි වී තිබුණි.	දැනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ විගණන විමසුමේ දක්වා ඇති වෙනසට හේතුව 1983 හා 1990 කාලවල සිදුවූ පොත්පත් විනාශවීමේ කාරණය ද බලපා ඇත. එසේම පසුගිය වසර 4හි අත්තිකාරම් ගිණුම් අනුව ශේෂයන් එකිනෙකට වෙනස් අගයක පවතින බව පිළිගනිමි. මෙම වෙනසට හේතු සොයාබැලීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට සම්බන්ධ සියලු අංශ දැනුවත් කර ඇති අතර එම තොරතුරු කැඳවීමේ ආකෘතිපත්‍ර නැවත සමාලෝචනය කර සංශෝධනය කර නව උපදෙස් මාලාවක් හා නව ආකෘති හඳුන්වා දීමට කටයුතු සංවිධානය කරමින් පවතින බව.	ණය ශේෂවල පෙර කාලච්ඡේදවල පැවති වෙනස්කම් නිරවුල් කර ගැනීමට සියලුම ප්‍රයත්නයන් දරන අතර වර්තමාන ගිණුම් කාලච්ඡේදවල එවැනි වෙනස්කම් ඇති නොවීමට අදාල නිලධාරීන් වගබලාගත යුතු බව හා සියලු වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කළ යුතු බව.

(ඇ) දේපළ පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	භාණ්ඩාගාර පොත් (ACA 6 / SA 82) අනුව 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු මිලියන 180,717.73 ක් වී තිබුණි. 2024 ජනවාරි 01 දිනට එම ශේෂය රු.මිලියන 182,425.25ක් වූයෙන් රු.මිලියන	2023 දෙසැම්බර් 31 සහ 2024 ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම් ගිණුමේ ශේෂයන් අතර වෙනසට හේතු වී ඇත්තේ 2023 වර්ෂයේ මූල්‍ය නොවන ගිණුම සැකසීමේදී උපකාර්යාල	අවසන් හා ආරම්භක ශේෂ සමාන වන ලෙස නිවැරදිව ගිණුම් පිළියෙල කල යුතු වීම හා වෙනසට හේතු ලෙස අනාවරණය කර ගන්නා ලද තත්ත්වයන් නිවැරදි කිරීමේදී නියමිත සාක්ෂි සහිතව

	1,707.5ක වෙනසක් පැවතුණි.	සියල්ලගේම මූල්‍ය නොවන වත්කම් ගොනු ප්‍රධාන කාර්යාලය වෙත නිසි ආකාරයෙන් නොලැබීම මත එම වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ගිණුමට උපකාර්යාල වලින් ශේෂ ඇතුළත් නොවීමයි.	වගකිවයුතු නිලධාරීන්ගේ සහතික කිරීම් අනුව නිවැරදිකිරීම් පරීක්ෂා කල හැකි පරිදි සටහන් යොදමින්, සිගාස් පරිගණක පද්ධතියට එකතු කිරීම් හා අඩුකිරීම් ලෙස සටහන් යෙදීමේදී කටයුතු කිරීමට බලධාරීන් වගබලා ගත යුතුවීම හා වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කළයුතු බව.
(ii)	භාණ්ඩාගාර SA 82 සමුච්චිත ජංගම නොවන වත්කම් ආකෘතිය ප්‍රකාරව 2024 වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකම රු.මිලියන 11,382.87 ක් වන අතර මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුලත් 2102, 2103, 2104, 2106 වැය විෂයන් යටතේ මූලධන වත්කම් අත්පත් කර ගැනිම වෙනුවෙන් දැරූ වියදම රු.මිලියන 28,242.88 ක් වීමෙන් රු.මිලියන 16,860 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඒ අනුව ප්‍රාග්ධනිත නොකළ වත්කම් වටිනාකම රු.මිලියන 16,860 වී තිබුණි. එසේම භාණ්ඩාගාර SA 82 වාර්තාවේ හි ඇතුලත් වර්ෂ අවසාන ශුද්ධ වත්කම් ශේෂය මගින් හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ඇතුලත් ශුද්ධ වත්කම් ශේෂය මගින් අධ්‍යාපන අමාත්‍යාංශය සතු සත්‍ය වත්කම් ප්‍රමාණය නිරූපණය වී නොතිබුණි.	මේ ගැටළුව මඟ හරවා ගැනීම සඳහා 2025 වර්ෂයේ සිට CIGAS මෘදුකාංගය මඟින් මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම සිදු කරන බව.	මූලධන වත්කම් කාලීනව ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වත්කම් ශේෂය නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු වීම.
(iii)	අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ජාතික පාසල් 396 න් දිස්ත්‍රික්ක 13කට අයත් පාසල් 39 ක ඉඩම්වල වටිනාකම 2024 දෙසැම්බර් 31 දින වන විටත් තක්සේරු කර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	තවදුරටත් තක්සේරු නොකර ඉතිරිව ඇත්තේ ඉඩම් පවරාගැනීම් සම්බන්ධ ගැටළු නිරාකරණය නොවී පවතින ජාතික පාසල්වල පමණි. ඉඩම් පවරාගැනීම් අවසන් කරන පාසල්වල ඉඩම් තක්සේරු කිරීම් වරින්වර සිදු කරනු ලබන බව.	ඉඩම් තක්සේරු කර වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වීම.

(iv)	2024 අගෝස්තු 06 දිනැති අංක අමප/24/1473/630/009-1 දරන හා අමාත්‍ය මණ්ඩල තීරණය මත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ආධාර යටතේ පාසල් තුළ සවිකිරීම සඳහා සුහුරු පුවරු 1,000ක් මිලදීගැනීමට 2024 ජූලි 03 දින සිට අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණු අතර 2024 ඔක්තෝබර් 07 දින පත්තලගෙදර ගබඩාවට සුහුරු පුවරු 1,000ක් ලැබී තිබුණි. අමාත්‍යාංශය විසින් රු.මිලියන 1,493.31 කට ලංසුව පිරිනමා 2024 ඔක්තෝබර් 07 දින භාරගත් සුහුරු පුවරු 1,000ක් පිළිබඳව වූ ගණුදෙනුව ශීර්ෂය 126 යටතේ ගිණුම්ගත කිරීමට අවශ්‍ය වැය විෂයය සඳහා 2024 වර්ෂයට භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන වෙන්කරවාගෙන සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	අදාළ ගෙවීම් සිදු කරනු ලබන්නේ විදුලි සංදේශ නියාමන කොමිසම් සභාව වන අතර, අදාළ ප්‍රසම්පාදන කටයුතු පමණක් මෙම අමාත්‍යාංශයෙන් සිදු කර ඇත. සුහුරු පුවරු ආනයනය කිරීමට අවශ්‍ය පිරිවැය වන CIF පිරිවැය විදුලි සංදේශ නියාමන කොමිසම් සභාවෙන් රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව වෙත ගෙවීම් කර ඇත. නමුත්, මෙතෙක් අදාළ පාසල්වල මෙම උපකරණ ස්ථාපනය කර නොමැත. අදාළ උපකරණ ස්ථාපනය කිරීමෙන් පසුව විදුලි සංදේශ නියාමන කොමිසම හරහා අදාළ වටිනාකම (භාණ්ඩ) අධ්‍යාපන අමාත්‍යාංශයට පවරාදීමෙන් පසුව අදාළ ගිණුම්ගත කිරීම සිදුකිරීමට හැකියාවක් ඇත.	දේශීය වශයෙන් හෝ විදේශීයව ලැබෙන මුදල්, භාණ්ඩ හෝ තාක්ෂණිකමය ආධාර මුදල් රෙගුලාසි 610 පරිදි ගිණුම් තැබීමට අදාල වැය විෂයයන් යටතේ භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමට කටයුතු කර නියමිත කාල පරිච්ඡේදය තුලදී ගිණුම් තැබීමට කටයුතු කල යුතුය.

(ඉ) පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 104(4) වාර්තා තුලින් ඉදිරිපත් කරන ලද රු.742,500 ක හානි හා පාඩු මූල්‍ය ප්‍රකාශනයේ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ හා පොත්වලින් කපා හැරීමේ ප්‍රකාශයේ ඇතුලත් වී නොතිබුණි.	2024 මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර නැති ඒවා 2025 මූල්‍ය ප්‍රකාශවලට ඇතුලත් කර නිවැරදි කිරීමට සටහන් කල බව.	මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව හානි හා පාඩු මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ඇතුලත් කිරීම කල යුතු බව.

(ඊ) ලේඛන හා පොත්පත් යාවත්කාලීනව පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	**ස්ථාවර වත්කම් ලේඛනය**		
	2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති අංක	සිගාස් මෘදුකාංගය යටතේ ඒකාබද්ධ කරන ලද වත්කම්	භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව කටයුතු කර සිගාස්

	06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.1 ඡේදය ප්‍රකාරව සිගාස් වැඩසටහන තුළ හෝ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	ගොනුවෙන් ලබාගැනීමට පහසුකම් සලසා නැත. අමාත්‍යාංශය යටතේ ඇති උප ගිණුම්කරණ ඒකක වලින් වෙන වෙනම ස්ථාවර වත්කම් ලේඛනය (BOS report) පවත්වාගෙන යනු ලැබේ. අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් ලේඛනය online සිගාස් වැඩසටහන තුළින් 2024 වර්ෂයේ දක්වාම පවත්වාගෙන ගිය අතර 2025 වර්ෂයේදී Offline ක්‍රමයට මාරු වීමත් සමඟ එය අමාත්‍යාංශ ගෙවීම් අංශයේ සිගාස් පරිගණක මෘදුකාංගය තුළ පවත්වාගෙන යනු ලබන බව.	වැඩසටහන තුළ හෝ ස්ථාවර වත්කම් මොඩියුලය මඟින් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගැනීමට කටයුතු කළ යුතු බව.
(ii)	**හානි පිළිබඳ ලේඛනය**		
	මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	අතපසු වීමකින් සිද්ධීන් කිහිපයක් යාවත්කාලීන කිරීම මග හැරී ඇත. මේ වන විට යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති බව.	මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම.
(iii)	**වාහන ලොග් පොත**		
	මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාර වාහන ලොග් පොත් යාවත්කාලීන කර නොතිබුණි.	වාහන ලොග් සටහන් පොත් දැනට යාවත්කාලීන කරමින් පවතින බව.	මුදල් රෙගුලාසි 1645(අ) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව පොදු 267 අකෘතිය ප්‍රකාරව වාහන ලොග් පොත් සෑම වාහනයක් සම්බන්ධයෙන්ම යාවත්කාලීන කරමින් පවත්වා ගත යුතු වීම.
(iv)	**කොන්ත්‍රාත් ලේඛනය**		
	මුදල් රෙගුලාසි 127, 128, 133, 137 හි විධිවිධාන පරිදි කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් මනා අභ්‍යන්තර පාලනයක් පවත්වා ගැනීමේ පාලන කාරකයක් ලෙස මෘදු පිටපතක් ලෙස හෝ ලේඛනයක් ලෙස කොන්ත්‍රාත් ලේඛනය සියළුම කොන්දේසිද සහිතව යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	අමාත්‍යාංශයේ ඉංජිනේරු අංශය මඟින් කොන්ත්‍රාත් පවරා ගෙවීම් කරන කාර්යයන් සම්බන්ධයෙන් ලේඛනයක් එම අංශයේ පවත්වාගෙන යනු ලබයි.	අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සිදුකරන සියලුම කොන්ත්‍රාත් සම්බන්ධයෙන් කොන්ත්‍රාත් කාර්යය පැවරීමේ සිට රඳවුම් මුදල් නිදහස් කිරීම දක්වා වූ සියළු තොරතුරු ඇතුලත් කරමින් කොන්ත්‍රාත් ලේඛනයක් පවත්වා ගතයුතු බව.

(උ) **විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් ගණුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත 2021-2023 කාලසීමාවේදී නිකුත් කරන ලද පිළිතුරු සැපයීමේ ප්‍රමාද කාලය අවමය මාස 16 ක් හා උපරිමය මාස 42 ක් වූ විගණන විමසුම් 15 ක්ද සමාලෝචිත වර්ෂයේ නිකුත් කරන ලද පිළිතුරු සැපයීමේ ප්‍රමාද කාලය මාස 16 ක් වූ විගණන විමසුම් 66 ක් ද 2023 වර්ෂයේදි නිකුත් කරන ලද පිළිතුරු සැපයීමේ ප්‍රමාද කාලය මාස 18 ක් වූ "ජාතික පාසල් දහසක් දක්වා වැඩිකිරීමේ විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව" සඳහාද වශයෙන් විගණන විමසුම් 82 ක් සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් පිළිතුරු ලබාදීමට කටයුතු කර නොතිබුණි.	විගණන විමසීම් ඉදිරිපත් කර පිළිතුරු ලබාගැනීම මෙම අමාත්‍යාංශ අභ්‍යන්තරයේ පවතින අනෙකුත් ශාඛාවන් මඟින් ද, අමාත්‍යාංශයට අනුබද්ධ අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතන මඟින්ද අමාත්‍යාංශය යටතේ පවතින ජාතික පාසල් මඟින්ද සිදුකල යුතුව පවතී. මෙම ක්‍රියාවලිය සඳහා දිර්ඝ කාලයක් ගත වන අතර මේ සඳහා දැනට සිටින කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම ප්‍රමාදයට හේතු පාදක වී ඇත. ඒ අනුව ඉදිරියේ දී මෙම ගැටලුව වලක්වා ගැනීම සඳහා මා විසින් කාර්ය මණ්ඩලයේ අවශ්‍යතාවය පෙන්වා දෙමින් තනතුරු අනුමැතිය ලබා ගැනීමට අධ්‍යක්‍ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ED/12/01/14/2024-12 හා 2025 මාර්තු 28 දිනැති ලිපිය යොමු කර ඇත.	මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් මුදල් රෙගුලාසි 452(1) හි සඳහන් විගණන විමසුම් ලේඛනය නියමිත කාලයකට අනුව පරීක්ෂා කර බලා ලැබී ඇති විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරිමට කටයුතු කළ යුතු අතර, එම විමසුම්වලට වහාම පිළිතුරු ලබා දීය යුතුය. එසේ පිළිතුරු ලබාදි ම ප්‍රමාද විය හැකි විමසුම් වේ නම් ඒ සඳහා අතුරු වාර්තාවක් යැවිමට කටයුතු කළ යුතු අතර අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් හඳුන්වාදීමට පියවර ගත යුතු වීම.
(ii)	ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ ඇතුළත් කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව, පාලන ගිණුමේ වර්ෂ අවසාන ශේෂ සමග සැසඳීමේ ප්‍රකාශයේ අඩුකර ඇති රු.මිලියන 22.42 ක් හා නැගෙනහිර පළාතේ 1990 කාලවලට අයත් පළාත් සභා ණය ශේෂ නිරවුල් කිරීම හා එකතු කර ඇති රු.මිලියන 48.9 ක් වශයෙන් වූ භාණ්ඩාගාර 7004 ගිණුම හරහා පළාත් සභා ණය ශේෂ නිරවුල් කිරීම ලෙස දක්වා ඇති එම අයිතමයන් දෙක සැදුම්ලත් ආකාරය පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.	මේ සම්බන්ධයෙන් මේ වන විටත් සාක්ෂි ඉල්ලා ඇති අතර ඔවුන් සතුව ලේඛන නොමැති බව සඳහන් කර ඇති බැවින් තවදුරටත් පැරණි ගිණුම් තුළින් තොරතුරු සොයා බලා වාර්තා කරන ලෙසට දන්වා ඇති බව.	විගණනය සඳහා අවශ්‍ය ශේෂ සනාථ ඉදිරිපත් කිරීමට කළමනාකාරිත්වය වගබලා ගත යුතු වීම.

(iii)	භාණ්ඩාගාර පොත්වල සටහන් අනුව සමුච්චිත ස්ථාවර වත්කම් වාර්තාවට (SA 82 ආකෘතිය) 2024 වර්ෂයේ දී අලුතින් තක්සේරු කර ප්‍රාග්ධනිත කරන ලද ඉඩම් හා ගොඩනැගිලි ශේෂය රු.මිලියන 7,564.72 ක් වන අතර විගණනයට ඉදිරිපත් කරන ලද තක්සේරු වාර්තා අනුව ශේෂ වටිනාකම රු.මිලියන 4,717.3 ක් වීමෙන් රු.මිලියන 2,847.45 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. එමෙන්ම සමුච්චිත ස්ථාවර වත්කම් වාර්තාවට (SA 82 ආකෘතිය) 2024 වර්ෂයේ දී අලුතින් තක්සේරු කර ප්‍රාග්ධනිත කරන ලද ඉඩම් හා ගොඩනැගිලි ශේෂය තුල වෙනත් ආයතන විසින් ගිණුම්ගත කරන ලද වර්ෂය තුල මිලදීගත් රු.මිලියන 2,975.38ක ස්ථාවර වත්කම් ශේෂයක්ද ඇතුලත්ව පවතින බව පිළිතුර අනුව නිරීක්ෂණය වුවත් ඊට අදාල සාක්ෂිද ඉදිරිපත් නොකෙරුණි.	අමාත්‍යාංශයේ SA 82 මඟින් පිළිඹිබු වන්නේ, අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, පළාත් 9 ට අයත් ප්‍රධාන කාර්යාල හා කලාප කාර්යාල මෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වෙනත් ආයතන හා එමඟින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සියල්ලෙහිම මූල්‍ය නොවන වත්කම් වල අගයන් වේ. ඒ අනුව එවැනි ගිණුම්කරණ ඒකක 135 ක් මඟින් ඒකාබද්ධ කරන ලද වත්කම් ගිණුම SA 82 තුළින් පිළිඹිමු වේ. එහෙත්, තක්සේරු කරන ලද ඉඩම් හා ගොඩනැගිලි වල අගයන් අමාත්‍යාංශ ගිණුම්කරණ ඒකකයේ (බැංකු අංකය 001) පමණක් ඇතුලත් කරන බවත්, CIGAS හි OPENING BALANCE ADDITION වල පමණක් මෙම තක්සේරු අගයන් නිරූපණය වන බවත් පෙන්වා දෙමි. වෙනත් ආයතනවල මෙම OPENING BALANCE ADDITION වල වර්ෂයේ මිලදීගැනීම් ද ඇතුලත්ව ඇති බැවින් SA 82 හි පෙන්වන අගය තක්සේරු වාර්තා මත ඉඩම් ගොඩනැගිලි වටිනාකම නොවන බවත් අමාත්‍යාංශයේ (බැංකු අංකය 001) හි අගය පමණක් අදාල වන බව.	සමුච්චිත ස්ථාවර වත්කම් වාර්තාවට (SA 82) යොදනු ලබන එක් එක් ගිණුම්කරණ සටහන් සඳහා නිශ්චිත සාක්ෂි සහිතව වගකිවයුතු නිලධාරියකු විසින් සහතික කරන ලද එක් එක් තහවුරු කිරීමේ සියළුම සටහන්, පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර එම පද්ධතියට සිදුකරන ගැලපීම්වල නිවැරදිතාවය තහවුරු කරගත හැකි පරිදි එක් එක් සටහන් යොදනු ලබන අනුපිළිවෙල අනුව සාක්ෂි පවත්වා ගනිමින් එම සටහන්වල නිවැරදිතාවය හා විනිවිදභාවය පවත්වා ගැනීමට අදාල බලධාරීන් වගබලාගත යුතු වීම.
(iv)	ස්ථාවර වත්කම් දෛනිකව සාමාන්‍ය මෙහෙයුම් කටයුතුවලදී ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදයට අනුව ගිණුම්ගත නොවූ අවස්ථාවල ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීමේ දී, එනම් ස්ථාවර වත්කම් සම්බන්ධ වැරදි නිවැරදි කිරීමේදී, ශේෂ සැසඳීමේදී වශයෙන් සිගාස් පද්ධතියෙහි පවතින භාණ්ඩාගාර පොත් අනුව සමුච්චිත ස්ථාවර වත්කම් වාර්තාවට (SA 82 ආකෘතිය)	ඉහත එකතු කිරීම් ලෙස පෙන්වා දී ඇත්තේ 2023 වර්ෂයේදී අවසන් ගිණුම් පිළියෙල කරන අවස්ථාවේදී ප්‍රධාන කාර්යාලය විසින් ප්‍රධාන ගිණුමට ඇතුළත් නොකිරීම මත මඟහැරී ගොස් තිබුණු උප කාර්යාලවල මූල්‍ය නොවන වත්කම් ගිණුම් ශේෂයන් වන අතර, 2024 වර්ෂයේදී උපකාර්යාල සියල්ලගේම ගිණුම් ඒකාබද්ධ	-එම-

යොදනු ලබන එක් එක් ගිණුම්කරණ සටහන් සඳහා නිශ්චිත සාක්ෂි සහිතව වගකිවයුතු නිලධාරියකු විසින් සහතික කරන ලද එක් එක් තහවුරු කිරීමේ සියළුම සටහන්, පිළියෙල කර විගණනයට ඉදිරිපත් නොවුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුලදී සමුච්චිත ස්ථාවර වත්කම් වාර්තාවට (SA 82 ආකෘතිය) ගලපන ලද රු.මිලියන 4,751.9 ක් හා අඩු කරන ලද රු. මිලියන 14ක් තහවුරු කර ගැනීමට නොහැකි විය.	කරමින් අවසන් ගිණුම පිළියෙල කර ඇති බැවින් එහිදී ඇතුළත් වූ එම ශේෂයන් වන බව.

2. **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	**ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය**	**මෙම වාර්තාවේ ඡේද යොමුව**
1.6.1. ආ (i)	අවසන් හා ආරම්භක ශේෂ සමාන වන ලෙස නිවැරදි ගිණුම් පිලියෙල කල යුතුය.	1.6.2.(ඈ) (i)
1.6.1 ආ (ii)	අත්පත් කරගන්නා ලද මූලධන වත්කම් වර්ෂය තුලදී ප්‍රාග්ධනිත කල යුතුය.	1.6.2.(ඈ) (ii)
1.6.1 අ (i),(iii)	ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශයේ පාලන ගිණුම් ශේෂය හා කේවල ශේෂ වර්ගීකරණ සාරංශයේ ශේෂය අතර වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. ණය ශේෂවල පවතින වෙනස්කම් නිරවුල් කිරීමට පියවර ගත යුතුය.	1.6.2 (ඈ) (i) , (iii)
1.6.1 ඇ (iii)	ශේෂ තහවුරු කර ගැනීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.	1.6.2 (උ) (ii)

3 මූල්‍ය සමාලෝචනය

3.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා ඉදිකරනු ලබන මහල් 17 ව්‍යාපෘතියට අදාලව සහතික කරන ලද අවසන් බිල්පත සහ එය නිරවුල් කිරීම සඳහා ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර නොතිබියදී වැය ශීර්ෂය 126-2-10-28-2104 (ii) යටතේ උසස් අධ්‍යාපන අංශය විසින් අග්‍රිම ලබාගෙන රු.මිලියන 703.4ක් 2024 අප්‍රේල් 30 දින කොළඹ විශ්වවිද්‍යාලයට ලබා දී තිබුණි. එකී මුදලින් වර්ෂය තුල එකතුව රු.මිලියන 544ක් භාවිතා කිරීමකින් තොරව විශ්වවිද්‍යාලය විසින් එවා තිබුණු අතර එම මුදල භාණ්ඩාගාරයට යැවීමට හෝ අග්‍රිමයට හිලව් කිරීමට නිසි අනුමැතිය ලබා ගැනීමට කටයුතු නොකර උසස් අධ්‍යාපන අංශය විසින් වැයකර තිබුණි. ආපසු නොඑවන ලද රු.මිලියන 159.4ක මුදල පිළිබඳව සොයා බැලීමට උසස් අධ්‍යාපන අංශයේ රාජ්‍ය මූල්‍ය සම්බන්ධව වගකීමක් දරන නිලධාරීන් කටයුතු කර නොතිබුණි. ඒ අනුව මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අකාර්යක්ෂමව කටයුතු කර තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	මුදල් රෙගුලාසි 135-139,156 විධිවිධාන පරිදි සැලකිලිමත්ව රාජ්‍ය මූල්‍ය සම්බන්ධව නිසි වගකීමකින් කටයුතු කල යුතු වීම හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුගත විය යුතු බව.

3.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයක් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශය සඳහා 2024 වර්ෂයේදී ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 50,758.13 ක් හා පුනරාවර්තන වියදම් වෙනුවෙන් මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන	දේශිය අරමුදල් යටතේ අයවැය යෝජනා මත විද්‍යාපීඨ විශ්ව විද්‍යාල ලෙස ස්ථාපිත කිරීම සඳහා වෙන්වූ ප්‍රතිපාදනයට අදාල පනත අනුමත නොවීම මත	අවශ්‍යතාව නිවැරදිව හඳුනාගෙන අයවැයගත ක්‍රියාකාරකම් සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම අනුව ඇස්තමේන්තු සකස් කල යුතු වීම හා ප්‍රතිපාදන සලසන ලද

	121,153.68 ක් ලැබී තිබුණු අතර වර්ෂයේ දැරූ ප්‍රාග්ධන වියදම රු.මිලියන 34,371.23ක් හා පුනරාවර්තන වියදම රු.මිලියන 102,369.36ක් වී තිබුණි. ඒ අනුව ප්‍රාග්ධන වියදම් සඳහා වූ ප්‍රතිපාදනයෙන් සියයට 32 ක් ලෙස රු.මිලියන 16,386.9ක් ද පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදනයෙන් සියයට 15 ක් ලෙස රු.මිලියන 18,784.32 ක් ද වශයෙන් ප්‍රතිපාදන ඉතිරිවීම් පැවතුණි.	සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය නොවුණු අතර ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 අනුව නව බැඳීම් ඇති කර නොගත් අතර අත්‍යවශ්‍ය ඉදිකිරීම් කාර්යයන් පමණක් සිදුකළ අතර ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාලව මිලගණන්වල විචලනයන් යටතේ කරගෙන ගිය ව්‍යාපෘති අතරමග නතර කිරීමට සිදුවිය. එමෙන්ම පළාත් අධ්‍යාපන කාර්යාල යටතේ ඉදිකිරීම් සම්බන්ධව පැවති ගැටලු නිරාකරණය කර නැවත ප්‍රසම්පාදන කාර්යයන් වර්ෂය තුලදී අවසන් කිරීමට කාලය ප්‍රමාණවත් නොවීම මත සම්පූර්ණ ප්‍රතිපාදන උපයෝජනය නොවුණු බව.	ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකරමින් නිශ්චිත කාර්යසාධන මට්ටමට ළගාකර ගැනීමට අදාළ බලධාරීන් වග බලා ගත යුතු බව හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන පරිදි කටයුතු කල යුතු වීම.
(ආ)	නිසි පුරෝකථනයකින් හා කිසිදු තාර්කික පදනමකින් තොරව ඇස්තමේන්තු පිළියෙල කර මුදල් ප්‍රතිපාදන ලබාගැනීම හේතුවෙන් අමාත්‍යාංශයේ වැය විෂයයන් 36ක රු.මිලියන 3,741.4 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම සමාලෝචිත වර්ෂය අවසානයේ ඉතිරිව පැවතුණු අතර ඉන් 32 ක් ම ප්‍රාග්ධන වැය විෂයයන් වී තිබුණි.	දේශීය අරමුදල් යටතේ ඉදිකිරීම් අංශයට අදාලව ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 අනුව නව බැඳීම් ඇති කර නොගත් අතර අත්‍යාවශ්‍ය ඉදිකිරීම් පමණක් සිදුකළ අතර අවසන් බිල්පත් නොලැබීම,අවසන් බිල්පත් අනුමත නොකිරීම, අයවැය යෝජනාවට අනුව විද්‍යාපීඨ, විශ්ව විද්‍යාල ලෙස ස්ථාපිත කිරීම සඳහා වෙන්වූ ප්‍රතිපාදනයට අදාල පනත අනුමත නොවීම යන කරුණු මත දේශීය අරමුල් යටතේ වන වැය විෂයයන්හි ප්‍රතිපාදන ඉතිරිය සියයට සියයක් බව.	-එම-
(ඇ)	2023 නොවැම්බර් 24 දිනැති අභ්‍යන්තර ගෙවීම් සහතික (IPC) 55හි සඳහන් පරිදි අමාත්‍යාංශයේ කාර්යාල ගොඩනැගිල්ලේ 6 සහ 7 මහල් ඉදිකිරීම වෙනුවෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත අදාල ඉදිකිරීම් සඳහා සංස්ථාවට	2024 වර්ෂයේදී රු.මිලියන 50 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුනේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත අවසන් බිල්පත් නිරවුල් කිරීම සඳහා වන අතර මෙහි සඳහන් කර ඇති පරිදි අවසන් බිල්පත්	අවශ්‍යතාව නිවැරදිව හඳුනාගෙන අයවැයගත ක්‍රියාකාරකම් සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම අනුව ඇස්තමේන්තු සකස් කල යුතු වීම හා ප්‍රතිපාදන සලසන ලද ක්‍රියාකාරකම්වලට අදාළ

	රු.මිලියන 6.8ක් වැඩිපුර ගෙවා තිබියදී 2024 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් එම කාර්යය සඳහා 126-01-02-000-2104 වැය විෂය යටතේ අවශ්‍යතාවය නොසලකා වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන ලෙස රු.මිලියන 50 ක් සලසාගෙන තිබුණි. ඉන් රු.මිලියන 17.3ක් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන්ට මාරු කරගෙන තිබුණු අතර තවදුරටත් රු.මිලියන 32.7ක් ඉතිරි වී තිබුණි.	ගෙවීම සිදුකල යුතුව ඇත්තේ ස්ථාවර මිල කමිටුව මඟින් කොන්ත්‍රාත් මිල ගණන් නිශ්චය කර ලබාදීමෙන් පසුව බව.	ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකරමින් නිශ්චිත කාර්යසාධන මට්මට ළඟාකර ගැනීමට අදාළ බලධාරීන් වග බලා ගත යුතු බව හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන පරිදි කටයුතු කල යුතු වීම හා විචලතා සිදුකළ යුත්තේ නිසි බලය හා නිසි අනුමැතිය ලබාගත් පසුව බවත් ඒ අනුව ප්‍රතිපාදන වෙන් කර ගැනීම සිදුකල යුතු බව හා වැඩිපුර ගෙවීම් සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු බව.
(ඇ)	පාසල් පෝෂණ වැඩසටහන වෙනුවෙන් 126-01-02-001-1501 වැය විෂයය සඳහා රු.මිලියන 100 ක ප්‍රතිපාදනයක් ලබා දී තිබිය දී 2024 දෙසැම්බර් 11 දිනැතිව රු.මිලියන 1,800 ක පරිපූරකයක් ද ලබාගෙන තිබුණි. එමෙන්ම මෙම වැය විෂයය සඳහා මුදල් රෙගුලාසි යටතේ රු.මිලියන 4,606.3 ක මුදලක් මාරුකර තිබුණු අතර ඒ අනුව මුළු ශුද්ධ ප්‍රතිපාදනය මුදල රු.මිලියන 6,506.3 වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ දි මෙම වැය විෂයය යටතේ රු.මිලියන 1,801.76 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරි වී තිබුණු අතර ඒ අනුව දින 20කට පෙර අනුමත කරගත් රු.මිලියන 1,800 ක මුළු පරිපූරකයම ඉතිරි වී තිබුණි. මෙම වැඩසටහන සම්පූර්ණයෙන්ම පළාත් සභා හරහා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් පළාත් සභා වෙත පවරා තිබියදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාසල් පෝෂණ වැඩසටහනට 126-1-2-1-1501 වැය විෂයය යටතේ ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණි. 2023 වර්ෂයේදී ද මෙම වැය විෂයයේ ප්‍රතිපාදන ඉතිරි වීම් සියයට 94 ක් වී තිබුණි.	රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයක් අනුව 2024 වර්ෂයේ මාර්තු මස සිට සියලුම රජයේ පාසල්වල 1-5 ශ්‍රේණිවල සිසුන් සඳහා පාසල් පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද අතර, වෙළඳපල මිල ගණන් සලකා බලා එතෙක් පැවති එක් ආහාර වේලක් සඳහා වැය වන මුදල රු.85/-සිට රු.110/- දක්වා වැඩි කරන ලද බව හා පෝෂණ වැඩසටහන යටතේ සිදු කරනු ලබන නියාමනය හා අධීක්ෂණය වැනි කටයුතු සඳහා සාමාන්‍යයෙන් වැය වන මුදලට වඩා වැඩි අගයක් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත වෙන් කර ඇති අවස්ථාවකදී එම මුදල් අප විසින් යොදා ගනු ලැබුවේ, පෝෂණ වැඩසටහනට අදාළ පාර්ශව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා සහ පෝෂණ වැඩසටහන නියාමනය හා අධීක්ෂණ කටයුතු සඳහා පමණක් බව.	අවශ්‍යතාව නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කල යුතු වීම හා පරිපූරක ප්‍රතිපාදන සලසන ලද ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකරමින් නිශ්චිත කාර්යසාධන මට්මට ළඟාකර ගැනීමට අදාළ බලධාරීන් වග බලා ගත යුතු බව හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන පරිදි කටයුතු කල යුතු වීම.

(ඉ)	2024 වර්ෂයේ පාසල් සෞඛ්‍ය පෝෂණ වැඩසටහන සඳහා රු.මිලියන 6,506.3 ක ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණද වැඩසටහන අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක වී නොතිබුණු අතර විගණන නියැදි පරීක්ෂණයට අනුව පළාත් 03 ක පාසල් 25ක පාසල් පෝෂණ වැඩසටහන මනාව කලමනාකරණය නොකිරීම හේතුවෙන් අතරමග නැවතී තිබුණු අතර අමාත්‍යාංශය විසින් පාසල් පෝෂණ වැඩසටහන, මෙහෙයුම් සැලැස්මකට අනුව මෙහෙයවා ප්‍රගතිය සමාලෝචනය කිරීමද සිදුකර නොතිබුණි.	ප්‍රතිපාදන ඉතිරිවීමට සැපයුම්කරුවන්ගේ විවිධ ගැටළු පැවතීම ද හේතුවක් වන බව හඳුනාගෙන ඇත. නියමිත ආහාර වට්ටෝරුවට අනුව ආහාර ලබා නොදෙන දිනවලදී එම දිනවලට හිමි මුළු මුදලම කපා හැරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය හැක. එම නිසා නියමිත ආහාර වට්ටෝරුවටම ආහාර ලබාදීමට සැපයුම්කරුවන් දැනුවත් කරන ලෙසත් සැපයුම්කරුවන් සොයා ගැනීමේ අපහසුතා පවතින පාසල් සඳහා දෙමව්පියන් සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි කිරීමට දිරිගන්වන ලෙසත් පළාත් පෝෂණ සම්බන්ධීකරණ නිලධාරීන් මාර්ගගත රැස්වීම්වලදී දැනුවත් කළ බව.	අවශ්‍යතාව නිවැරදිව හඳුනාගෙන අයවැයගත ක්‍රියාකාරකම් සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම අනුව ඇස්තමේන්තු සකස් කල යුතු වීම හා ප්‍රතිපාදන සලසන ලද ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකරමින් නිසි අධීක්ෂණ වැඩපිළිවෙලක් ස්ථාපිත කර නිශ්චිත කාර්යසාධන මට්ටමට ළගාකර ගැනීමට අදාළ බලධාරීන් වග බලා ගත යුතු බව හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන පරිදි කටයුතු කල යුතු වීම.
(ඊ)	ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂයේදී රු.මිලියන 2,078.75 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර වර්ෂය තුලදී දැරූ වියදම රු.මිලියන 883.59 ක් වීමෙන් රු.මිලියන 1,190.16 ක් හෙවත් සියයට 57 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. කොන්ත්‍රාත්කරුවන්ට මුදල් නොගෙවීම හේතුවෙන් බොහෝ ව්‍යාපෘති කොන්ත්‍රාත්කරුවන් ඉදිකිරීම් අතරමග නවතා දමා තිබුණු අතර ඒ ඒ කොන්ත්‍රාත් කාර්යයන්වලින් නීත්‍යානුකූලව ඉවත් වීම සහ ගෙවීමට තිබෙන වටිනාකම් නිශ්චිතව හඳුනාගෙන ඒවා සඳහා ගෙවීම් සිදුකර කාර්යයන් නිමකර ගැනීමට ව්‍යාපෘති 288ක් සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. පාසල් භූමිය තුළ වැඩ නිම නොවූ ඉදිකිරීම් දීර්ඝකාලීනව පැවතීම හේතුවෙන්, සිසුන්ට අනතුරුවලට මුහුණ පෑමට සිදුවිය හැකි අවදානමක් පැවතුණද ඒ පිළිබඳව සැලකිලිමත්ව කටයුතු කර	2024 වර්ෂයේ බැදීම් වශයෙන් ප්‍රතිපාදන ඉල්ලුම් නොකිරීම හේතුවෙන් මෙම වැය ශීර්ෂ දෙක යටතේ උපයෝජනය කිරීමට හැකිවුණේ රු.මිලියන 72 ක පමණ ප්‍රතිපාදනයක් පමණි. කෙසේ වුවද පළාත් සභා වැඩ සඳහා 2025 වර්ෂයේ ප්‍රතිපාදන සලසාගෙන ඒවා නිවැරදි කරදීමට කටයුතු කරමින් පවතී. ව්‍යාපෘති කළමණාකරණ ඒකකය මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩ බොහෝමයක විසඳාගැනීමට නොහැකි ගැටළු නිර්මාණය වී ඇති බැවින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් අනුමැතිය ලබාගෙන ඒවා නිවැරදි කරදීමට කටයුතු කරමින් පවතින බව.	කොන්ත්‍රාත් ගිවිසුම් නීත්‍යානුකූලව කාලීනව අවසන් නොකිරීම සම්බන්ධයෙන් රජයට වැඩිපුර ගෙවීමට සිදු වූ මූල්‍ය හානියට ඉංජිනේරු අංශය ඇතුළු වගකිව යුතු නිලධාරින් වගකිවයුතු වීම, අතරමඟ නතර කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සුදුසු වැඩපිළිවෙලක් හඳුන්වාදීම හා අමාත්‍යාංශය මගින් සෘජුවම ඉටුකරන හා පළාත් සභා හෝ වෙනත් ආයතන හරහා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ඉටුකර ගන්නා නව ඉදිකිරීම්, නවීකරණ හා අලුත්වැඩියා පිළිබඳව 2025 ජූනි 30 දිනට සමස්ත තොරතුරු ලබාගෙන ඉදිරියේදී අඛණ්ඩව යාවත්කාලීනව අමාත්‍යාංශ මට්ටමින් පවත්වා ගනිමින් මෙහෙයුම් කටයුතුවල අයිතිය මනාව සිදුකර ඒ ඒ වර්ෂවලදී ප්‍රගතිය ළගා කර ගතයුතු බව.

	නොතිබුණි.		
(උ)	අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ආයතන 14 ක පුද්ගල පඩිනඩි වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදි ලබා දි ඇති ප්‍රතිපාදනවලට අමතරව රු.මිලියන 76.44 ක පරිපූරකයක් ලබාගෙන තිබුණු නමුත් වර්ෂය අවසානයේ දි යාපනය විශ්ව විද්‍යාලය වෙත ලබා දුන් පරිපූරක ප්‍රමාණයෙන් සියයට 56 ක් , ජාතික මූලික අධ්‍යයන ආයතනය වෙත ලබාදුන් පරිපූරක ප්‍රමාණයෙන් සියයට 34 ක් සහ අනෙකුත් ආයතන 12ක් වෙත ලබා දුන් මුළු පරිපූරක ප්‍රමාණයම ඉතිරි වී තිබුණු අතර පරිපූරක ඇස්තමේන්තු නිසි පුරෝකථනයකින් තොරව සකස් කර අනුමත කරගෙන නොතිබුණි.	පරිපූරක ප්‍රතිපාදන ඉතිරිවීම් විස්තර ඇමුණුම් 13 මගින් ඉදිරිපත් කර ඇති බව.	2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 26 පරිච්ඡේදය ප්‍රකාරව පරිපූරක ඇස්තමේන්තු යෝජනාවක් යටතේ ප්‍රතිපාදන වෙන්කර ගැනීමේදී නිසි මූල්‍ය කළමණාකරණයක් ඇතිව අයවැය ගණකාධිකාරි විසින් කටයුතු කළ යුතු අතර මූල්‍ය විනය මැනවින් පවත්වා ගැනීම ඒ අනුව සිදුවිය යුතු වීම.
(ඌ)	ශ්‍රී ලංකා කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලවල ඉදිකිරීම් පාඨමාලාවල ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වන 126-2-21-014-2001(17) වැය විෂයය යටතේ සමාලෝචිත වර්ෂයේ දී ප්‍රතිපාදන වෙන්කර නොතිබුණු අතර රු.මිලියන 3 ක පරිපූරකයක් ලබාගෙන තිබුණි. නිසි පුරෝකථනයකින් හා කිසිඳු තාර්කික පදනමකින් තොරව අනවබෝධයෙන් යුතුව පරිපූරක ප්‍රතිපාදන අනුමත කිරීමට කටයුතු කිරීම හේතුවෙන් අනුමත පරිපූරක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2.66 ක් හෙවත් සියයට 89 ක් සමාලෝචිත වර්ෂය අවසානයේදි ඉතිරි වී තිබුණි.	මෙම ව්‍යාපෘතිය සඳහා දේශීය මූල්‍යනය (වැට් හා අනෙකුත් බදු ගෙවීම) සඳහා මෙම ප්‍රතිපාදන ලබාගත්තද විදේශ මූල්‍යනය සියයට 81 ක් පමණක් වූ බැවින් හා බොහෝ සැපයුම්කරුවන් වැට් ලියාපදිංචි වූ සැපයුම්කරුවන් නොවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.	-එම-

3.3 වියදම් අතිරික්තතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
නිපුණතා අංශයේ ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා පරීක්ෂා කිරීමේදී සමාලෝචිත වර්ෂය තුල විදේශ ආධාර ව්‍යාපෘති 03ක රු.මිලියන	මූල්‍ය ප්‍රගතිය ලබාගැනීමට නොහැකි වීම සහ ව්‍යාපෘති වියදම් කිරීමේදී ස්වාධීනව කටයුතු කිරීම ආදී කරුණු	ඇස්තමේන්තු ඉක්මව වියදම් දැරීම සම්බන්ධයෙන් රාජ්‍ය වියදම් කළමනාකරණය පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

40.73 ක්, රු.මිලියන 16.94 ක් සහ රු.මිලියන 59 ක් බැගින් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණි.	ඇස්තමේන්තු ඉක්මවා වියදම් දැරීමට හේතු වී ඇති බව ප්‍රකාශ කර ඇති බව.

3.4 **බැරකම් හා බැදීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2(ඇ) ජේදය අනුව යම් මුදල් වර්ෂයකට අදාළව සියළුම බැරකම් එම වර්ෂය තුළදී මුදල් ගෙවා නිදහස් කළ යුතු අතර කිසිදු බැරකමක් ඊළඟ වර්ෂය තුළදී නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු වුවද 2024 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව රු.මිලියන 13,968.8 ක් වූ බැරකම් හා රු.මිලියන 1.51 ක් වූ බැදීම් ඇති කරගෙන තිබුණි.	සංවර්ධන වැඩසටහන් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා ඇතිකරගත් ගිවිසුම් වටිනාකම අදාල වර්ෂයේ දීම ගෙවා නිම කිරීමට නොහැකි වන බැවින් මු.රෙ.94(3)අනුව බැදීම් ඇතිකර ගෙන ඇත. ඒ අනුව ඉදිකිරීම් ව්‍යාපෘතියක් වසර කිහිපයක් යටතේ ක්‍රියාත්මක වන බැවින් අදාල වසර තුලදී සියලු වියදම් ගෙවා නිදහස් කල නොහැකි බැවින් ව්‍යාපෘතියට අදාල සම්පූර්ණ බැදීම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති බව.	වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා ප්‍රතිපාදන පවතී නම් පමණක්, වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතු බව.
(ආ)	2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (අ) ජේදයට අනුකූල නොවන ආකාරයට ප්‍රතිපාදන ඉක්මවා වැය විෂයයන් 10 ක රු. මිලියන 517.32 ක බැරකම් ඇති කරගෙන තිබුණි.	2023 වර්ෂයට අදාල බැරකම් 2024 වර්ෂයේදී ගෙවා අවසන් කර ඇත. එහෙත් CIGAS වැඩසටහන යාවත්කාලීන නොකිරීම මත තවදුරටත් බැරකම් ලෙස සඳහන් වේ. ගෙවා අවසන් සියලු බැරකම් CIGAS වැඩසටහන තුලින් ඉවත් කර එම පද්ධතිය යාවත්කාලීන කරන ලෙස අදාල ගෙවීම් ඒකක වෙත උපදෙස් ලබා දී ඇති බව.	ප්‍රතිපාදනයෙන් ඉතිරිය ඉක්මවා බැරකම් ඇති කර නොගත යුතු වීම හා බැරකම්වලට අදාළව ගෙවීම් කිරීමට වවුචර් ඉදිරිපත් වූ පසුව එම අවස්ථාවේදීම, ඊට අදාළ ගෙවීම, බැරකම් ලේඛනයෙන් ඉවත් කිරිමට සටහන් යොදා ඇති බව හා CIGAS පරිගණක වැඩ සටහනේ බැරකම් ලේඛනයෙන්ද ඉවත් කළ බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව බැරකම් සඳහා ගෙවීම් කිරිම සිදුකරන පරිදි ගෙවීම් ඒකක අතර සම්බන්ධීකරණයකින් යුතුව ක්‍රමවේදයන් ස්ථාපිත කළ යුතු වීම හා බැරකම් ලේඛනය යාවත්කාලීන කළයුතු වීම.

(ඇ)	මුදල් රෙගුලාසි 94 (1) හි පරිදි වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතු වුවත් බැරකම් ශේෂ නිරාකරණය කරගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් වී නොතිබියදී, 2023, 2019 හා 2018 වර්ෂවලට අදාළ රු.මිලියන 1,265.6 ක බැරකම් ඇති කරගෙන තිබුණි.	එක් එක් ගෙවීම් ඒකක විසින් CIGAS පද්ධතිය වෙත බැරකම් ඇතුලත් කරන බැවින් 2018, 2019 සහ 2023 වර්ෂවලට අදාලව දක්වා ඇති බැරකම් තුලින් මේ වන විට ගෙවා අවසන් බැරකම් CIGAS පද්ධතිය වෙතින් වහාම ඉවත් කරන ලෙස අදාල ගෙවීම් ඒකක වෙත උපදෙස් ලබා දී ඇති බව.	බැරකම්වලට අදාළව ගෙවීම් කිරීමට වවුචර් ඉදිරිපත් වූ පසුව එම අවස්ථාවේදීම, ඊට අදාළ ගෙවීම, බැරකම් ලේඛනයෙන් ඉවත් කිරීමට සටහන් යොදා ඇති බව හා CIGAS පරිගණක වැඩ සටහනේ බැරකම් ලේඛනයෙන්ද ඉවත් කළ බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව බැරකම් සඳහා ගෙවීම් කිරීම සිදුකරන පරිදි ගෙවීම් ඒකක අතර සම්බන්ධීකරණයකින් යුතුව ක්‍රමවේදයන් ස්ථාපිත කළ යුතු වීම හා බැරකම් ලේඛනය යාවත්කාලීන කළයුතු වීම.
(ඇ)	භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ (SA 92) අනුව ඉකුත් වර්ෂවල එනම් 2018, 2019 සහ 2020 වර්ෂවල රු.මිලියන 77.28ක බැරකම් සමාලෝචිත වර්ෂයේ බැරකම් ලේඛනයේ ඇතුළත් වී තිබුණි. එමෙන්ම 2023 වර්ෂයට අදාළ රු.මිලියන 1.34ක බැඳීම් හා රු.මිලියන 4,002.42ක බැරකම්ද භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශයේ ඇතුළත් වී තිබුණි.	මෙම බැරකම් CIGAS පද්ධතිය වෙතින් ඉවත් කිරීමට අදාල ගෙවීම් ඒකක වෙතට උපදෙස් ලබා දී ඇත. Cigas පද්ධතිය තුළ පවතින පෙර වර්ෂවලට අදාල සියලු බැරකම් නිරවුල් කර Cigas පද්ධතිය යාවත්කාලීන කිරීම මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී කටයුතු කරන බව.	-එම-
(ඉ)	ඉකුත් වර්ෂයන්ට අදාල රු.මිලියන 1,265.6ක් වූ බැරකම්, ගෙවීම් කර නිදහස් කර තිබේද යන්න ගෙවීම් පාලනය හා බැරකම් ලේඛනය පවත්වාගෙන යන අංශ අතර සැසඳීමක් මාසයකට වරක් හෝ සිදුකර නොතිබුණු බැවින් එම අංශ දෙක අතර තොරතුරු 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පරීක්ෂා කර නිශ්චිත සාක්ෂි සහිතව බැරකම් ලේඛනය යාවත්කාලීන කිරීම, ඉදිරි කටයුතු සිදුකිරීම සහ සාක්ෂි සහිත තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීම සිදුකල යුතුව පවතින බව විගණනය නිරීක්ෂණය කෙරේ.	එක් එක් ගෙවීම් ඒකක විසින් බැරකම් ලේඛන පවත්වාගෙන යන බැවින් එම අංශ සමඟ සම්බන්ධ වෙමින් බැරකම් ලේඛන යාවත්කාලීන කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව.	බැරකම්වලට අදාළව ගෙවීම් කිරීමට වවුචර් ඉදිරිපත් වූ පසුව එම අවස්ථාවේදීම, ඊට අදාළ ගෙවීම, බැරකම් ලේඛණයෙන් ඉවත් කිරීමට සටහන් යොදා ඇති බව හා CIGAS පරිගණක වැඩ සටහනේ බැරකම් ලේඛනයෙන්ද ඉවත් කළ බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව බැරකම් සඳහා ගෙවීම් කිරීම සිදුකරන පරිදි ගෙවීම් ඒකක අතර සම්බන්ධීකරණයකින් යුතුව ක්‍රමවේදයන් ස්ථාපිත කළ යුතු වීම. ගෙවීම් පාලනය හා බැරකම් ලේඛනය පවත්වාගෙන යනු ලබන ගෙවීම් ඒකක අතර

			කාලීනව සැසඳීම් සිදු කිරීමටද කටයුතු ස්ථාපිත කළ යුතු වීම හා යාවත්කාලීන කරන ලද නිවැරදි බැරකම් ලේඛනයක් සැකසීම.

3.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචන සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සහ සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සමාලෝචන කටයුතු සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත යොමු කිරීමට 2025 වසරේ සිට කටයුතු කරන බව.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.
(ආ)	වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරිම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරිමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 1.6.1 හි සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටුකර නොතිබුණි.	යුනෙස්කෝ අරමුදලෙහි 2015 – 2024 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අසම්පූර්ණ බැවින් නැවත එම අඩුපාඩු සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලෙස කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. TEDP ව්‍යාපෘතිය සඳහා 2023 හා 2024 වර්ෂ ඇතුලත 2019, 2020 හා 2021 වර්ෂයන්ට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි. ඉදිරි වර්ෂයන්ට අදාලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම ද මේ වන විට ආරම්භ කර ඇති බව.	-එම-

(ඇ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.13 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතා ඉටුකර නොතිබුණි.	විගණන විමසීම් ඉදිරිපත් කර පිළිතුරු ලබාගැනීම මෙම අමාත්‍යාංශ අභ්‍යන්තරයේ පවතින අනිකුත් ශාඛාවන් මගින්ද අමාත්‍යාංශයට අනුබද්ධ අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනයන් මගින්ද අමාත්‍යාංශය යටතේ පවතින ජාතික පාසල් මගින්ද සිදු කළ යුතුව පවතී. මෙම ක්‍රියාවලිය සඳහා දීර්ඝ කාලයක් ගතවන අතර මේ සඳහා දැනට සිටින කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම අදාළ විගණනයෙන් පෙන්වා දී ඇති පිළිතුරු ලබාදීමේ ප්‍රමාදයට හේතු පාදක වී ඇත. ඒ අනුව ඉදිරියේ දී මෙම ගැටලුව වලක්වා ගැනීම සඳහා මා විසින් කාර්ය මණ්ඩලයේ අවශ්‍යතාවය පෙන්වා දෙමින් තනතුරු අනුමැතිය ලබා ගැනීමට අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ED/12/01/14/2024-12 හා 2025 මාර්තු 28 දිනැති ලිපිය යොමු කර ඇත.	-එම-
(ඈ)	අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.3 හි සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.	2024 වර්ෂයෙහි අභ්‍යන්තර විගණන සැලැස්මෙහි හඳුනාගන්නා ලද විගණන ක්‍රියාකාරකම්වලින් සියයට 80 ක ප්‍රමාණයක් 2024 වර්ෂය තුළ ඉටුකර ඇති අතර විගණන සැලැස්මෙහි ඇතුළත් නොවූ එහෙත් මාගේ නියෝග මත සිදු කළ විශේෂ විගණන පරීක්ෂණ 21 ක් ද එම වර්ෂයේදී සිදු කර ඇත. ඒ අනුව අංශයේ පවතින සීමිත කාර්ය මණ්ඩලය එම විශේෂ පරීක්ෂණ සඳහා යෙදවීමට සිදු වීම මත විගණන සැලැස්ම සියයට සීයක් සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත. එම නිසා 2025 වර්ෂයේ විගණන සැලැස්ම පූර්ණ වශයෙන් සිදු කිරීමට සැලසුම් කර ඇති බව.	-එම-

3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

		නිරීක්ෂණය			
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	**වටිනාකම රු.**	**අනුකූල නොවීම**	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(i)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය				
(අ)	ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ 7.1 හා 7.4 උප වගන්ති		නිවාඩු ලබා නොගෙන රාජකාරියට නොපැමිණෙන නිලධාරියෙකු එලෙස නොපැමිණි දින සිට සිය තනතුර අත්හැර ගියා සේ සලකා ඒ බව එකී නිලධාරියාට වහාම දන්වා නොතිබුණු අතර සේවයට වාර්තා නොකර මාස 03කට වැඩි කාලයක් සේවයෙන් බැහැරව සිටි ක්‍රීඩා පුහුණුකරුවන් පිළිගත නොහැකි සාක්ෂි මත පදනම්ව නැවත සේවයේ පිහිටුවා තිබුණි.	තමන් රාජකාරියට වාර්තා නොකිරීම පිළිබඳව හේතු දැක්වීමක් ලිඛිතව ඔහුගේ විනය බලධාරියා වෙත දන්වමින් නැවත සේවයෙහි පිහිටුවන ලෙස අභියාචනයක් ඉදිරිපත් කළ විට විනය බලධාරියා විසින් එම අභියාචනය සලකා බලා නිලධාරියා සේවයට වාර්තා නොකර ඇත්තේ පිළිගත හැකි හේතූන් මත නම් නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කළ හැකි බව.	ආයතන සංග්‍රහය ප්‍රකාරව තනතුර අතහැර ගිය නිලධාරින් පිළිගත නොහැකි සාක්ෂි මත නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කරන ලද නිලධාරීන්ට එරෙහිව පියවර ගතයුතු වීම.

(ii)		ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය				
	(අ)	මුදල් රෙගුලාසි 104(3) සහ 104(4)		පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරිමට දින 7 කට වැඩි ප්‍රමාදයක් සිදුවේ නම්, ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොමැති සිද්ධීන් 18 ක් වූ අතර අලාභය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුලත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවත් අදාල අංශ විසින් ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදු නොකිරීම හේතුවෙන් එසේ කටයුතු කර නොමැති සිද්ධීන් 52 ක් පැවතුණි.	අලාභයක් සිදු වූ දින සිට තුන් මසක් ඇතුලත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවත් ප්‍රායෝගික ගැටලු මත එසේ කිරිමට නොහැකි වී ඇති බව.	මුදල් රෙගුලාසි විධිවිධාන අනුව වගකිව යුතු නිලධාරීන් නියමිත කාලවකවානු වල හඳුනාගෙන ඉදිරි කටයුතු සිදු කළ යුතු බව.
(iii)		රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ				
	(අ)	ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ 2017 අප්‍රේල් 27 දිනැති හා අංක EST/7/EXAMS/05/1007-6 දරණ හා 2016 දෙසැම්බර් 28 දිනැති අංක EST/T/ALLOW/05/003	රු.මිලියන 7.4	විෂයානුබද්ධ රාජකාරියට අයත් විවිධ අත්පොත් සැකසීම, මාර්ගෝපදේශ සංග්‍රහයන් සකස් කිරීම, චක්‍රලේඛ සකස් කිරීම, ගුරු පුහුණු මොඩියුල් සකස් කිරීම වැනි දේශන ස්වරූපයේ නොවන කාර්යයන් වෙනුවෙන් සහභාගී වූ නිලධාරීන්ට රු	අත්පොත් සැකසීම, මාර්ගෝපදේශ සංග්‍රහයන් සකස් කිරීම, ගුරු පුහුණු මොඩියුල් සකස් කිරීම වැනි වැඩමුළු (workshop) සඳහා උක්ත ලිපියේ සඳහන් වගු අංක 01 යටතේ සම්පත්දායකත්වය ලබා දෙන නිලධරයන් සඳහා ගෙවීම් සිදු කර ඇති	වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර චක්‍රලේඛය ප්‍රකාරව මින් ඉදිරියට සම්පත් දායක දීමනා ගෙවීමට කටයුතු කිරීම හා

	7-4 දරණ ලිපි	මිලියන 7.4 ක් ආයතන අධ්‍යක්ෂ ජනරාල් පනවන ලද විධිවිධානවලට පටහැනිව සම්පත් දායක දීමනා ලෙස ගෙවීමට කටයුතු කර තිබුණි.	බව.	අමාත්‍යාංශයට සුවිශේෂී කාර්යයන් සඳහා ආයතන අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලබාගෙන ගෙවීම් කිරීමට වගබලාගත යුතු වීම.
(iv)	රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ			
(අ)	2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කර ඇති කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII පරිච්ඡේදය සහ 2017 ජුනි 21 දිනැති අංක PSC/EST/02-04-34/01/2017 දරන ලිපිය, 2024 මැයි 30 දිනැති අංක 21/2024 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයේ	(i) ඒ ඒ පාසලේ නියමිත සේවා කාලය ඉක්ම වුවද පාසල් විදුහල්පතිවරුන් විසින් එම තොරතුරු චක්‍රලේඛ ප්‍රකාරව අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් නොකිරීම, නිවැරදි තොරතුරු සහිතව ඉදිරිපත් නොකිරීම හා අමාත්‍යාංශ මට්ටමින් දත්ත පද්ධතියක් පවත්වා නොතිබීමද හේතුවෙන් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය නියමිත පරිදි සිදු කිරීමට	අධ්‍යාපන සේවා ජාලයේ තොරතුරු ඇතුළත් අවුරුදු 05 ට වැඩි නිලධාරින් පිළිබඳ තොරතුරු වාර්ෂික ස්ථානමාරුවලදී සලකා බැලීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරනු ලබන බව.	වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය නියමිත පරිදි සිදු කිරීමට හැකි පරිදි තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් අමාත්‍යාංශය මට්ටමින් පවත්වා ගැනීමට කටයුතු කරමින් අමාත්‍යාංශයේ නිලධාරින් වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය නියමිත පරිදි බලාත්මක කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගතයුතු බව හා එසේ සිදු නොකරන

	v(ඇ) (i) ඡේදය	අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.		පාසල්, අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණය තුලින් හඳුනාගැනීමට කටයුතු කල යුතු බව.
(ආ)	පටිපාටික රීති 28 සහ 32	අනුමත සේවා ව්‍යවස්ථාවක් හෝ බඳවා ගැනීම් පටිපාටියක් නොමැති තනතුරු සඳහා වැඩ බැලීමේ පත්කිරීමක් සිදුකල නොහැකි වුවද, අධ්‍යක්ෂ (පිරිවෙන්) තනතුර සඳහා වැඩ බැලීමේ පත් කිරීමක් සිදුකර තිබුණි.	නිවැරදි බඳවාගැනීම් පටිපාටියට මෙතෙක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී නැත. කොන්ත්‍රාත් පදනම මත පත්කිරීමට ලද අනුමැතිය අනුව මෙම පත්කිරීම සිදුකර ඇති බව.	පවතින විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම හා විධිවිධාන ඉක්මවා කටයුතු කරන ලද නිලධාරීන් රජයට සිදු වූ වැය බරට වගකිව යුතු බව.
(v)	අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ			
(අ)	2023 අප්‍රේල් 25 දිනැති අංක 17/2023 දරණ චක්‍රලේඛය			
	• 6.0 වගන්තිය	2024 අප්‍රේල් 25 දින සිට 2024 ජුලි 26 දින දක්වා කාලය තුලදී චක්‍රලේඛ විධිවිධාන පරිදි අතරමැදි පන්ති සඳහා සිසුන් ඇතුලත් කල හැකි කාණ්ඩ 07 ට සුදුසුකම් නොලබන විට, චක්‍රලේඛයේ 6.0 වගන්තිය අවභාවිතා කරමින් සාධාරණීකරණය කළ නොහැකි	පාසල්වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීමේ දි 17/2023 චක්‍රලේඛයෙන් ආවරණය නොවන විවිධ කණ්ඩායම්වල ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පන්තියක සිටිය යුතු උපරිම සීමාව	ශ්‍රී ලාංකික සියළු දරුවන්ගේ සම අධ්‍යාපන අයිතීන්, සුරක්ෂිත වන අයුරින් අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් බඳවාගැනීමේ චක්‍රලේඛය සංශෝධනය කිරීමට

			හේතූන් පදනම් කරගෙන දිවයිනේ ජනප්‍රිය පාසල් 106 කට සිසුන් 528 ක් ඇතුලත් කිරීමට අධ්‍යාපන ලේකම්වරයා විසින් කටයුතු කර තිබුණි.	ඉක්මවූවද, ඉහත කාණ්ඩ වලට අයත් සිසුන් ඇතුළත් කිරීමට මා වෙත බලය ලබා දී ඇති බව.	කටයුතු කිරීම.
	(ආ)	2024 අගෝස්තු 20 දිනැති අංක 27/2024 දරන චක්‍රලේඛයේ 02 ඡේදය	සේවයේ යෙදී සිටින ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I, II සහ III ශ්‍රේණියේ සියළුම නිලධාරීන්ගෙන් යම් සේවා ස්ථානයක අඛණ්ඩව වසර 08ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියළුම නිලධාරීන් ස්ථාන මාරු ඉල්ලුම් කර නොතිබුණද ස්ථාන මාරුවලට යටත්වන බව දක්වා තිබුණද නිලධාරීන් 15 දෙනෙකු වසර 09ත් 24ත් අතර කාලයක් රුහුණු අධ්‍යාපන විද්‍යා පීඨය තුළ සේවයේ නිරත වී තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	ගුරු මාරු ප්‍රතිපත්තිය නියමිත පරිදි ක්‍රියාත්මක කළ යුතු බව.
(vi)		ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ අංක 1928/28 හා 2015 අගෝස්තු 21 දිනැති සේවා ව්‍යවස්ථාව			
		• 11.1 වගන්තිය	තනතුරුවලට පත්කිරීම යටතේ විදුහල්පති තනතුර සඳහා සුදුසුකම් ලෙස ශ්‍රී.ලං.අ.ප.සේ. i/ ii/ iii ශ්‍රේණියේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවේ	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	සංශෝධනය කල සුදුසුකම් ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකල යුතු වීම හා

	නිලධාරියකු විය යුතු බව නිශ්චිතව දක්වා තිබියදී එය සංශෝධනය කර ගැසට් පත්‍රයේ පල කිරීමකින් තොරව කොළඹ විශාකා විද්‍යාලයේ විදුහල්පති තනතුර සඳහා විශේෂ සේවා ගණයේ නිලධාරිනියක් 2022 වර්ෂයේ පත් කිරීමට කටයුතු කර තිබුණි.	සංශෝධනය කිරීමකින් තොරව සිදු කරන ලද පත්වීම සම්බන්ධව නීත්‍යානුකූල තත්ත්වය නැවත විමසා බැලිය යුතු බව.

3.7 තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව තැම්පත් කල දින සිට වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුව ද සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය ආදායමට බැර නොකල තැන්පතු ගිණුම් 09 ක වටිනාකම රු.මිලියන 427.75ක් වූ අතර, එම වටිනාකම තුල වර්ෂ 5ක් ඉක්ම වූ රු.මිලියන 146.15ක ශේෂයක් ඇතුලත් වී තිබුණි.	කල් ඉකුත් වූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. 571 අනුව කටයුතු කරන ලෙසත් වර්ෂ 2 ඉක්මවීමට පෙර තැන්පත් ශේෂ නිරවුල් කරන ලෙසත් අදාළ සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා පීඨාධිපතිවරුන් වෙත ලිඛිතව උපදෙස් ලබා දී ඇති බව.	මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කළ යුතු වටිනාකම් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කල යුතු බව.

3.8 අධිභාර කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 ජුනි 27 දිනැති අංක 18/2015 (V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 ඡේදයෙහි විධිවිධාන අනුව විදුහල්පති තනතුර දරන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධරයන්ට, විදුහල්පතිවරුන්ට හිමිවන විශේෂ දීමනාව ගෙවිය නොහැකි වුවද, බස්නාහිර පළාතේ 2024 ජූලි මස සිට 2024 දෙසැම්බර් මස දක්වා පාසල් 72ක අධ්‍යාපන පරිපාලන සේවයට අයත්	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	2024 ජුනි 27 දිනැති අංක 18/2015 (V) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 ඡේදයෙහි විධිවිධාන අනුව විශේෂ දීමනා නොගෙවිය යුතු අතර චක්‍රලේඛයට පටහැනිව සිදුකල ගෙවීම් අයකර ගැනීමට කටයුතු කල යුතු වීම.

	විදුහල්පතිවරුන් 58 දෙනෙකුට විධායක ශ්‍රේණියේ නිලධාරින්ට හිමි විශේෂ දීමනාව සහ විදුහල්පති දීමනාව යන දිමනා දෙවර්ගයම, චක්‍රලේඛයට පටහැනිව ගෙවීම් කිරීම හේතුවෙන් රු.මිලියන 2.15ක් වැඩිපුර ගෙවා තිබුණි.		
(ආ)	2019 මැයි 06 දිනැතිව බඳවාගෙන තිබුණු ක්‍රීඩා පුහුණුකරුවන්ගේ පත්වීම් ලිපියෙහි 24 ඡේදය යටතේ දක්වා ඇති පරිදි වසර 05 ක් තුළ මෙම තනතුරෙන් ඉල්ලා අස්වීම හෝ වෙනත් තනතුරක වැඩභාර ගැනීමට මෙම තනතුරෙන් මුදා හරින ලෙස ඉල්ලා සිටියහොත් සමාරම්භක පුහුණුව සඳහා රජය විසින් එක් පුහුණුකරුවකු වෙනුවෙන් දැරූ රු.163,053 ක මුදල නැවත රජයට ගෙවිය යුතු බව දන්වා තිබුණි. 2025 මැයි 30 දිනට වසර 05 ක් ඇතුළත සේවයෙන් ඉල්ලා අස්වූ සහ වෙනත් සේවාවන්වලට මුදාහල ක්‍රීඩා පුහුණුකරුවන් 30 දෙනෙකු වෙනුවෙන් දැරූ රු.මිලියන 4.9 ක වියදම පත්වීම් ලිපිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර සේවය හැරගිය 280 දෙනෙකු වෙනුවෙන් රු.මිලියන 45.65ක මුදලක් නිශ්කාර්ය වී තිබුණු අතර හඳුනාගත් රු. 521,574 ක හිග ණය ශේෂ හා වැටුප් අයකර ගත යුතුව පැවතුණි.	සේවය හැරයාමේ නියෝග සමඟ ආපසු අයකර ගැනීමට අදාළ නියෝග නිකුත් කරනු ලබන අතර එහිදි කලාප බලධාරීන් විසින් අදාළ දැනුවත් කිරීම් කරනු ලැබේ. මේ වන විට මා විසින් ලබාදුන් උපදෙස් අනුව දත්ත පද්ධතියක් සකස් කිරීමට කටයුතු කෙරෙමින් පවතින බව.	සේවය හැර ගිය නිලධාරීන් පිළිබඳ විස්තර සොයා එම සේවය හැර ගිය නිලධාරින්ගෙන් සමාරම්භක පුහුණුව වෙනුවෙන් දරන ලද මුදල අය කිරීමට කටයුතු කල යුතු වීම හා සේවය අතහැර යන ලද ක්‍රීඩා පුහුණුකරුවන්ගෙන් අයවිය යුතු රජයට වූ අලාභය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 හා ආයතන සංග්‍රහයේ II කොටසේ 8.1 හා 8.2 වගන්ති පරිදි කටයුතු කළ යුතු වීම හා අයකර ගැනීම.
(ඇ)	2023 ඔක්තෝබර් 04 දින සිට රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් රාජකාරි ආවරණය සඳහා පත්කළ අධ්‍යක්ෂ(පිරිවෙන්) හට පූර්ණකාලීන පදනමින් වැඩබැලීමේ පත්වීමක් ලබාදී තිබුණු අතර රාජකාරී ආවරණය සඳහා හිමිනොවන වාහන, ඉන්ධන , දුරකථන හා අනෙකුත් දීමනා ලෙස රු.492,780 ක් ගෙවා තිබුණු අතර අධ්‍යක්ෂ තනතුරට හිමි වාහනයද ලබාදීමට කටයුතු කර තිබුණි. තවද, තනතුර කොන්ත්‍රාත් පදනම මත පිහිටුවීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2024 ජූලි 01 දින	රාජකාරී ආවරණය සඳහා පත් කළ අධ්‍යක්ෂ (පිරිවෙන්) හට වාහන ඉන්ධන දිමනාව හා දුරකථන දිමනාව අනෙකුත් දිමනා ලෙස රු.492,780 ක ප්‍රමාණයක් ගෙවා ඇත්තේ මෙම තනතුර සඳහා ස්වාමීන් වහන්සේ නමක් දිගින් දිගටම පත්කිරීම හා එම හිමිවරුන්ට මීට පෙර ලබාදී තිබුණු වරප්‍රසාද හා පහසුකම් එලෙසින්ම ලබාදීම පදනම් කර ගනිමිනි. ඉදිරියේ දී බඳවාගැනීමේ පටිපාටිය අනුමත වූ පසු ඒ අනුව ක්‍රියාකිරීමටත් කටයුතු කරන බව.	අධිකාරි බලයකින් තොරව ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතු වීම හා අධිකාරි බලයක් නොතිබියදී ගෙවීම් වවුචර් සඳහා නිර්දේශය, අනුමැතිය,බලය හා ගෙවීම් සිදුකළ නිලධාරීන් සම්බන්ධයෙන්ද මු.රෙ.156 පරිදි කටයුතු කළ යුතු වීම.

අනුමත කර තිබුණද, ඊට පෙර නැවතත් අධ්‍යක්ෂ (පිරිවෙන්) තනතුර කොන්ත්‍රාත් පදනමට 2024 මැයි 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම ලබා දී අනුමත නොවූ මාස එකහමාරක කාලපරිච්ඡේදයක් සඳහා සියලු දීමනා සහිතව රු.260,000 ක පමණ වැටුප් හා දීමනා ගෙවීමටත් නිල වාහනය ඇතුලු අනෙකුත් වරප්‍රසාද ලබාදීමටත් කටයුතු කර තිබුණි.

3.9 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණ	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අධ්‍යාපන අමාත්‍යාංශයේ ගිණුම් අංක 09 කට සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගිණුම් අංක 30 ක සහ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට අයත් බැංකු ගිණුම් 10 ක 2024 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් මුදල් ලැබීම්වල වටිනාකම රු.මිලියන 20.80ක් වී තිබුණි.	හඳුනා නොගත් ලැබීම්, හඳුනාගෙන නිරවුල් කර ඇත. ඉදිරියේදී බැංකු සැසඳුම් සකස් කිරීමේදී නියමිත කාලපරිච්ඡේද තුල බැංකු වෙත ලැබෙන සෘජු ප්‍රේෂණ නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලද බව.	මූල්‍ය පිළිබඳ අභ්‍යන්තර පාලනය වඩා විධිමත් කළමණාකරනයකින් යුතුව සිදු කිරීමෙන් අමාත්‍යාංශය යටතේ පවතින සියළුම ඒකකවල ගණුදෙනු හා සිද්ධීන්වලට අදාලව මූල්‍ය විනය වඩාත් යහපත්ව පවත්වා ගැනීමට කටයුතු කලයුතු වීම. ඒ අනුව හඳුනා නොගත් මුදල් ලැබීම් නිරවුල් කිරීමට කටයුතු කල යුතු වීම.
(ආ)	අධ්‍යාපන අමාත්‍යාංශයේ බැංකු ගිණුම් 04 කට, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ඇති බැංකු ගිණුම් 09 කට අදාලව 2024 දෙසැම්බර් 31 දිනට හඳුනානොගත් ගෙවීම්වල මුළු වටිනාකම රු.මිලියන 3.79ක් වී තිබුණි.	ඉදිරියේදී බැංකු සැසඳුම් සකස් කිරීමේදී නියමිත කාලපරිච්ඡේද තුල බැංකු වෙත ලැබෙන සෘජු ප්‍රේෂණ නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලද බව.	මූල්‍ය පිළිබඳ අභ්‍යන්තර පාලනය වඩා විධිමත් කළමනාකරණයකින් යුතුව සිදු කිරීමෙන් අමාත්‍යාංශය යටතේ පවතින සියළුම ඒකකවල ගණුදෙනු හා සිද්ධීන්වලට අදාලව මූල්‍ය විනය වඩාත් යහපත්ව පවත්වා ගැනීමට කටයුතු කලයුතු වීම. ඒ අනුව හඳුනා නොගත් මුදල් ලැබීම් නිරවුල් කිරීමට කටයුතු කල යුතු වීම.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 දැක්ම හා මෙහෙවර

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1991 අප්‍රේල් 19 දිනැති අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ විධිවිධාන අනුව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් සකස් කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 1992, 2003, 2016 හා 2021 වර්ෂවලදී අධ්‍යාපන අමාත්‍යාංශයට නිර්දේශ ඉදිරිපත් කර තිබුණු නමුත් 2025 සැප්තැම්බර් 30 දින වන විටද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් අනුමත කරගෙන නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් අනුමත කර ගැනීමට සමගාමීව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා ඒ ආශ්‍රිත සියළුම ක්‍රියාකාරකම් සිදු කළයුතු වීම.
(ආ)	"නිපුණතාවයෙන් සපිරි පර්යේෂණශීලී සමාජයක්" හා "දැනුමෙන් වෘත්තීය නිපුණතාවයෙන් සහ කුසලතාවයෙන් පිරි සුහුරු සමාජයක් බිහිකිරීම සහ පර්යේෂණ හා නවෝත්පාදන ප්‍රවර්ධනයට හිතකර පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම මඟින් කලාපීය නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක් සඳහා පසුබිම සැකසීම" දැක්ම හා මෙහෙවර කරගත් නිපුණතා අංශයේ 2020, 2021, 2022 කාර්යසාධන වාර්තාවන් හා 2023 කෙටුම්පත් කාර්යසාධන වාර්තා පරීක්ෂා කිරීමේදී නිපුණතා අංශය පසුගිය වර්ෂ 04 පුරාවටම එකම අභියෝගයන්ට දිගින් දිගටම මුහුණ පා තිබුණද එම අභියෝගයන් සාර්ථකව ජයගැනීම සඳහා විධිමත් ස්ථිර ක්‍රමෝපාය සහිත සැලැස්මක් සකස් කර ඒ අනුව ක්‍රියාත්මක වී නොතිබුණි.	2020-2023 කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් පැවති රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රමවේදයන් තුළ ප්‍රතිපාදන සීමාවීම් හමුවේ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ හඳුනාගත් අභියෝග ජයගැනීම සඳහා සකස් කර තිබුණු සැලැසුම් ක්‍රියාවට නැංවීම අසීරු කාර්යයක් විය. 2020-2022 කාලය තුළ පැවති රජයේ අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට අවකාශයක් නොලැබුණු බව.	ස්ථිර ක්‍රමෝපාය සහිත සැලැස්මක් සකස් කිරීමට කටයුතු කල යුතු වීම. අඛණ්ඩවම මුහුණ දෙමින් පවතින අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය ස්ථිරසාර හා නම්‍යශීලී කෙටිකාලීන, මධ්‍යකාලීන හා දීර්ඝකාලීන උපසැලසුම් හා කාලරාමු සහිත සැලැස්මක් සකස් කර, ප්‍රගතිය කාලීනව සමාලෝචනය කරමින් නිපුණතාවයෙන් සපිරි පර්යේෂණශීලී පුද්ගලයන් බිහිකිරීමට හැකි ක්‍රමවේදයක් ස්ථාපිත කරවීමට වගකිව යුතු නිලධාරීන් වගබලාගත යුතු බව.

4.2 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී හා එය ක්‍රියාත්මක කිරීමේදී සලකා බැලිය යුතු 2024 වර්ෂය සඳහා වූ අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මෙහි වර්ෂයට අදාළව යාවත්කාලීන කරන ලද අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යමණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි.	අනුමත කාර්ය මණ්ඩලය, සංවිධාන ව්‍යුහය හා දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර මෙම ශාඛාව මගින් සකස් කරන වාර්ෂික ක්‍රියාකාරී සැලස්මට ඇතුළත් කර නොමැත.ඉදිරි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සඳහා මෙම තොරතුරු ඇතුළත්කිරීමට අපේක්ෂිතය.	අමාත්‍යාංශයේ යාවත්කාලීන කරන ලද සංවිධාන ව්‍යුහය අනුමත හා සත්‍ය කාර්ය මණ්ඩලය පදනම්ව අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුලදී දැක්ම, මෙහෙවර, අරමුණු කරා ළඟාවීමට ඒ ඒ අංශ, ශාඛා, නිලධාරී මට්ටමින් ඉටුකල යුතු ක්‍රියාකාරකම් හඳුනාගෙන ඒවා නිශ්චිත කාලරාමුවක් තුල ඉටු කර ගැනීමට හැකි පරිදි සැලැසුම් කල යුතු බව හා අමාත්‍යාංශයේ ගිණුම් අංශය, ආයතන අංශය යනාදී වශයෙන් සියළුම අංශ සඳහා වූ ක්‍රියාකාරකම් සහිතව පිළියෙල කර සමස්ත ප්‍රගතිය සැලසුම් අධ්‍යක්ෂ ජනරාල් හරහා අධීක්ෂණය විය යුතු බව. සමස්ථ ප්‍රගතිය කාලීනව සමාලෝචනය කරමින් ප්‍රතිකර්ම හා උපායමාර්ගික ක්‍රම මඟින් සමාලෝචිත වර්ෂය තුල සැලැසුම් තුලින් වූ ප්‍රතිලාභ, රටේ දූවා දරුවන්ට අත්කර දිය යුතු බව.

4.3 කාර්යයභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ක්‍රියාකාරි සැලැස්ම අනුව 2024 වර්ෂයේ අපේක්ෂිත කාර්යයන් සඳහා වූ මුළු ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 30,095.2 ක් වුවද ප්‍රගති වාර්තාව අනුව සත්‍ය වියදම රු.මිලියන 10,567ක් වී තිබුණි. ඒ අනුව ලඟාකර නොගත් ක්‍රියාකාරකම් මුළු ප්‍රතිපාදන ප්‍රමාණයෙන් රු.මිලියන	අදාළ අංශ මගින් වියදම් සම්බන්ධව නියාමන හා කාර්යසාධන සමාලෝචන අංශය වෙත ලබාදෙන ලද මූල්‍ය හා ප්‍රගති වාර්තාවන්හි තොරතුරු එම ආකාරයෙන්ම ප්‍රගති වාර්තාවට ඇතුලත් කරන ලදී.අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට අපොහොසත්ව තිබුණු අංශ	අමාත්‍යාංශයේ යාවත්කාලීන කරන ලද සංවිධාන ව්‍යුහය අනුමත හා සත්‍ය කාර්ය මණ්ඩලය පදනම්ව අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුලදී දැක්ම, මෙහෙවර, අරමුණු කරා ළඟාවීමට ඒ ඒ අංශ, ශාඛා, නිලධාරී මට්ටමින්

	19,528.13ක් හෙවත් සියයට 65 ක් වී තිබුණු අතර අපේක්ෂිත ඉලක්ක කරා ලගාවීමට නොහැකි වී තිබුණි. එමෙන්ම ක්‍රියාකාරි සැලැස්ම හා ප්‍රගති වාර්තාව අතර ඇස්තමේන්තුගත වියදමෙහි රු.මිලියන 8,979.79ක වෙනසක්ද පැවතුණි.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී දැනුවත් කරන ලද බව.	ඉටුකල යුතු ක්‍රියාකාරකම් හඳුනාගෙන ඒවා නිශ්චිත කාලරාමුවක් තුල ඉටු කර ගැනීමට හැකි පරිදි සැලැසුම් කල යුතු බව හා අමාත්‍යාංශයේ ගිණුම් අංශය, ආයතන අංශය යනාදී වශයෙන් සියළුම අංශ සඳහා වූ ක්‍රියාකාරකම් සහිතව පිළියෙල කර සමස්ත ප්‍රගතිය සැලසුම් අධ්‍යක්ෂ ජනරාල් හරහා අධීක්ෂණය විය යුතු බව. සමස්ථ ප්‍රගතිය කාලීනව සමාලෝචනය කරමින් ප්‍රතිකර්ම හා උපායමාර්ගික ක්‍රම මඟින් සමාලෝචිත වර්ෂය තුල සැලැසුම් තුලින් වූ ප්‍රතිලාභ, රටේ දූවා දරුවන්ට අත්කර දිය යුතු බව.
(ආ)	2024 වර්ෂය තුළ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අවසන් කිරීමට සැලසුම් කරන ලද කාර්යයන් 927ක් අතුරින් කිසිදු ප්‍රගතියක් ළගා කර නොගත් අංශ 26 කට අයත් කාර්යයන් 69 ක් පමණ වූ අතර එහි ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 9,586.29ක් වී තිබුණි.	අදාළ අංශ මඟින් වියදම් සම්බන්ධව නියාමන හා කාර්යසාධන සමාලෝචන අංශය වෙත ලබාදෙන ලද මූල්‍ය හා ප්‍රගති වාර්තාවන්හි තොරතුරු එම ආකාරයෙන්ම ප්‍රගති වාර්තාවට ඇතුලත් කරන ලදී.අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට අපොහොසත්ව තිබුණු අංශ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී දැනුවත් කරන ලද බව.	-එම-
(ඇ)	නිපුණතා අංශයේ ප්‍රධානතම අරමුණක් වූ වෘත්තීය රැකියා ක්ෂේත්‍රයට යොමුවීම සම්බන්ධයෙන් කරන ලද ඇගයීමේදී මෙම අංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන හා ව්‍යාවස්ථාපිත ආයතන 20 න් වෘත්තීය පුහුණුව අවසන් කළ පුහුණුලාභීන්ගේ රැකියාගතවීම් සම්බන්ධව පසුවිපරම් වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණු අතර පුහුණුලාභීන් රැකියාගතවීම් පිළිබඳ දත්ත පද්ධතියක්ද ස්ථාපිත කර නොතිබුණි. ඒ අනුව ඊට අදාල කාර්යක්ෂමතාව ඇගයීමට නොහැකි විය.	“Career One” TVET Career Platform මේ වන විට විවෘත කර ඇති අතර එහිදී NVQ සහතිකලාභීන් හට රැකියාගත වීමට අවශ්‍ය තොරතුරු සහ පහසුකම් සැපයීමද සිදුවේ. තවද, TVEC ආයතනය මඟින් දැනට පවත්වාගෙන යනු ලබන NVQ පද්ධතියේ NVQ සහතිකපත්‍රලාභීන්ගේ රැකියාගත වීම පිළිබඳ තොරතුරු ඔවුන් පාඨමාලාව හැදෑරූ ආයතනය මඟින් ඇතුළත් කළ හැකි වන ආකාරයට වැඩිදියුණු කර ඇති බව.	වැඩිදියුණු කරන ලද දත්ත පද්ධතිය මනාව යාවත්කාලීන වන පරිදි උපයෝජනය කිරීමේ වැඩපිළිවෙලක් සහිතව ප්‍රගතිය සමාලෝචනය කරමින්, ප්‍රශස්ථ හා නිවැරදි තීරණ ගැනීම හා වැඩිදියුණු කිරීම් මත වෘත්තීය පුහුණුලාභීන් නිවැරදි සේවා ස්ථානවලට යොදවමින් ජාතික හා ජාත්‍යන්තරයට ගෙන ගොස් විදේශ විනිමය ඉපයීමට හැකි පරිදි වෘත්තීය අධ්‍යාපනය වැඩිදියුණු කල යුතු බව හා ඒ අනුව දත්ත

			පවත්වා ගැනීමද කල යුතු බව.
(ඇ)	නිපුණතා අංශය විසින් පුහුණුලාභීන් විදෙස් ශ්‍රම වෙළඳපොලේ රැකියාගත කිරීම සඳහා ඉංග්‍රීසි භාෂා නිපුණත්වය හා ක්ෂේත්‍රයට අදාලව එක් අවුරුද්දක පළපුරුද්ද අත්‍යාවශ්‍ය සුදුසුකම් ලෙස ආරම්භයේ සිටම හඳුනාගෙන තිබුණද මේ දක්වාම එම අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් අයුරින් කටයුතු නොකිරීම තුලින් විදේශීය රැකියා වෙළඳපොලේ පවතින ඉල්ලුමට සරිලන සැපයුමක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි.	කර්මාන්තගත නැඹුරුවක් සහිත ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයට එක් කිරීමට දේශන හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදුකිරීමේදී workshop English යෙදුම් හැකි සෑම විටම භාවිතා කිරීමට වෘත්තීය පුහුණු ආයතන වෙත උපදෙස් ලබා දී ඇති බව.	ජාතික හා ජාත්‍යන්තරයට ගෙන ගොස් විදේශ විනිමය ඉපයීමට හැකි පරිදි වෘත්තීය අධ්‍යාපනය වැඩිදියුණු කල යුතු බව හා පුහුණුලාභීන්ට ඉංග්‍රීසි භාෂා නිපුණත්වය හා ක්ෂේත්‍රයේ පළපුරුද්ද නියමිත පරිදි ලබාදීම.

4.4 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශයේ ශාඛා 49 ක් අතරින් ශාඛා 25 කට අයත් කාර්යයන් 66 ක ප්‍රගතිය සියයට 1 සිට 50 දක්වා පරාසයක පැවති අතර ප්‍රගති වාර්තාව අනුව ලඟාකර නොගත් කාර්යයන්හි ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 2,750ක් වී තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	අමාත්‍යාංශයේ යාවත්කාලීන කරන ලද සංවිධාන ව්‍යුහය අනුමත හා සත්‍ය කාර්ය මණ්ඩලය පදනම්ව අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුලදී දැක්ම, මෙහෙවර, අරමුණු කරා ළඟාවීමට ඒ ඒ අංශ, ශාඛා, නිලධාරී මට්ටමින් ඉටුකල යුතු ක්‍රියාකාරකම් හඳුනාගෙන ඒවා නිශ්චිත කාලරාමුවක් තුල ඉටු කර ගැනීමට හැකි පරිදි සැලැසුම් කල යුතු බව හා අමාත්‍යාංශයේ ගිණුම් අංශය, ආයතන අංශය යනාදී වශයෙන් සියළුම අංශ සඳහා වූ ක්‍රියාකාරකම් සහිතව පිළියෙල කර සමස්ත ප්‍රගතිය සැලසුම් අධ්‍යක්ෂ ජනරාල් හරහා අධීක්ෂණය විය යුතු බව. සමස්ථ ප්‍රගතිය කාලීනව සමාලෝචනය කරමින් ප්‍රතිකර්ම හා උපායමාර්ගික ක්‍රම මඟින් සමාලෝචිත වර්ෂය තුල සැලැසුම් තුලින්

			වූ ප්‍රතිලාභ, රටේ දූවා දරුවන්ට අත්කර දිය යුතු බව.
(ආ)	2020 අගෝස්තු 20 දින අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවා 2021 හා 2022 යන වර්ෂ තුළදී දළ වශයෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අංශය විසින් රු.මිලියන 106.27ක් ද 2020 සිට 2024 කාලසීමාව තුළදී ජාතික අධ්‍යාපන ආයතනය ඉදිරිපත් කළ තොරතුරු අනුව එම ආයතනය විසින් රු.මිලියන 484.34ක්ද ලෙස එකතුව රු.මිලියන 590.61 වැයකර තිබුණි. 2022 වර්ෂයේ රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී තිබුණු අතර විෂයපථයට අයත් ව තිබුණු කාර්යයන් හා කර්තව්‍යයන් එදින සිට අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පවරා තිබුණද, අමාත්‍යාංශය 2025 සැප්තැම්බර් 30 දින වනවිටත් 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම හා කාලරාමුව සකස් කරමින් පවතින බව නිරීක්ෂණය විය. මේ අනුව නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම, සැලසුම් කර වර්ෂ 05ක ප්‍රමාදයක් තිබියදීත්, සියළු වියහැකි අවදානම් කළමණාකරණය කරමින් රටේ දරුවන් සියළු පැතිකඩවලින් ඔසවා ජාත්‍යන්තරය හා සමගාමීව ඉදිරියට යා හැකි පරිදි සකස් කල නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මාර්ග සිතියමක් (Road Map) අනුමත කර ගනිමින් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙල විධිමත්ව ක්‍රියාත්මක වන බව විගණනයට හඳුනාගත නොහැකි විය.	අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය අධ්‍යාපන පද්ධතිය තුළ මෙතෙක් දියත් කර නොමැති බවට වන කරුණු සම්බන්ධව එකඟ වෙමි.2026 වර්ෂයේ දී පාසල්වල 1 සහ 6 ශ්‍රේණි සඳහා විෂයමාලා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය භෞතික හා මානව සම්පත් සම්පාදනය හා සූදානම් කරවීම සිදු කෙරෙමින් පැවතීම, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සාර්ථක වීමට අත්‍යවශ්‍ය ප්‍රධාන කුලුණු (Pillars) හඳුනාගනිමින්, ඒ ඔස්සේ අවශ්‍ය කාර්යයන් සිදුකිරීම හා සැලසුම් සකස් කිරීම, වගකිව යුතු පාර්ශ්වයන් විසින් සිදු කරනු ලබන අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචනය, විවිධ කමිටු/මණ්ඩල හරහා නිර්දේශ/තීරණ අනුමැතීන් සම්පාදනය මේ වන විට සිදු වන බව.	සියළු වියහැකි අවදානම් කළමණාකරණය කරමින් රටේ දරුවන් සියළු පැතිකඩවලින් ඔසවා ජාත්‍යන්තරය හා සමගාමීව ඉදිරියට යා හැකි පරිදි සකස් කල නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ මාර්ග සිතියමක් (Road Map) අනුමත කර ගනිමින් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන සැලසුම් හා කාලරාමුවක් අනුව, ඊට අදාල වියදම් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහනක් අනුමත කරගනිමින් ඒ අනුව අරමුණුගතව, අරපිරිමැසුම්දායකව හා ආර්ථිකබව සහිතව යොදවමින් දැයේ දූවා දරුවන්ගේ සම අධ්‍යාපන අයිතිය තහවුරු කිරීමට අධ්‍යාපන ලේකම්වරයා ඇතුළු සියලු වගකිව යුතු නිලධාරීන් හා ඊට සම්බන්ධ ආයතන ප්‍රධානීන් ඇතුළු නිලධාරීන් කටයුතු කල යුතු බව.
(ඇ)	අධ්‍යාපන අමාත්‍යාංශය තුල 2025 මාර්තු 31 දින වන විට නොවිසඳී ඇති විනය විමර්ශන සංඛ්‍යාව 39ක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට අධ්‍යාපන	නොවිසඳී ඇති විනය විමර්ශන තිබීම සම්බන්ධයෙන් එකග වන බව.	නොවිසඳී ඇති විනය විමර්ශන කඩිනමින් අවසන් කිරීම තුලින් පාසල් පද්ධතියේ ළමුන්ගේ ජීවිත අනාරක්ෂිත තත්ත්වයට

	අමාත්‍යාංශය අපොහොසත් වීම තුලින් ඇති වූ ප්‍රතිවිපාක පාසල් පද්ධතියේ ළමුන්ගේ ජීවිත අනාරක්ෂිත තත්ත්වයට පත්වීම දක්වාම පැතිර යාමත් සහ නිසිකලට විනය ක්‍රියාමාර්ග ගැනීමෙන් සිදුවන විෂමාචාර වළක්වා ගැනීම පිළිබඳවත් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.		පත්වීම වලක්වා ගැනීමට කටයුතු කල යුතු වීම.
(ඇ)	තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා වෙබ් අඩවි වාර්තා අනුව 2025 මාර්තු වන විට තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි පුහුණු ආයතන 3,916 ක් අතරින් ආයතන 1,722 ක් පමණක් ක්‍රියාකාරී මට්ටමේ පැවතුණි. ආයතන 1,304 ක ලියාපදිංචි කාලය ඉකුත් වී තිබුණු අතර ආයතන 844 ක් වසා දමා තිබුණි. එමෙන්ම 2024 වර්ෂයේ තුලදී එසේ ලියාපදිංචි කාලය ඉකුත් වූ ආයතන අතුරින් ආයතන 601 ක් පමණක් නැවත ලියාපදිංචිය අලුත් කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුල කොමිෂන් සභාව විසින් ජාතික නිපුණතා සම්මත සහ පාඨමාලා 50 ක් අලුතින් සංවර්ධනය කිරීමට හා 30 ක් යාවත්කාලීන කිරීමට ඉලක්කගත කර තිබුණද ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කිරීම් 26 ක් හා යාවත්කාලීන කිරීම් 22 ක් පමණක් සිදුකර තිබුණු අතර 2025 මාර්තු මස වන විට තව දුරටත් නිපුණතා සම්මත 100 ක් යාවත්කාලීන නොකර ඉතිරිව පැවති තිබුණු අතර මේ පිළිබඳව නිපුණතා අංශයේ අවධානය යොමු වී නොතිබුණි.	ලියාපදිංචි කාලය ඉකුත් වී ඇති ආයතන ලියාපදිංචිය අළුත් කිරීමට ඉල්ලුම් කළ යුතුය. එලෙස ඉල්ලුම් කරන ලද ආයතන ලියාපදිංචිය අළුත් කිරීමට කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ඇත. 2024 වර්ෂයේදී මෙම කාර්යය සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලෙස රු.මිලියන 05 ක් ලැබී තිබුණි. එක් සම්මතයක් සකස් කිරීමට හෝ යාවත්කාලීන කිරීමට රු.ලක්ෂ 08 ක් වත් අවම වශයෙන් වැය වේ. ඒ අනුව එම ප්‍රතිපාදන වලින් කිරීමට හැකි උපරිම සම්මත ප්‍රමාණය එම වර්ෂයේදී අවසන් කරන ලද බව.	අඛණ්ඩවම මුහුණ දෙමින් පවතින අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය ස්ථිරසාර හා නම්‍යශීලී කෙටිකාලීන, මධ්‍යකාලීන හා දීර්ඝකාලීන උපසැලසුම් හා කාලරාමු සහිත දීර්ඝකාලීන සැලැස්මක් සකස් කර, ප්‍රගතිය කාලීනව සමාලෝචනය කරමින් නිපුණතාවයෙන් සපිරි පර්යේෂණශීලී පුද්ගලයන් බිහිකර, ජාතික හා ජාත්‍යන්තර තලය දක්වා ගෙන ගොස් නිමවුමට ඔබ්බෙන් (Output) වූ තිරසර ප්‍රතිඵල (Sustainable Outcome) මට්ටමක් දක්වා ගෙන යා හැකි සමාජයක් බිහි කිරීම සඳහා අමාත්‍යාංශයේ වගකිව යුතු නිලධාරින් වගබලාගත යුතු බව.
(ඉ)	කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ තාක්ෂණික පුහුණු කටයුතු වැඩිදියුණු කිරීම පිළිබඳ ඔස්ට්‍රියානු ව්‍යාපෘතිය යටතේ නව ගොඩනැගිලි 2 ක හා නවීකරණය කළ ගොඩනැගිලි 3ක රු.මිලියන 428.07 ක් වූ වැඩ 2021 වර්ෂය තුළදී අවසන් කර තිබුණු නමුත් එම ගොඩනැගිලි	මෙම ව්‍යාපෘතිය මගින් ලබා දුන් GRN නිකුත් කල වත්කම් ගිණුම් ගත කිරීමටත් ගොඩනැගිලි වටිනාකම් සම්බන්ධ ලබා දුන් විස්තර අනුව NAITA ආයතනයේ ගිණුම් සකස් කිරීමේදි අදාල වටිනාකම් ගිණුම් ගත කර ඇති බව.	මේ සම්බන්ධව සුදුසුකම් ලැබූ පුද්ගලයින්ගෙන් සමන්විත කමිටුවක් මගින් විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතු බව.

	සම්බන්ධයෙන් 2021,2022 වර්ෂවලදී ලබාගත් රජයේ තක්සේරු වටිනාකම රු. මිලියන 130 ක් වීම හේතුවෙන් අවුරුදු 1 ½ වැනි කෙටි කාලසීමාවක් තුළ රජයේ තක්සේරු වටිනාකම රු. මිලියන 298.07 කින් අඩුවී තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද ඉදිකිරීම් හා නවීකරණය කිරීම් කටයුතු ආර්ථිකභාවයකින් සිදු වී නොතිබුණි.		
(ඊ)	ඉහත ව්‍යාපෘතිය යටතේ කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය මඟින් එතෙක් ලැබී නොතිබුණු පුහුණු උපකරණ ලැබීමට යටත්ව ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමේ ලිපිය නිකුත් කර තිබුණද 2025 මාර්තු 12 දින දක්වාම වටිනාකම රු.මිලියන 13.73 ක් වූ පුහුණු උපකරණ කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය වෙත ලැබී නොතිබුණු බව නිරීක්ෂණය විය. රු.මිලියන 13.73 ක් වූ මෙම උපකරණ වටිනාකමද ව්‍යාපෘති වටිනාකමට ඇතුලත් කර තිබුණු නමුත් වසර 03 ක් ඉක්ම ගියද උපකරණ ලබා ගැනීම සම්බන්ධයෙන් මෙම අංශය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	එකඟවේ. මෙම ව්‍යාපෘතිය Unsolicited Proposal ලෙස ආරම්භ වුවක් බව.	මේ සම්බන්ධව සුදුසුකම් ලත් කමිටුවක් මඟින් සිදුව ඇති තත්ත්වයන් පරීක්ෂා කර උපකරණ ආධාරය ලබාගැනීමට කටයුතු කළ යුතු බව.
(උ)	2024 වර්ෂයේ අපේක්ෂිත පරිදි නිපුණතා අංශය යටතේ ඇති වෘත්තීය පුහුණු ආයතන සඳහා සිසුන් බඳවාගැනීම් පෙර වර්ෂයට සාපේක්ෂව සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී තිබුණි. එනම් 2023 වර්ෂයේ 120,255 ක් හා සමාලෝචිත වර්ෂයේ එය 105,258 ක් වී තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	නිපුණතා අංශය යටතේ ස්ථාපිත වෘත්තීය පුහුණු ආයතනවල පවතින පාඨමාලා රැකියා වෙළඳපොලේ අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි කාලීනව සංශෝධනය කර එම පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ උපරිම ධාරිතාවය අනුව වාර්ෂිකව බඳවාගත හැකි ශිෂ්‍ය සංඛ්‍යාව හඳුනාගෙන, ඒ අනුව වාර්ෂිකව බඳවාගැනීම් සිදුකරන පරිදි විධිමත් යාන්ත්‍රණයක් හඳුන්වා දී වෘත්තීය ආයතන ස්ථාපිත කිරීමේ අරමුණු ඉටු කර ගත යුතු බව.

(ඌ)	2024 වර්ෂයට අදාලව වෘත්තීය අධ්‍යාපන අංශය යටතේ ඇති ආයතන 13 ක් වෙනුවෙන් ව්‍යාපෘති 496 ක් සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණද ව්‍යාපෘති 368 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. සම්පූර්ණ නොකරන ලද ව්‍යාපෘති 128 ද සැලසුම් අදියරේ සිට සම්පූර්ණ කිරීම දක්වාම වූ විවිධ අදියරවල පැවතී තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	-එම-
(එ)	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 474 ක් සඳහා නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන් 317 දෙනෙක්ද දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා එම නිලධාරීන් 58 දෙනෙක්ද අනුයුක්ත කර තිබුණි. නමුත් එම නිලධාරීන්ගේ 2023 වර්ෂයේ කාර්යසාධනය සම්බන්ධ පරීක්ෂාවේදී, එම නිලධාරීන්ට පවරා තිබුණු ප්‍රධාන කාර්යයන් 22 න් 18 කට අදාලව වර්ෂයේ ප්‍රගතිය සියයට 0 සිට සියයට 35 දක්වා වූ පහළ අගයක් වී තිබුණු අතර 2024 කාර්යසාධනය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.	2024 වර්ෂයේ අපොස උ / පෙළ නිමකල සිසුන් ඉලක්ක කරගත් වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහනක් දිවයිනේ පාසැල් 215ක දීප ව්‍යාප්තව පැවැත්වුණු අතර (මාර්තු සිට මැයි දක්වා) මේ සඳහා සිසුන් 7,355 ක් වෙත සහතිකපත් නිකුත් කර ඇති අතර මේ සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය පමණක් නොව තොරතුරු තාක්ෂණය සහ ඉංග්‍රීසි භාෂාව පිළබඳව පුහුණුවක් ක්ෂේත්‍ර වැඩසටහන් ආදී වැඩසටහන් මෙම නිලධරීන් විසින් පවත්වනු ලබන බව.	නිපුණතා සංවර්ධන නිලධාරීන්ගේ නිශ්චිත ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර කාලීනව සමාලෝචනය කරමින් කාර්යසාධනය යාවත්කාලීනව ඇගයීමට ලක් කර නියමිත කාර්යසාධනය ළඟාකර ගතයුතු වීම.
(ඒ)	ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක උපණය (SEPI) යටතේ 2016 වර්ෂයේ සිට 2027 වර්ෂය දක්වා රු.මිලියන 950 ක් ණය ලබාදීම ඉලක්ක කරගෙන තිබුණු අතර 2024 වර්ෂය අවසන් වන විට ප්‍රතිලාභීන් 1,193 දෙනෙකු සඳහා රු.මිලියන 571 ක් පමණක් ලබාදී තිබුණි. 2024 වර්ෂය සඳහා ලබාගෙන තිබුණු අයවැයගත ප්‍රතිපාදන ප්‍රමාණවත් වී නොමැති බව නිරීක්ෂණය වූ අතර ප්‍රතිපාදන රු.මිලියන 70 ක් ප්‍රතිලාභීන් 82 ක් සඳහා පමණක් ප්‍රමාණවත් වී තිබුණු අතර 2024 වර්ෂයේ මැයි මස අග වනවිට ලබාදී අවසන්ව තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය තුල ණය නිකුත් කිරීමේදී සියළුම දිස්ත්‍රික් ආවරණය වන පරිදි ව්‍යවසායකයින් ඉලක්ක කරගත යුතු වුවත් මන්නාරම, නුවරඑළිය, යාපනය සහ හම්බන්තොට ප්‍රදේශවල ණය ලබාදීම් සිදුවී නොතිබුණි.	2024 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් සෙපි ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදීම සඳහා රු.මිලියන 100 ක් ඉල්ලුම් කලද 2024 අයවැය මඟින් රු.මිලියන 70 ක් පමණක් අනුමත වූ අතර එම මුදල ප්‍රතිලාභීන් 82 වෙත 2024 මැයි මස වන විට ලබා දී අවසන් වූ බැවින් තවදුරටත් 2024 වර්ෂය සඳහා ප්‍රතිලාභීන් ලියාපදිංචි කිරීම නතර කිරීමට මහ බැංකුව වෙත උපදෙස් ලබාදෙන ලදී. එබැවින් සමහර දිස්ත්‍රික්කවල ණය ඉල්ලුම්කරුවන් හට එම වර්ෂයේදී ණය ලබාදීමට නොහැකි වී ඇති බව.	මෙම ණය යෝජනා ක්‍රමයෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටුවන සේ ණයලාභීන් ප්‍රමාණය වැඩි කර ගැනීමට නිවැරදි තොරතුරු මත පදනම්ව ඇස්තමේන්තු සකස් කර ප්‍රතිපාදන අනුමත කර ගැනීමට හා ඒ පිළිබදව ප්‍රමාණවත් අවධානයක් යොමු කර අරමුණු ළගා කර ගත යුතු බව.

(ඔ)	රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් 12 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම.		
	කරාපිටිය වෛද්‍ය පීඨය සඳහා ඇතුළත් කරන සිසුන් සංඛ්‍යාව ඉහළදැමීම හා පර්යේෂණ ධාරිතාවය (Research Capabilities) වර්ධනය කිරීමේ අරමුණින් මහල් 12 කින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2020 ජුනි 01 දින මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශන කාර්යංශය වෙත පවරා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ නිමකර 2021 සැප්තැම්බර් 06 දින වන විට විශ්වවිද්‍යාලය වෙත පවරාදිය යුතු වුවත් ගිණුම් වර්ෂය අවසාන දින වන විට අවස්ථා 06කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. කෙසේ නමුත් මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 60කට වඩා අඩු මට්ටමක පැවතුණි.	මෙම ව්‍යාපෘතිය ප්‍රථමයෙන් පවරන ලද එම ආයතනයේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2017 නොවැම්බර් 13 දින කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කිරීමට කටයුතු කර ඇත. පසුව අතරමග නවතන ලද ඉදිකිරීම් කටයුතු 2020 ජුනි 02 දින Central Engineering Consultancy Bureau ආයතනයට පවරන ලදී. නමුත් 2021 සහ 2022 වර්ෂවල රටේ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් ඉදිකිරීම් කාර්යයන් සිදු කිරීමට අවහිරතා සහ ගොඩනැගිලි අමුද්‍රව්‍ය හිඟය හේතුවෙන් ඉදිකිරීම් කාර්යයන් ප්‍රමාදවීම් සිදුවිය. ඒ හේතුවෙන් වරින් වර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට සිදු වී ඇත. මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂයෙන් පසුව 2024 වර්ෂයේ සිට අවශ්‍ය අධීක්ෂණ කාර්යයන්වලින් පසුව නිසි පරිදි ඉටුකිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව.	ව්‍යාපෘතියේ අරමුණුවලට ලගාවිය හැකි පරිදි නියමිත නියාමනය හා අධීක්ෂණය සිදුකර ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට අදාල නිලධාරීන් වග බලා ගත යුතු වීම.
(ඕ)	කරාපිටිය රෝහලේ මහාචාර්ය ඒකකයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය.		
	2018 අයවැය යෝජනාවක් මත වෛද්‍ය උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව 300 කින් වැඩි කිරීම, ජාතික සෞඛ්‍ය සේවා, වෛද්‍ය හා හෙද වෘත්තිය වැඩිදියුණු කිරීම, පශ්චාත් වෛද්‍ය උපාධි අභ්‍යාසලාභීන් බඳවාගැනීම වැඩිදියුණු කිරීම, සායනික පුහුණුව පිළිබඳ ඉගැන්වීමේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම යන ඉලක්ක ළඟාකර ගැනීමේ අරමුණ මත 2019 ජුනි 24 දින රු.මිලියන 1,138.5ක වටිනාකමකට මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම වෙත මෙම ඒකකය පිහිටුවීමේ ව්‍යාපෘතිය පිරිනමා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2022 ජුනි 16 දින වැඩ නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. අවස්ථා	2025 වර්ෂයේ ජුනි 13 දක්වා සාධාරණ හේතු සාධක මත කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර දී තිබුණි. මේ වන විට ව්‍යාපෘතිය සියයට 87 ක ප්‍රගතියක් ලබා දී ඇති අතර තවත් මාස 06ක් වැනි කෙටි කාලයක් තුළ ව්‍යාපෘතිය නිම කිරීමේ හැකියාව පවතින බව වාර්තා වේ. මිල ගණන්වල උච්චාවචනයන් හේතුවෙන් රු.මිලියන 427ක ප්‍රේරිත පිරිවැය (Induced Cost) සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් පිළියෙල කිරීමට උපදෙස් ලැබී ඇති අතර, එම අනුමැතිය ඉතා ඉක්මනින් ලබා ගැනීමේ හැකියාව මත ව්‍යාපෘතියේ ඉදිරි ප්‍රගතිය රඳා පවතින බව.	-එම-

	කිහිපයකදී මෙම ව්‍යාපෘතිය සඳහා දින දීර්ඝ කිරීම් ලබාගෙන තිබුණු අතර 2025 ජූනි මස 13 වන දින දක්වා දින දීර්ඝ කර තිබුණි. 2025 මැයි මස වන විටත් මෙම ව්‍යාපෘතියේ යාන්ත්‍රික, විදුලි හා වායු සමීකරණ පද්ධතිය ස්ථාපිත කිරීම පිළිබඳ ගැටලු පැවති අතර ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 87 ක් විය.		
(ක)	ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය.		
	ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල (KFAED) සමඟ 2016 මාර්තු 24 දින අත්සන් තබන ලද අංක 940 දරන ණය ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන අතර එමඟින් කුවේට් ඩිනාර් මිලියන 10ක ණය මුදලක් මෙම ව්‍යාපෘතිය සඳහා ලබාදීමට එකඟ වී තිබුණි. පීඨ ගොඩනැඟිලි සංකීර්ණය ඉදිකිරීම අවසන් කර තිබුණද ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොන්ත්‍රාත්තුව අක්‍රීය වී එහි භෞතික ප්‍රගතිය සියයට 10 මට්ටමේ පැවතිණි. ව්‍යාපෘතිය තුළින් මිලදීගත යුතු ඉගෙනුම් උපකරණ මිලදීගැනීමේ ප්‍රගතිය සියයට 40 මට්ටමේ පැවති අතර 2022 ජූනි 08 වන දින සිට ණය මුදල ලබාදීම අත්හිටුවා තිබුණු බැවින් ව්‍යාපෘති කටයුතු තාවකාලිකව නතර කර තිබුණි.	මෙම ව්‍යාපෘතිය අවසන් අදියරේ පැවතීමත් කුවේට් ඩිනාර් මිලියන 6.5 ක් වියදම් කරමින් ඉටුකළ ව්‍යාපෘතියේ ප්‍රතිඵල වෛද්‍ය සිසුන්ට නොපමාව ලබාදෙන ලෙස විශ්වවිද්‍යාලය මඟින් සිදුකළ ඉල්ලීම අනුව 2025 ජනවාරි 06 දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ව්‍යාපෘතිය දේශීය අරමුදල් (GOSL) මඟින් ක්‍රියාත්මක කිරීමටත් ණය ගිවිසුම සක්‍රීයවීමෙන් පසුව එම වියදම් කළ මුදල් නැවත ප්‍රතිපූරණය කරන ලෙසත් ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නැවත මෙම ව්‍යාපෘතිය 2025 පෙබරවාරි 10 දින සිට ක්‍රියාත්මක වෙමින් පවතින බව.	-එම-

4.5 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	උසස් පෙළ සිසුන් අධ්‍යයන වර්ෂ දෙක පුරාම පාසැල් අධ්‍යාපනයට නැඹුරු කරවීමට අපොහොසත් වීම.		
(අ)	වසර ගණනාවක සිට උසස්පෙළ සිසුන්ගේ පාසල් පැමිණීමේ ප්‍රතිශතය අවම මට්ටමක පැවතියද සමාලෝචිත වර්ෂය වන විටද මෙම ගැටළුව විසඳීමට අධ්‍යාපන අමාත්‍යාංශයට නොහැකි වී තිබුණු අතර 2016 න් පසු උසස් පෙළ පාසල් සිසුන් පාසල් නොපැමිණීම සම්බන්ධයෙන් පර්යේෂණයන් සිදු කර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් 2006 ඔක්තෝබර් 06 දිනැති අංක 2006/45 දරණ චක්‍රලේඛය නිකුත් කිරීම හා වරින් වර නිකුත් කරන ලද උපදෙස් ලිපි මඟින් පාසල්වල විදුහල්පතිවරුන් දැනුවත් කර ඇති බව.	අදාළ පාර්ශවයන් සම්බන්ධ කරමින් පාසල තුළින් සිසුන් ආකර්ශනය කරගත හැකි මට්ටමේ ඵලදායිව අධ්‍යාපනය ලබාදීමේ මෙහෙයුම් වැඩපිළිවෙලක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරවීමට කටයුතු කල යුතු බව.
	රජයේ නොවන පාසල් නියාමනයට වැඩපිළිවෙලක් හඳුන්වා දී නොතිබීම		
(අ)	2022 මාර්තු 02 දිනැති "රජයේ නොවන පාසල් සම්බන්ධයෙන් වන නියාමන ක්‍රියාවලිය" මැයෙන් වූ කාර්යසාධන විගණනයට අදාලව නිර්දේශ 18ක් ලබා දී වර්ෂ 03කට අධික කාලයක් ගත වී ඇතත් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග 2025 අප්‍රේල් 30 වන විටත් ගෙන නොතිබුණි. ජාත්‍යාන්තර සහ පෞද්ගලික පාසල් නියාමනය කිරීම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් ලෙස සඳහන් කර තිබුණද ජාත්‍යාන්තර පාසල් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ හා සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති බැවින් අධ්‍යාපන අමාත්‍යාංශයේ නියාමනයට යටත් නොවන බව 2025 ජුනි 06 වන දින කාර්යසාධන වාර්තාවට ලබාදුන් පිළිතුරෙහි දක්වා තිබුණි.	ජාත්‍යාන්තර පාසල් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ හා සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති බැවින් අධ්‍යාපන අමාත්‍යාංශයේ නියාමනයට යටත් නොවන බව	රජයේ නොවන පාසල් පරිපාලනය පිළිබඳව නිසි අධීක්ෂණයක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදු නොකිරීම තුළ අධ්‍යාපන පද්ධතියේ සිදුවන බිඳවැටීම් සඳහා ක්‍රියාමාර්ග ගැනීම සිදුකළ යුතු බව හා නියාමනය සඳහා විධිමත් වැඩපිළිවෙළක් ස්ථාපිත කළ යුතු වීම.

2024/2025 කාලසීමාවේ සිසු සුරක්ෂා රක්ෂණාවරණය සැලසීම

(අ)	සුරක්ෂා සිසු රක්ෂණය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ රු.මිලියන 2,292.7ක බදු සහිත වටිනාකමකට ගිවිසුම්ගත වී තිබුණි. 2025 මාර්තු 28 දින දක්වා මාස 09 ක කාලයට අදාලව හිමිකම් ඉල්ලීම් අයදුම්පත් 18,552 ක් ලැබී තිබුණු අතර ඉන් අයදුම්පත් 9,315 ක් සඳහා රු.මිලියන 330ක මුදලක් ප්‍රතිලාභ ලෙස ගෙවා තිබුණි. එම ගෙවීම 2024 / 2025 වර්ෂයට අදාලව වාරික මුදල වන රු.මිලියන 1,777.79 ක මුදලින් සියයට 19ක පමණ අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි.	හිමිකම් අයදුම්පත් ඉදිරිපත් වීම අඩු වීම කෙරෙහි විවිධ හේතූන් බලපා ඇත. සුරක්ෂා සිසු රක්ෂණාවරණය වැඩසටහන 2022 දෙසැම්බර් 02 දින සිට 2024 ජුනි 30 දින දක්වා වූ කාලසීමාව තුළ ක්‍රියාත්මකව නොවීම. අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ජනතාව තුළ මෙම වැඩසටහන පිළිබඳව විශ්වාසයක් නොමැති වීම. රාජ්‍ය සේවකයන්, පෞද්ගලික අංශයේ සේවකයින්, ත්‍රිවිධ හමුදාව සහ පොලිසියේ නිලධාරීන් සඳහා ප්‍රතිලාභ ලබා ගත හැකි විවිධ රක්ෂණ ක්‍රම පැවතීම.	සිසු අයදුම්පත් ඉදිරිපත් කිරීම්, ගෙවීම, ප්‍රතික්ෂේප වීම්, අභියාචන ඉදිරිපත් කිරීම යනාදී වශයෙන් වූ ප්‍රමාණවත් දත්ත සහිත තොරතුරු පද්ධතියක් අමාත්‍යාංශය විසින් පවත්වාගත යුතු බවත්, දැනට පවතින ක්‍රමවේදය නැවත සමාලෝචනය කර රක්ෂණාවරණය සැලසිය යුතු සිසුන් පිළිබඳව ප්‍රතිපත්තියකට එළඹීමත් සිදු කල යුතු බව.
(ආ)	ගිවිසුම් ප්‍රකාරව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ශ්‍රව්‍ය දෘෂ්‍ය හා වෙනත් මාධ්‍ය භාවිත කරමින් සුරක්ෂා සිසු රක්ෂණය පිළිබඳව ප්‍රචාරණ කටයුතු සිදු කළ යුතුව ඇති අතර ඒ වෙනුවෙන් 2024/2025 වර්ෂයට අදාලව රු.මිලියන 60ක මුදලක් රක්ෂණ සංස්ථාවට ගෙවා තිබුණි. රක්ෂණය වලංගු දින සිට මාස 02ක් ඇතුලත ප්‍රචාරණය සඳහා දුන් මුදලින් සියයට 50 ක මුදලක් ගිවිසුම් ප්‍රකාරව වියදම් කල යුතු වුවත් රු.මිලියන 1.83ක වියදමක් පමණක් රක්ෂණ සංස්ථාව ප්‍රචාරණය වෙනුවෙන් වැය කර තිබුණු අතර මේ හේතුවෙන් සිසුන්ගේ හිමිකම් ඉල්ලුම් කිරීම ඉතා අවම මට්ටමක් ගෙන තිබුණි.	මෙම වැඩසටහන පිළිබඳව පාසල් ප්‍රජාව ඇතුලු අනෙකුත් සියලුම පාර්ශවයන් දැනුවත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රචාරණ කටයුතු නිසි පරිදි ඉටු කර ඇති බව.	-එම-

2018-2020 කාලසීමාවේ සිසු සුරක්ෂා රක්ෂණාවරණය සැලසීම

(අ)	සිසු සුරක්ෂා රක්ෂණාවරණය සලසන ලද 2021/2022 කාලපරිච්ඡේදයට අදාළව ගිවිසුම්ගත පරිදි හිමිකම් සඳහා ප්‍රතිලාභ ගෙවන බවට වගබලා ගැනීමට අවශ්‍ය කටයුතු කිරිම වගකිව යුතු	2024 ජූලි 15ට පෙර රක්ෂිතයින් වෙත ගෙවීමට නොහැකි වූ ඉතිරි හිමිකම් ප්‍රතිලාභ මුදල වන රු.මිලියන 67,794,566 ක හිමිකම් මුදල රක්ෂිතයන් වෙත ගෙවා නිම කල පසු එම හිමිකම් මුදල නැවත	ගිවිසුම්ගත පරිදි හිමිකම් සඳහා ප්‍රතිලාභ ගෙවන බවට වගබලා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

	නිලධාරීන් ඇතුළු ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදුකල යුතු වුවත් ප්‍රමාණවත් අවධානයකින් යුතුව කටයුතු කර නොතිබීම මත එම කාලපරිච්ඡේදයට අදාළව සිසුන්ට නොගෙවන ලද රක්ෂණ හිමිකම් ඉල්ලුම් පත්‍ර 8000 ක් වෙනුවෙන් රු. මිලියන 67.8 ක් වටිනා හිමිකම් ප්‍රතිලාභ නෙගෙවා අතැතිව පැවතුණි.	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ජෙනරල් කෝපරේෂන් ලිමිටඩ් ආයතනය වෙත ප්‍රතිපූර්ණය කර ගැනීම ඇති හැකියාව පිළිබඳව විමසා ඇත. මෙම මුදල ප්‍රතිපූරණය කිරීම සම්බන්ධ නිර්දේශ ලබා ගැනීමට කමිටුවත් පත් කර ඇති අතර එම නිර්දේශ ලැබීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	

4.6 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 ජනවාරි 04 දිනැති අංක 2209/14 දරන ගැසට්පත්‍රයේ සුවිශේෂී ප්‍රමුඛතා යටතේ හඳුනාගන්නා ලද නගර විශ්වවිද්‍යාල 05 ක් ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් 2021, 2022 සහ 2023 වර්ෂයන්හි පිළිවෙලින් රු.මිලියන 100ක් රු.මිලියන 200 ක් සහ රු.මිලියන 200 ක් නිපුණතා අංශය මඟින් වෙන්කර තිබුණි. 2022 වර්ෂයේ කෑගල්ල ප්‍රදේශයේ ගොඩනැගිලි සංකීර්ණයක් තෝරාගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් ජලබිල්, විදුලි බිල්, ආරක්ෂක වියදම් සඳහා රු.මිලියන 16.74 ක් හා 2023 වර්ෂයේදී ඉහත වියදම් වෙනුවෙන් රු.මිලියන 1.2ක් දරා තිබුණි. වර්තමානය වනවිටත් ව්‍යාපෘතිය නිමකිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.	වර්තමානය වන විට අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වෙත මෙම ගොඩනැගිල්ල ලබාදීමටද උත්සහ දරා ඇති අතර ඉන් පසු 2025 ජනවාරි 10 වන දින පැවති පුරවර විශ්ව විද්‍යාල ගොඩනැගිල්ල නිරීක්ෂණ චාරිකාවෙන් පසුව වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය මඟින් වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ, විශ්ව විද්‍යාල විද්‍යායතනයක් බවට මෙම පුරවර විශ්ව විද්‍යාල ගොඩනැගිල්ල පත් කර ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර 2025 පෙබරවාරි 20 වන දින ලිපියක් මඟින් දන්වා ඇති අතර ඒ සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	අරමුණුගතව පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කල යුතු වීම.
(ආ)	2016 පෙබරවාරි 11 දිනැති අංක අමප/16/0167/716/008 දරන කැබිනට් පත්‍රිකාවෙන් ජාතික විද්‍යා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට ලබාදී තිබුණු අනුමැතිය මත අවශ්‍ය ඉඩම් කොටස පවරාගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත නිපුණතා අංශය විසින් රු.මිලියන 280 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එහි අයිතිය අමාත්‍යාංශයේ වෘත්තීය අධ්‍යාපන අංශය වෙත පවරා	මෙම ඉඩම විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට පවරාගැනීම වෙනුවෙන් රු.මි 280ක් ගෙවා ඇත. නමුත් ඉඩම් කොටස්වලට අදාලව රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාව මේ වන තෙක් ලැබී නොමැති වීම, ඉඩම් අත්කර ගැනීමට අදාල වන්දි ගෙවීම් අවසන් කර නොමැති වීම සහ ඉඩම් අත්කර ගැනීමේ කටයුතු මේ වනවිටත් සිදුවෙමින් පවතින බැවින් එම කටයුතු අවසන් වූ පසු	ඉලක්ක අරමුණු කරගනිමින් ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීම, ඉඩම් නිරවුල් කර ගැනීමෙන් පසුව සිදුකෙරෙන පරිදි ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු වීම.

ගැනීමට කටයුතු කර නොතිබුණි. 2022 වර්ෂයේද විස්තරාත්මක ඉලක්ක (Descriptive Target) යටතේ අවස්ථා 07 ක් ඉලක්ක කරමින් රු.මිලියන 60 ක් වෙන්කර තිබුණු අතර මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු මාස 24 ක් තුල නිම කිරීමට යෝජනා වී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කිසිදු ඉදිරි පියවරක් ගෙන නොතිබුණි.	අමාත්‍යාංශය වෙත ඉඩම පවරා දෙන බව දන්වා UDA විසින් 2023 ජුලි 19 දිනැතිව ලිපියක් මඟින් දැනුම් දී ඇති බව.	

4.7 කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) **ද්විතියික අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම**		
අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2014 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ක්‍රියාත්මක කිරීම සඳහා වූ විස්තීරණ යෝජනාවලියක ප්‍රතිඵලයක් ලෙස තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන (ICT Hub) ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඇ.ඩො. මිලියන 35ක ණය ආධාර යටතේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ඉදිකිරීමට අදාල වූ යෝජිත ඉඩම්, තාක්ෂණික කරුණු මත වරින් වර වෙනස් වී තිබුණු හෙයින් ව්‍යාපෘතියට අදාල ණය ගිවිසුම 2019 වර්ෂයේ අත්සන් කලද ව්‍යාපෘතිය සක්‍රීය කිරීමට නොහැකි වී තිබුණි. 2024 සැප්තැම්බර් 18 දින මෙම ව්‍යාපෘතිය නැවත සක්‍රීය කර තිබුණු අතර ව්‍යාපෘති කාලසීමාව 2026 මැයි මස 10 දින දක්වා දීර්ඝ කරගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයන් පිහිටුවීම, උපදේශන ආයතනයක් තෝරාගැනීම වැනි ව්‍යාපෘතියේ මූලික කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොමැති නිසාත් මෙම	ණය ගිවිසුම අත්සන් නොකිරීම මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකරන ලදී. අදාළ ණය ගිවිසුම 2024 සැප්තැම්බර් 18 දින අත්සන් කරන ලදී. ඉන් අනතුරුව උපදේශන ප්‍රසම්පාදන කාර්යය ආරම්භ කරන ලදී. නමුත් 2024 නොවැම්බර් මස පැවති ජනාධිපතිවරණයෙන් පසුව රජයේ නව ප්‍රතිපත්ති සමඟ අනුගත වනසේ ව්‍යාපෘතිය සංශෝධනය කිරීම සඳහා මහා පරිමාණ ව්‍යපෘති සමාලෝචනය කිරීම යටතේ මෙම ව්‍යාපෘතියද සමාලෝචනය කිරීම ආරම්භ කරන ලදී. National Level ICT Hub ව්‍යාපෘතියට අදාළව ණය ගිවිසුම සංශෝධනය සිදුකිරීම කොරියානු EXIM බැංකුව විසින් සිදුකරන ලද කාර්යයක් බැවින්ද, ශ්‍රී ලංකා රජයේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් මෙම ණය ගිවිසුමේ සංශෝධනය ප්‍රමාද වීම කොරියානු EXIM බැංකුව පාර්ශවයෙන් සිදු වූ බැවින් වරින් වර මේ සම්බන්ධයෙන් සිහි කැඳවීම සිදුකර ඇති බව.	මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට යෝජනා වී වසර 11ට අධික කාලයක් ගත වී ඇති නිසාත්, වර්තමානයේ තාක්ෂණය දියුණු තත්ත්වයක පවතින නිසාත් මෙවැනි ව්‍යාපෘතියක අවශ්‍යතාවයක් පවතීද යන්න පිළිබඳව නැවත සමාලෝචනය කර ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යායුතුද යන්න පිළිබඳ තීරණය කල යුතු වීම.

	ව්‍යාපෘතිය යෝජනා වී වර්ෂ 11 ක් සහ ගිවිසුම්ගතව වර්ෂ 07 ක් වශයෙන් ප්‍රමාද වී පවතින නිසාත්, විදේශ ණය ව්‍යාපෘතියක් ලෙස තවදුරටත් ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යා යුතුද යන්න පිළිබඳව ප්‍රමාණවත් සමාලෝචනයකින් පසුව තීරණය කර නොතිබුණි.		
(ආ)	**ඉන්දියානු රජයේ ආධාර යටතේ වතු පාසල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම**		
	ඉන්දියානු රජයේ ආධාර යටතේ මධ්‍යම, ඌව, සබරගමුව හා දකුණ යන පළාත්වල තෝරාගත් වතු පාසල් 09 ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 300ක් වූ මෙම ව්‍යාපාතියට 2019 ජුනි 19 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු නමුත් එකී කාර්යයට රු.මිලියන 300ක ආධාර ප්‍රමාණවත් නොවීම හා මිල ගණන් ඉහල යාම හේතු ලෙස දක්වමින් 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අවස්ථා තුනකදී රු.මිලියන 632.77 දක්වා ඇස්තමේන්තු සංශෝධනය කර තිබියදී හා සමාලෝචිත වර්ෂයට රු.මිලියන 2.35ක ප්‍රතිපාදන වෙන්කර අවුරුදු 06ක් ප්‍රමාද වී තිබියදීත් සමාලෝචිත වර්ෂයේදී ද ව්‍යාපෘතියට අදාලව කිසිදු ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණි. 2025 මාර්තු 31 දින වන විටත් ප්‍රසම්පාදනයේ මුලික කොටස් පමණක් ඉටුකර තිබුණු අතර මෙම ඉන්දියානු ආධාර ව්‍යාපෘතිය කාර්යක්ෂමව ඉටුකර රටක් ලෙස ප්‍රතිලාභ කාලීනව ළඟා කර ගැනීමට අපොහොසත් වී තිබුණි.	2019 වර්ෂයේ කොවිඩ් වසංගතය පැමිණීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාදවීම. 2021 වර්ෂයේ ආර්ථික අර්බුදය පැමිණීම නිසා මිලගණන් ඉහළ යාම හේතුවෙන් ලංකා රු.මිලියන 300ක ඉන්දියානු ආධාර ප්‍රමාණවත් නොවීම නිසා ඉන්දීය ජනරජය, ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය මඟින් ශ්‍රී ලංකා රු.මිලියන 600කට ප්‍රධාන අරමුදල වැඩි කිරීමට සිදුවීම. ඒ අනුව මීට අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2024 ජූලි 29 ලබාගන්නා ලදි. ඒ අනුව රු.මිලියන 600ක ප්‍රදානය ලබාගැනීම සම්බන්ධයෙන් හුවමාරු ලිපියට සහ පිළිගැනීමේ ලිපියට 2024 ඔක්තෝබර් 18 දින අත්සන් කරන ලදි. මේ වන විට ඇස්තමේන්තු සකස් කර අනුමත කරගෙන ඇති අතර ප්‍රසම්පාදන ලියවිලි ඉන්දීය තානාපති කාර්යාලයට සමාලෝචනය කිරීම සඳහා ඉදිරිපත් කර ඇති බව.	ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ සමාලෝචනය කර කාර්යක්ෂමව අවසන් කර ප්‍රතිලාභ කාලීනව ළඟාකර ගැනීමට කටයුතු කල යුතු වීම.

4.8 විදේශාධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**ද්විතීයික අධ්‍යාපන ආංශික වැඩිදියුණු කිරීමේ වැඩසටහනට අදාළ (SESIP) අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය**		
(i)	ද්විතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහනෙහි විසර්ජන සබැඳි දර්ශක 07 ට අදාළව නියාමන හා ඇගයීම් රාමුව මූලික කාර්යසාධන දර්ශක (KPIS) 65 කින් සමන්විත වන අතර ඒට අදාළ දත්ත රැස් කිරීම සඳහා පළාත් 09 ම ආවරණය වන පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය තුළ දත්ත පද්ධතියක් නිර්මාණය කළ යුතුව පැවතියද විගණිත දින වන විටත් අදාළ කාර්යයන් ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි	NEMIS පද්ධතිය සකසා, දත්ත ඇතුලත් කර, දත්ත වාර්තා මගින් නියාමන හා ඇගයීම් රාමුව සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීමට හැකි ලෙස එම පද්ධතිය පරිණත වන තෙක් දැනට DHIS2 මෘදුකාංගය මගින් නියාමන හා ඇගයීම් රාමුවේ දත්ත රැස්කිරීමේ පද්ධතිය සකස් කර 2024 අප්‍රේල් 08 දින අදාල අංශ වෙත නිරීක්ෂණ හා නිර්දේශ ලබාදීමට උපදෙස් ලබා දී ඇත, එම නිර්දේශ ලැබෙන තෙක් ඒ සඳහා පිළිතුරක් නොලද හෙයින්, දත්ත කළමනාකරණ ශාඛාව විසින් හඳුනාගත් හා පසුව කළ සාකච්ඡාවලදී හඳුනාගත් නවීකරණයන්ද ඇතුලත් කර සංවර්ධන කාර්යය අවසන් කරන ලද පද්ධතිය සක්‍රීයව පවත්වාගෙන යාම හා අදාල ආයතනවල ක්‍රියාත්මක කරවීම සඳහා කටයුතු කර ඇති බව.	අපේක්ෂිත ඉලක්ක නියමිත කාලරාමුව තුල ළඟාකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතු වීම හා අධ්‍යාපන අංශය පිළිබඳ තීරණ ගැනීමට වැදගත් වන අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාපිත කිරීමට යෝජිත ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කරගත යුතු වීම.
(ii)	දත්ත කළමනාකරණ පද්ධතියක ඇති වැදගත්කම සැලකිල්ලට ගනිමින් දත්ත පාදකයන් සකස් කරගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සතුව සුදුසුකම් ලත් මෘදුකාංග ඉංජිනේරුවරයෙකු නොමැති වීම හේතුවෙන් ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශකයින් බඳවාගැනීම සඳහා වන උපදේශක කළමනාකරණ පද්ධතිය මගින් උපදේශකවරුන් 04 දෙනෙකු තෝරාගෙන තිබුණු අතර අදාළ උපදේශකවරුන් විසින් මාස 06 ක කාලසීමාවක් ඇතුළත දත්ත පාදකය නිර්මාණය කළ යුතු අතර ඒ සඳහා වන වියදම ආසියානු සංවර්ධන	උපදේශකවරුන් 04 දෙනෙකු මාස 06 කාලසීමාවක් සඳහා බඳවාගැනීමට කටයුතු යොදා ඇති බව නිරීක්ෂණය වන අතර එලෙස බඳවාගත් උපදේශකවරුන් සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු මෙතෙක් දත්ත කළමනාකරණ ශාඛාව දැනුම් දී නොමැත. තවද 2022 වසරේ මාස 18-32ක කාලයක් වැය වෙතැයි අපේක්ෂා කල මෙම කාර්යය මාස 06 ක් දක්වා අඩුකර තිබුණු පසුබිමක අදාල ක්‍රියාවලිය මෙම මාස 06 ක සීමාව තුල සම්පූර්ණ කල හැකිද යන්න සාකච්ඡා කර නොමැත. තවද, උපදේශකවරුන් බඳවා	අපේක්ෂිත ඉලක්ක නියමිත කාලරාමු තුල ළඟාකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතු වීම හා ආසියානු සංවර්ධන බැංකු ප්‍රදානයක් ලෙස ලැබෙන උපදේශකයින් මගින් විසර්ජන සබැඳි දර්ශකවලට අදාළ දත්ත පාදකය නිර්මාණය කරගත යුතු බව.

බැංකුව විසින් දරනු ලබනු බවද දක්වා තිබුණි. අදාළ උපදේශකයින් යොදවා ගැනිමින් දත්ත පාදකය නිර්මාණය කර විසර්ජන සබැදි දර්ශක ඉටුකර ගැනීම ඉතා වැදගත් වන නමුත් අදාළ කාර්යයන් ඉටුකර ගැනීමට ඒ සඳහා වගකිව යුතු නිලධාරින් අපොහොසත් වී තිබුණි.

ගැනීමෙන් මාස 6 ඉක්මවූ පසු ඉදිරි ක්‍රියාවලිය පිළිබඳව ද මෙතෙක් දැනුවත් කර නොමැති බව.

(ආ) **පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බහුවාර්ගික හා ත්‍රෛභාෂා අධ්‍යාපනය සහිත නව ජාතික පාසලක් ඉදිකිරීම**

ඉන්දියානු ජනරජයේ ආධාර යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බහුවාර්ගික හා ත්‍රෛභාෂා අධ්‍යාපනය සහිත නව ජාතික පාසලක් ඉදිකිරීම සඳහා 2016 දෙසැම්බර් 07 වන දින අමප/16/24/66/742/039 දරන අමාත්‍ය මණ්ඩල තීරණයක් ලැබී තිබුණු අතර මෙම ව්‍යාපෘතිය යටතේ ගොඩනැගිලි දෙකක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව අදියර 01 ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් ඉන්දියානු ආධාර යටතේ සිදු කරනු ලබන අතර එම කොන්ත්‍රාත්තුවට අදාල එකතු කල අගය මත බදු (VAT) සහ උපදේශන ගාස්තු පමණක් දේශීය අරමුදලින්ද එසේම අදියර 02 ගොඩනැගිල්ලේ සම්පූර්ණ වියදම දේශීය අරමුදල් වලින්ද සිදු කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

ව්‍යාපෘතිය ප්‍රමාද වීම හේතුවෙන් රජයට සිදු වූ අලාභ

(i) පාසලේ ඉදිකිරීම් කටයුතු සඳහා රු.මිලියන 297.84ක් වූ කොන්ත්‍රාත්තුවට අදාළව 2018 වර්ෂයේ ආරම්භක අත්තිකාරම් ලෙස රු. මිලියන 59.57ක් සහ එයට අදාල වැට් බදු මුදල් ලෙස රු.මිලියන 9 ක් ගෙවා තිබුණි. වැට් 2018 වර්ෂයේදී ගෙවන ලද අත්තිකාරම් මුදලට අදාල වැට් මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීම සිදුකල යුතු කාර්යයකි.මේ බව සනාථ කරන රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ

ඉන්දියානු ජනරජයේ ආධාර යටතේ සිදුවන ඉදිකිරීම් ව්‍යාපෘතියේ ගෙවීම්වලට අදාල වැට් බදු මුදල් අධ්‍යාපන අමාත්‍යංශය මගින් ශ්‍රී ලංකා රජයේ මුදල් වලින් කොන්ත්‍රාත්කරුට ගෙවීම්

	බදු මුදලට අදාල අත්තිකාරම් සුරක්ෂණයක් ලබාගැනීමෙන් හෝ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සමඟ වැට් මුදලට අදාල අත්තිකාරම් සුරක්ෂණය පිළිබඳව තහවුරු කර ගැනීමකින් තොරව අමාත්‍යාංශය විසින් වැට් බදු මුදල් ගෙවීමට කටයුතු කර තිබුණි. ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදය හේතුවෙන් 2020 ජනවාරි 22 දින ගිවිසුම අවසන් කර තිබුණු අතර මේ හේතුවෙන් ආරම්භක අත්තිකාරම් මුදල සමඟ ගෙවන ලද වැට් බදු මුදලින් රු. මිලියන 6.13ක අලාභයක් රජයට සිදු වී තිබුණි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අදාල වැට් බදු මුදල් රජයට ලැබීම තහවුරු කරගැනීම හෝ නොඑසේ නම් රජයට සිදු වූ පාඩුව කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.	2017 මැයි 25 දිනැති ලිපිය මඟින් සනාථ වේ. මේ අනුව එම කොන්ත්‍රාත්කරුගෙන් විගණනය විසින් සඳහන් කර ඇති මුදල නැවත අයකර ගැනීමේ හැකියාව මෙම අමාත්‍යාංශයට නොමැති අතර මෙම කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමක්ද මෙම අමාත්‍යාංශය සමඟ නොමැති බව සනාථ කරන අතර විගණනයේ පෙන්වා ඇති පරිදි අමාත්‍යාංශය සමඟ ගිවිසුමක් නොමැති කොන්ත්‍රාත්කරුවෙකුට විරුද්ධව නීතිමය පියවර ගැනීමට නොහැකි බව සඳහන් කරමි.	කිරීම හේතුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අදාල කොන්ත්‍රාත්කරු විසින් අත්තිකාරම් මුදලට අදාල වැට් බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා ඇතිද යන්න තහවුරු කර ගැනීමත් ඒ අනුව සිදුවී ඇති අලාභය කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමත් කළ යුතු බව.
(ii)	2024 දෙසැම්බර් 31 දින වන විට අදියර 01 ගොඩනැගිල්ල සඳහා රු. මිලියන 227.22 (වැට් සහිතව) ක මුදලක් දරා විෂයපථය සීමාකිරීම් සහිතව සියයට 100 ක භෞතික ප්‍රගතියක්ද අදියර 02 ගොඩනැගිල්ල සඳහා රු.මිලියන 111.43 (වැට් සහිතව) ක මුදලක්ද දරා සියයට 42 ක පමණ භෞතික ප්‍රගතියක්ද ලබාගෙන තිබුණි. මෙලෙස ව්‍යාපෘතියේ අදියර 01, ගොඩනැගිල්ලේ වහලය සහ පළමු මහල පමණක් අවසන් කර අදාල කොන්ත්‍රාත්කරු විසින් අමාත්‍යාංශය වෙත භාරදී තිබුණු අතර අදියර 02 ගොඩනැගිල්ලේ කොන්ත්‍රාත්තුව අන්‍යෝන්‍ය එකඟතාවය මත අවලංගු කිරීම සඳහා 2025 අප්‍රේල් 03 දින අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව රු.මිලියන 535.7 ක පමණ වියදමක් දරා ත්‍රෛභාෂා ජාතික පාසලක් ආරම්භ කිරීම සඳහා සැලසුම් කරන ලද ගොඩනැගිල්ල අපේක්ෂිත මට්ටමින්	දැනට මෙම ගොඩනැගිලි උපයෝජනය කරන්නේ කුමන කාර්යයක් සම්බන්ධවද යන්න නිශ්චිතව නොමැති අතර දැනට ප්‍රදේශයේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් පොළොන්නරුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ යෝජනා ලබාගෙන ඉදිරිපත් කරන ලෙස පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් වෙත දන්වා ඇති අතර එම යෝජනා සැලකිල්ලට ගෙන අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තීරණය කරන පරිදි ඉදිරි කටයුතු කිරීමට නියමිතව ඇත.	සැලසුම්කල පරිදි ඉදිකිරීම් කටයුතු අවසන්කර ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා වගකිව යුතු නිලධාරීන් කටයුතු කල යුතු වීම.

නිම කිරීමට නොහැකි වීම හේතුවෙන් 2018 වර්ෂයේ සිට අවුරුදු 07ක් ප්‍රමාදව පැවතියද ව්‍යාපෘතියේ අරමුණු මෙතෙක් ඉටු කරගෙන නොතිබුණි. තවද අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අදාල පාර්ශවයන් සමඟ අවබෝධතා ගිවිසුමකට එළැඹී ආධාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ගැනීම සිදු කල යුතු වුවත් මෙම ව්‍යාපෘතිය සඳහා ඉන්දියානු රජය සහ අධ්‍යාපන අමාත්‍යාංශය අතර ඇතිකර ගත් අවබෝධතා ගිවිසුමක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) ඉන්දියානු රජයේ ආධාර යටතේ පුස්සැල්ලාව සරස්වතී මධ්‍ය මහා විද්‍යාලයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය රු.මිලියන 74.91 ක වියදමින් 2024 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණු අතර එම ආධාර යටතේ ඉතිරි මුදලින් සමාලෝචිත වර්ෂය තුලදී රු.මිලියන 3.77 ක වටිනාකමැති තොරතුරු තාක්ෂණ උපකරණද, රු.මිලියන 2.9ක වටිනාකමැති විද්‍යාගාර උපකරණද මිලදීගැනීම සඳහා ඉන්දියානු රජය අනුමත කර තිබුණි. මෙම කාර්යයන් 02 හි කටයුතු සමාලෝචිත වර්ෂය තුලදී ආරම්භ කර තිබුණු නමුත් නියමිත පරිදි සැලසුම් තුලට එම කාර්යයන් 02 ඇතුලත් කර 2024 හා 2025 වර්ෂ සඳහා නව වැය විෂයයන් ඇතිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඉන්දියානු රජය 2019 වර්ෂයේදී මිලදීගැනීමට අනුමැතිය ලබා දී තිබුණු රු.මිලියන 3.77ක් (වැට් රහිත) වටිනාකමැති තොරතුරු තාක්ෂණ උපකරණ වර්ෂ 06ක ප්‍රමාදයකින් පසුව 2025 ජනවාරි 22 දින සරස්වතී මධ්‍ය මහා විද්‍යාලය වෙත භාරදී තිබුණු අතර ඊට අදාල ප්‍රසම්පාදන කටයුතු වැය විෂයයන් අනුමත කරගෙන නොතිබියදී 2024 වර්ෂය තුළ ආරම්භ කර තිබුණි. තවද,

2023 වර්ෂයේදී ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය මඟින් මෙම ඉතිරි මුදල සඳහා භාණ්ඩ මිලදී ගැනීම් සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලදි. නමුත් මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත මුදල හා මිල ලංසුව (price bids) අතර විශාල වශයෙන් වෙනසක් පැවතීම හේතුවෙන් 2024 වර්ෂයේ මැද භාගයේදී හිටපු අධ්‍යාපන ලේකම්තුමියගේ උපදෙස් පරිදි මෙම ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු මෙම අමාත්‍යාංශයට පවරන ලදි. ඒ අනුව වර්ෂය මධ්‍යයේ අදාළ වැය විෂය ලබාගැනීමට නොහැකි විය. 2025 වර්ෂයේදී ඊට අදාළ වැය විෂය හා ප්‍රතිපාදන ලබාගෙන ඇති බව.

මෙම ව්‍යාපෘතියේ කටයුතු සඳහා වියදම් දැරීමට අවශ්‍ය නව වැය විෂයයන් ඇතිකර ගැනීම සහ ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කඩිනමින් කටයුතු කර ව්‍යාපෘතියේ අරමුණු මුදුන් පමුණුවා ගැනීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කල යුතු වීම හා දේශීයව හා විදේශීයව ලැබෙන මුල්‍ය හා භාණ්ඩ ගිණුම්ගත කිරීම හා ඊට අනුමැතිය ලබාගැනීම 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව කාලීනව සිදුකිරීමටත්, ප්‍රතිපාදන අනුමත කරගත් පසුව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමටත්, අයවැය හා ප්‍රසම්පාදන කටයුතු භාර නිලධාරීන් කටයුතු සිදු කළ යුතු බව.

රු.මිලියන 2.9ක් (වැට් රහිත) වූ විද්‍යාගාර උපකරණ මිලදීගැනීමේ ප්‍රසම්පාදන කටයුතු 2025 මැයි 31 දින වනවිටත් ආරම්භ කර නොතිබුණි.

4.9 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**කෝඩ්ජෙන් ආයතනය මගින් හඳුන්වා දී ඇති** EDU Net **මෘදුකාංගය හා එහි ක්‍රියාකාරිත්වය**		
(i)	Codegen නමැති ආයතනයේ ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකාවේ රජයේ හා පෞද්ගලික පාසල් 18 ක පමණ භාවිතා කරන Cloud Smart School මෘදුකාංගය අමාත්‍යාංශයේ දත්ත අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි සංවර්ධනය කිරීමටත්, ඒ අනුව සකස් කළ EDUNET මෘදුකාංගය වසර 5 ක කාලයක් සඳහා සමාජ සත්කාරක ව්‍යාපෘතියක් (CSR) ලෙස ලබාදීමටත් යෝජනාවක් ඉදිරිපත් කර තිබුණු අතර එම යෝජනාව සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නිර්දේශ ලබාගැනීමට 2024 පෙබරවාරි 09 දින පත්කල කමිටුවේ නිර්දේශ 2024 අප්‍රේල් 19 දින ලැබී තිබුණු අතර Codegen ආයතනය විසින් ඉදිරිපත් කළ යෝජනාවලිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතුළත් නෛතික විධිවිධාන ගතයුතු බව කමිටු නිර්දේශවල සඳහන් කර තිබුණු නමුත් කමිටු නිර්දේශ ඉදිරිපත් කිරීමට පෙර පෞද්ගලික සමාගම සමඟ හෙළිදරව් නොකිරීමේ එකගතාවයට එළඹී තිබුණි. ඒ අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතියක් නොමැතිව ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 1.3 ට පටහැනිව එම ආයතනය සමග හෙළිදරව් නොකිරීමේ අන්‍යොන්‍ය එකගතාවයට විධිමත් අනුමැතියක් නොමැතිව 2024 පෙබරවාරි 1 දින	විගණන විමසුම තුල ඉදිරිපත් කරනු ලබන ගිවිසුම සේවා ගිවිසුමක් නොවේ. එම ගිවිසුම සේවා ගිවිසුමකට එළැඹීමට පෙර, අපේක්ෂිත කාරණයේ ශක්‍යතාවය සලකා බැලීම සඳහා වන නියමු ධාවනයක් අතරතුර කාලයේදී දෙපාර්ශවයේම දත්ත වෙනත් පාර්ශවයන්ට නිරාවරණය නොකිරීම සඳහා ඇති කර ගන්නා ලද එකඟතාවයක් වන දත්ත නිරාවරණය නොකිරීමේ ගිවිසුමකි. තොරතුරු පද්ධතියේ ශක්‍යතාවය අධ්‍යයනය සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස තෝරාගත් පාසල්හි ස්ථාපනයට අතිරේක ලේකම්(තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් අධ්‍යාපන)ගේ ප්‍රධානත්වයෙන් 2024 අප්‍රේල් 08 දින පැවති රැස්වීමේ දී තීරණ කර ඇත. ඒ අනුව මෙම තොරතුරු පද්ධතියේ ආරම්භක ප්‍රගතිය සළකා අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතීන් ලබාගැනීමට අවශ්‍ය මූලික කටයුතු ඒ වන විටත් ආරම්භ කර තිබිණි. ඒ අනුව අදාළ නිලධාරීන් ඔබ විසින් පෙන්වා දී ඇති ආකාරයේ ආයතන සංග්‍රහයට පටහැනිව කටයුතු කර ඇති බව නිරීක්ෂණය නොවන බව.	නිසි අනුමැතියකින් තොරව හා ආයතන සංග්‍රහයේ 47 පරිච්ඡේදයේ 1.3 ට පටහැනිව බාහිර ආයතනයක් සමඟ ගිවිසුම්ගත වූ පාර්ශවයන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු බව.

	අතිරේක ලේකම්, (තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් අධ්‍යාපන) විසින් ඔහුගේ බලය අනිසි ලෙස භාවිතා කරමින් තනි මතයට ගිවිසුම් ගත වී තිබුණි.		
(ii)	2016 පෙබරවාරි 12 දිනැති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම් නියෝග අංක 09 පරිදි පාසල් සිසුන්ගේ හා ගුරුවරුන්ගේ තොරතුරු ඇතුළත් ක්‍රමවත් පරිගණක පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කරන ලෙස නියෝග කර තිබුණු නමුත් 2025 ඔක්තෝබර් 10 දින වනවිටත් ක්‍රමවත් ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය වී නොතිබුණි. අධ්‍යාපනයේ ඉදිරි මහ සැලසුම් කිරීමේදී හා ප්‍රතිපත්ති සකස් කිරීමේදී සමස්ථ අධ්‍යාපන පද්ධතිය ඩිජිටල්කරණයට ලක්වීම අනිවාර්ය වන අතර ඒ සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයේ විෂයපථයට අදාල විවිධ වූ කළමණාකරණ තීරණ ගැනීමට අවශ්‍ය දත්ත පැවතිය යුතු ප්‍රධාන මොඩියුල අනුව සකස් කල යාවත්කාලීන හා නිවැරදි දත්ත ඇතුළත් තොරතුරු පද්ධතියක් සකස් කරලීමට අධ්‍යාපන අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.	වර්තමානය වන විට අධ්‍යාපන අමාත්‍යාංශය ගුරු තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යයි.	ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු බව.
(iii)	අධ්‍යාපන ක්ෂේත්‍රයේ වටිනා දත්ත විධිමත් අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයන් සතු වන පරිදි තම බලය ඉක්මවා පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම්ගත වූ අතිරේක ලේකම් (තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් අධ්‍යාපන) සම්බන්ධයෙන් හා 2023 දෙසැම්බර් 29 දිනැති 54/2023 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අත්පොතෙහි CEX6 වගන්තිය ප්‍රකාරව අනුමැතිය ලබාගැනීමකින් තොරව ජාතික පාසල් 18 ක විදුහල්පතිවරුන් codegen ආයතනය විසින් හඳුන්වා දෙන ලද	මෙය කිසිසේත් සේවා ගිවිසුමක් නොවන අතර එය නියමු ධාවනයේදී ලබාගන්නා සහ හුවමාරු වන තොරතුරු, සංවේදී දත්ත නිරාවරණය නොවීම සඳහා ආයතනය සමග එළඹී එකගතාවයකි. තොරතුරු පද්ධතියේ ශක්‍යතාවය අධ්‍යයනය සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස තෝරාගත් පාසල්හි ස්ථාපනයට අතිරේක ලේකම්(තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් අධ්‍යාපන)ගේ ප්‍රධානත්වයෙන් 2024 අප්‍රේල් 08 දින පැවති රැස්වීමේ දී තීරණ කර ඇත. ඒ අනුව මෙම තොරතුරු පද්ධතියේ ආරම්භක ප්‍රගතිය සළකා	අංක 54/2023 දරණ හා 2023 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛයට අදාල මාර්ගෝපදේශ අත්පොතෙහි CEX 6 වගන්තිය ප්‍රකාරව හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ දත්ත විධිමත් අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයන්ට භාවිතයට ඉඩ සැලසීම පිළිබඳව වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි නීතිමය තත්ත්වයක් ක්‍රියාත්මක කළයුතු වීම.

	Cloud Smart School මෘදුකාංගය පාසල් තුළ භාවිතා කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන්ද ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුව තිබුණි.	අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතීන් ලබා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු ඒ වන විටත් ආරම්භ කර තිබිණි. ඒ අනුව අදාළ නිලධාරීන් ඔබ විසින් පෙන්වා දී ඇති ආකාරයේ ආයතන සංග්‍රහයට පටහැනිව කටයුතු කර ඇති බව නිරීක්ෂණය නොවේ.	
(ආ)	**නවෝත්පාදන විද්‍යාගාර සඳහා අධි තාක්ෂණික උපකරණ මිලදීගැනීම**		
(i)	මෙම වැඩසටහනට අදාළව නිකුත් කරන ලද 2021 දෙසැම්බර් 23 දිනැති අංක 20/2021 දරන චක්‍රලේඛයෙහි සඳහන් පරිදි නවෝත්පාදන විද්‍යාගාර සඳහා අවශ්‍ය වන උපකරණ අතුරින් ඉහළ ගුණාත්මක ප්‍රමිතියකින් හා වගකීමක් යටතේ සැපයිය යුතු අධිතාක්ෂණික උපකරණ අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ලබාදීමට නියමිතව තිබුණි. ඒ අනුව පාසල් 45ක් සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස රු.මිලියන 79.96 ක් වැයකර ත්‍රිමාණ මුද්‍රණ යන්ත්‍ර ඇතුළු අධිතාක්ෂණික උපකරණ මිලදීගැනීමට කටයුතු කර තිබුණු නමුත් ඉහත ඡේදයේ පරිදි පාසල් 750 තුළ නවෝත්පාදන විද්‍යාගාර ප්‍රශස්ත මට්ටමින් ක්‍රියාත්මකව නොතිබුණි. එමෙන්ම මෙම ඉහළ මට්ටමේ පිරිවිතරයන් සකස් කර අධිතාක්ෂණික උපකරණ මිලදී ගැනීමේ දී භාවිතයේදී නඩත්තු පිරිවැය හා අමුද්‍රව්‍ය පිරිවැය පිළිබඳ දැරිය හැකි බව නොසලකා කටයුතු කර තිබුණු අතර මේ සඳහා දීර්ඝ කාලීන මූල්‍ය හා මෙහෙයුම් සැලැස්මක් සකස් කර නොතිබුණි.	මේ වන විට පාසල් 45න් පාසල් 39ක මෙම උපකරණ ස්ථාපනය කර අවසන් කර ඇති අතර, ඉතිරි පාසල් 06හි ස්ථාපන කටයුතු 2025.05.31 දිනට පෙර අවසන් කරන බවට Metropolitan ආයතනයෙන් දැනුම් දී ඇත. මෙම උපකරණ ඌන උපයෝජිතව නොපැවතීම සඳහා මෙම පාසල් 45හි විදුහල්පතිවරු හා ගුරුවරු හට Metropolitan ආයතනයෙන් සුදුසු නිලධාරීන් කැඳවා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීමට වැඩසටහනක් 2025 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත. ඒ අනුව, අදාළ උපකරණවල ස්ථාපන කටයුතු අවසන් වීමෙන් අනතුරුව මෙම පුහුණු වැඩසටහන සිදුකිරීමට අපේක්ෂා කරනු ලැබේ. ඒ අනුව නවෝත්පාදන විද්‍යාගාර කඩිනමින් බලගැන්වීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. ඉදිරියේදී ක්‍රියාත්මක කරන්නා වූ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ නවෝත්පාදන බිහි කිරීම සඳහා මෙම විද්‍යාගාරවලට ලබාදී ඇති මෙම අධිතාක්ෂණ උපකරණ උපයෝගී කරගත හැකි බවද පෙන්වා දෙමි. නවොත්පාදන විද්‍යාගාරවලට අවශ්‍ය අවම ප්‍රමිතීන් සකස් කිරීම සඳහාද 2025 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි වැඩසටහනක් සැලසුම් කර ඇති බව.	ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් සැලැස්මක් කාලවකවානු සහිතව පිළියෙල කිරීමට කටයුතු කර, ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතු වීම.
(ii)	තාක්ෂණ නවෝත්පාදන රසායනාගාර සඳහා උපකරණ ප්‍රසම්පාදනය (සැපයීම, ගෙනවිත් භාරදීම හා ස්ථාපනය) කාර්යය	2024.12.27 දින සැපයුම්කරුගේ ගබඩාවේදී තත්ත්ව පරීක්ෂණ කමිටුව විසින් ලැප්ටොප් පරිගණක සහ ත්‍රිමාන මුද්‍රණ යන්ත්‍රවල	ගිවිසුම්ගත වී තිබෙන පරිදි ගෙවීම් කළයුතු වීම හා ගිවිසුම් කොන්දේසි පසුව වෙනස් කිරීමෙන්

	සඳහා ලංසු ආරාධනා කර තිබුණු අතර ලංසු ලේඛනයෙහි වගන්ති vii හි CC 15.1 ප්‍රකාරව භාණ්ඩ බාර දී ඇති බවටත් ගිවිසුම්ගත සේවාවන් සියල්ල සිදුකර ඇති බවටත් තහවුරු කිරීමෙන් පසු දින 30ක් ඇතුලත කොන්ත්‍රාත්තුවේ මිලෙන් සියයට සියයක් සැපයුම්කරු වෙත ගෙවිය යුතු බව සඳහන් කර තිබුණි. නමුත් ඊට පටහැනිව ලැප්ටොප් පරිගණක හා ත්‍රිමාණ මුද්‍රණ යන්ත්‍ර ලැබීම පමණක් පදනම් කරගෙන හා අදාල පාසලට භාරදීම, ස්ථාපනය යන කාර්යයන් ඉටුකර නොතිබියදී 2024 දෙසැම්බර් 31 දින රු.මිලියන 50.55ක මුදලක් සැපයුම්කාර ආයතනය වෙත ගෙවීමට කටයුතු කර තිබුණි.	ප්‍රමාණවත් නියැදියක් පරීක්ෂා කර, පත්තලගෙදර ගබඩාවට භාරගැනීම සුදුසු බවට නිර්දේශ කර ඇති අතර, එම භාණ්ඩ 2024.12.28 දින පත්තලගෙදර ගබඩාව වෙත භාර දී ඇත. සැපයුම්කරු විසින් 2024.12.16 දිනැතිව ලිපියක් ඉදිරිපත් කරමින් 2024.12.28 දින වන විට ඉතිරි භාණ්ඩ වර්ග දෙක වරායට පැමිණෙන බැවින් එම භාණ්ඩ නිදහස් කරගැනීමට ගතවන කාලය සලකා 2025.01.15 දින වන විට භාණ්ඩ සැපයීමට කටයුතු කරන බව දන්වා ඇත. 2024.12.31 දිනෙන් වර්ෂයට අදාළව වෙන්ව ඇති ප්‍රතිපාදන අවසන් වන බැවින් සහ 2025 මුල් කාර්තුව සඳහා අතුරු සම්මත ගිණුමක් මගින් ප්‍රතිපාදන වෙන්වන බැවින් 2025 වර්ෂය සඳහා බැරකම් හා බැදීම් ඇති කරනොගත යුතු බවට උපදෙස් ලබා දී ඇති බැවින් ප්‍රායෝගිකත්වය අනුව ගබඩාව වෙත සපයන ලද භාණ්ඩ සඳහා ගෙවිය යුතු වටිනාකමට සමාන බැංකු සුරක්ෂණයක් ලබාගෙන අදාළ මුදල සැපයුම්කරු වෙත ගෙවා ඇත. ඉතිරි භාණ්ඩ ද 2025.01.31 දින වනවිට පත්තලගෙදර ගබඩාවට භාර දී ඇත. මේ වනවිට සියලු බෙදාහැරීම් ද අවසන් කර ඇති අතර, ඉතිරි ගෙවීම් සිදුකිරීමට ඉතිරිව ඇත.	ලංසුකරුවන්ට සාරානුකූලව ප්‍රතිචාර දැක්වීමේ අවස්ථාව සීමා නොකල යුතු අතර ඒ තුළින් පළමු අවස්ථාවේදීම සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද අවම ලංසුකරු තෝරා ගැනීමේ අවස්ථාව අහිමිවීමෙන් රජයට අවාසිදායක තත්ත්වයක් ඇතිවන බැවින් ගිවිසුම් කොන්දේසි පසුව වෙනස් කිරීම සිදුකළ නිලධාරින් වගකීමට යටත් වන බව .
(iii)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 ප්‍රකාරව විභව ලංසුකරුවන් දැනුවත් කිරීම සහ ඔවුනට උපදෙස් සැපයීම මෙන්ම සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අපේක්ෂිත අවශ්‍යතාවයන් ගැන දෙපාර්ශවයම දැනුවත් කිරීම සඳහා සෑම ප්‍රසම්පාදනයක් සඳහාම ලංසු කැඳවීමේ ලේඛන සකස් කිරීම ප්‍රසම්පාදන කමිටුවලින් අපේක්ෂා කරන බව සඳහන් වේ. ඒ අනුව මෙම ලංසු ප්‍රදානය වර්ෂයේ අවසානයේදී ක්‍රියාත්මක වන බැවින් ඇති විය හැකි ඉහත	මෙම ප්‍රසම්පාදනය 2024.03.07 වන දින ආරම්භ කර ඇති අතර, ලංසු කැඳවීම 2024.05.14 දින සිදුකර ඇත. 4.3.2 (අ) හි පැහැදිලි කර ඇති පරිදි ප්‍රසම්පාදනය සිදු කරගෙන යන අතරතුරදී සිදු වූ අනපේක්ෂිත තත්වයක් මත නැවතත් ප්‍රතිපාදන මු.රෙ.66 යටතේ මාරු කරගැනීමට සිදුවීම නිසා ප්‍රසම්පාදනය පිරිනැමීම ප්‍රමාද වී ඇත. ඔබ පෙන්වා දී ඇති පරිදි ලංසු ලේඛන සකස් කිරීමේදී මෙම කරුණු පැන නොනැගුණු අතර, ලංසු ලියවිලිවලට විශේෂ අවිනිශ්චිත තත්වයන් වෙනුවෙන් වගන්ති ඇතුළත් කිරීමට	-එම-

	අවිනිශ්චිතතාවයන්ට ගැළපෙන පරිදි ලංසු සඳහා ගෙවීම සම්බන්ධයෙන් වන කොන්දේසි සකස් කර ලංසු ලේඛනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේ තිබියදී මෙලෙස ගිවිසුමට පටහැනිව රු.මිලියන 50.55ක් ගෙවීම් සිදුකිරීම සම්බන්ධයෙන් ගෙවීම නිර්දේශ කල ප්‍රධාන ගණකාධිකාරී (ප්‍රසම්පාදන), ගෙවීම අනුමත කල අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) සහ ගෙවීම සහතික කල නිලධාරියා වගකිව යුතුව තිබුණි.	අවශ්‍යතාවයක් නොතිබුණි. පැවති ප්‍රායෝගික තත්වය මත කොන්ත්‍රාත් පරිපාලනය යටතේ 2024 වර්ෂයේ ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වශයෙන් මාගේ අනුමැතිය යටතේ භාණ්ඩ පත්තලගෙදර ගබඩාව වෙත භාරගෙන තත්ත්ව පරීක්ෂණයෙන් පසු භාණ්ඩවල වටිනාකමෙන් 80% ක් ගෙවීම් කිරීමටත් ඉතිරි 20% පොදු තැන්පත් ගිණුමේ රඳවා ගැනීමටත් කටයුතු කර ඇත. තවද, 2025 මුල් කාර්තුව සඳහා අතුරු සම්මත ගිණුමක් මගින් ප්‍රතිපාදන වෙන්වන බැවින් 2025 වර්ෂය සඳහා බැරකම් හා බැඳීම් ඇති කරනොගත යුතු බවට උපදෙස් ලබා දී ඇති බැවින් ප්රායෝගිකත්වය අනුව ගබඩාව වෙත සපයන ලද භාණ්ඩ සඳහා භාණ්ඩ භාරගැනීමේ කමිටුවේ නිර්දේශ ලබාගැනීමෙන් පසුව ගෙවිය යුතු වටිනාකමට සමාන කොන්දේසි විරහිත බැංකු සුරක්ෂණයක් ලබාගෙන අදාළ මුදල සැපයුම්කරු වෙත ගෙවා ඇත.	
(ඇ)	**චීන ආධාර යටතේ සුහුරු පුවරු 500ක් ලබාගෙන නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**		
(i)	සාමාන්‍ය අධ්‍යාපනය ඩිජිටල් පරිවර්තනයකට ලක් කිරීම සඳහා වූ ව්‍යාපෘති යෝජනාවක් යටතේ යෝජිත ඉදිරි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ප්‍රමුඛ පාසල් ලෙස හඳුනා ගන්නා ලද පාසල් 1500 අතුරින් පාසල් 500 ක් සඳහා ඇ.ඩො. මිලියන 20 ක චීන ආධාර ව්‍යාපෘතිය යටතේ ලැබීමට නියමිතව තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ පාසල් 500 තුළ සඳහා සම්ප්‍රේෂණ සුහුරු පුවරු සහිත පන්ති කාමර 450ක් (Delivering class room), ප්‍රතිග්‍රාහක සුහුරු පුවරු සහිත පන්ති කාමර 50ක් (Receiving class room) සහ එම කටයුතු මෙහෙයවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය තුළ ජාල	මෙම ව්‍යාපෘතියේ කාල රාමුව සඳහා චීන රජය ප්‍රධානව කටයුතු කරන අතර එයට අනුගතව ව්‍යාපෘති පියවරයන් අනුගමනය කිරීම කල යුතු වේ. චීන රජය පාර්ශවයට ව්‍යාපෘතියේ අදාල කටයුතු සඳහාත් ගිවිසුම සකස් කිරීම හා අනුමැතීනට අදාල කටයුතු සඳහාත් ගත වී ඇති කාලය අමාත්‍යාංශයේ විෂය පථයෙන් බැහැරය. සුහුරු පුවරු 1000 මිලදී ගැනීම අමප/24/0978/630/009 අමාත්‍යමණ්ඩල සංදේශයේ අනුමැතියෙන් සිදුකර ඇත.	චීන ආධාර යටතේ සුහුරු පුවරු 500 පළමුව ලබාගෙන ඒ අනුව නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීමට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගත යුතු වීම හා චීන ආධාරය ලබාගැනීමට කටයුතු කල යුතු වීම.

මෙහෙයුම් ඒකකයක් (Data centre), චිත්‍රාගාරයක් (Studio room), සම්මන්ත්‍රණ කාමරයක් (Conference room) ලබා දීමට අපේක්ෂිතව තිබුණි.
එහෙත් එම චීන ආධාරය ලැබී නොතිබියදී විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වියදමින් රු.මිලියන 1,762.11 ක් වටිනා සුහුරු පුවරු 1000ක් සහ ඊට අදාල අනිකුත් උපකරණ මිලදී ගැනීම සහ අනිකුත් සේවාවන් රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව හරහා සිදුකර ගැනීමට අදාල ප්‍රසම්පාදනය 2024 පෙබරවාරි 23, 2024 මැයි 14 සහ 2024 ජුනි 23 යන දිනයන්හි ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ කැබිනට් සංදේශ 03 කට ලද 2024 මාර්තු 12,2024 මැයි 28 සහ 2024 අගෝස්තු 06 යන දිනයන්හිදී ලද අමාත්‍ය මණ්ඩල අනුමැතියන් අනුව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදනය සිදුකර තිබුණි.

(ii) ප්‍රසම්පාදන කමිටුව, තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කාල රාමු

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.2, 4.2.2,4.2.3 හා 2.6 වගන්තිවල විධිවිධානවලට පටහැනිව ව්‍යාපෘතියේ කාර්යභාර නිලධාරියා වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් අධ්‍යාපන) තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයකු ලෙස පත්කිරීම, සැලසුම් කල ප්‍රසම්පාදන කාලරාමුවට සාපේක්ෂව මාසයක් වැනි ඉතා කෙටි කාලයක් තුල හේතු විරහිතව ප්‍රසම්පාදන රාමුව කෙටි කිරීම, ව්‍යාපෘති භාර අතිරේක ලේකම් කාර්යාලයෙන් ඉදිරිපත් කරන ලද තාක්ෂණික පිරිවිතර හා චීන නිෂ්පාදකයාගේ නම තාක්ෂණික ඇගයීම් කමිටුව සමාලෝචනයකින් තොරව ලංසු ලියවිලිවලට ඇතුලත් කිරීම සහ ප්‍රමාණාත්මක ප්‍රසම්පාදන පියවරයන් උල්ලංඝනය කරමින්

චීන ආධාර ව්‍යාපෘතිය යටතේ ලැබීමට නියමිත සුහුරු පුවරුවලට සමපාත වන ලෙස මෙම සුහුරු පුවරුද මිලදී ගතයුතු බැවින් ඒ සම්බන්ධයෙන් මනා දැනුවත්වීමක් සහිත පුද්ගලයෙකු වශයෙන් ඒ සම්බන්ධයෙන් කටයුතු කළ අතිරේක ලේකම් (තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් අධ්‍යාපන) තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා පත් කර ඇත. තවද, අතිරේක ලේකම් (තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් අධ්‍යාපන) විසින් ඉ-තැපැල මගින් හා ලිඛිතව පිරිවිතර ලබා දී ඇති අතර ඉදිරිපත් කරන ලද පිරිවිතර කෙටුම්පත් කරන ලද ලංසු ලියවිලිවලට ඇතුලත් කර, තාක්ෂණික ඇගයීම් කමිටුවට ලබාදීම, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2 (C) අනුව, ප්‍රසම්පාදන අස්ථිත්වයේ

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.2, 4.2.2,4.2.3 හා 2.6 වගන්තිවල විධිවිධානවලට අනුගත වෙමින් ප්‍රසම්පාදනයන් සිදුකිරීමට නිලධාරීන් කටයුතු කල යුතු වීම හා ඊට පටහැනිව ක්‍රියාකල නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කල යුතු වීම.

	සුහුරු පුවරු මිලදීගැනීම සිදුකර තිබුණි.	වගකීම වන අතර, අදාල කෙටුම්පත් කරන ලද ලංසු ලියවිලි සමාලෝචනය කර අනුමත කිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (a) II අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ වගකීම වේ. 2024.06.28 දින පැවැති තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීමේ දී අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව ඒවා අදාල පිරිවිතර මෙම ව්‍යාපෘතිය භාර අංශයෙන් ලිඛිතව ලබාගෙන ලංසු ලියවිලිවලට ඇතුලත් කළ යුතු බවට දැනුම් දුන් පරිදි, පිරිවිතර ලිඛිතව අත්සන් සහිතව ලබාගෙන කෙටුම්පත් කරන ලද ලංසු ලියවිලිවලට ඇතුලත් කර ඇත. අදාල පිරිවිතර හා දේශීය නියෝජිත ආයතනය අදාළ අංශයේ ලිඛිතව තහවුරු කිරීමෙන් පසුව 2024.07.03 දින ලංසු ලියවිලි තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අනුමත කර ඇත. අදාල පිරිවිතර කුමක් ද යන්න අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් කර ඇති බැවින්, තාක්ෂණික ඇගයීම් කමිටුවට පිරිවිතර වෙනස් කළ නොහැකි වේ.	
(iii)	ප්‍රසම්පාදන ක්‍රියාවලිය		
	a) චීන ආධාර ව්‍යාපෘතිය යටතේ ලබාගැනීමට යෝජිත සුහුරු පුවරු හා උපකරණවලට තාක්ෂණිකව සමපාතික වන සේ අදාළ උපකරණ සපයාගැනීම පදනම්ව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සෘජු ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කිරීම සාධාරණීකරණය කර තිබුණු නමුත් එය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ යොමුව 3.6 යටතට අයත් අවශ්‍යතාවයන්ට අනුකූල වී නොතිබුණි. එමෙන්ම යොමුව 3.5 සහ 3.6 හි ඉතා පැහැදිලිව භාවිතයේ පවත්නා උපකරණවලට සමවනු පිණිස නැවත ඇනවුම් කිරීම සාධාරණ වන අවස්ථාවක් විය යුතු බව	මෙම ප්‍රසම්පාදනයේ දී සෘජු ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කර ඇත්තේ, 2006 ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහයේ 3.5 සහ 3.6 හී ඇ III අනුව අවශ්‍ය උපකරණ හිමිකම් සහිත එකම තනි සැපයුම්කාර මූලාශ්‍රයකින් පමණක් ලබාගත හැකිවන විට සෘජු ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කිරීම යෝග්‍ය බව සඳහන් කර ඇත. 2024.05.14 දින ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3.1 හා 3.2 යෝජනා ද ඉදිරිපත් කර ඇත්තේ චීන ආධාර ව්‍යාපෘතියේ යටතේ චීන රජය මගින් අදාල උපකරණ සපයනු ලබන නිෂ්පාදකයා වෙතින්ම, රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මගින් අදාල මිල දී ගැනීම සිදුකර ගැනීම සඳහාය. ඒ අනුව, අමාත්‍ය	ප්‍රසම්පාදන මූලධර්මවලට සමපාත වන අයුරින් ප්‍රසම්පාදන සැලසුම් කර ක්‍රියාත්මක කර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතු වීම හා ඊට පටහැනිව කටයුතු කල නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කල යුතු වීම.

	සඳහන් කර තිබුණ ද මෙය භාවිතයේ පවත්නා උපකරණවලට සමවනු පිණිස කළ ප්‍රසම්පාදනයක් නොවන බව හා ඉදිරියේ දී ලැබීමට යෝජිත උපකරණවලට සමවනු පිණිස කළ ප්‍රසම්පාදනයක් වී තිබුණි.	මණ්ඩල අනුමැතිය යටතේ ඍජු ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කර මෙම ප්‍රසම්පාදනය සිදුකර ඇත.	
b)	මෙම ප්‍රසම්පාදනය ඉතා කෙටි කාලයක් තුල, ඉතා හදිසි ආකාරයෙන් 2024 අගෝස්තු 06 දිනැති ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල තීරණය නිකුත් කිරීමට පෙර ඊට අදාල සංදේශය අමාත්‍ය මණ්ඩලය සාකච්ඡා කර 3.1 සිට 3.6 දක්වා වගන්ති යෝජිත පරිදි ඉටුකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දුන් බව 2024 ජූලි 30 දිනැති "හදිසි-රහසිගතයි" සඳහන් ලිපිය අනෙකුත් පාර්ශවයන්ට පිටපත් සහිතව අධ්‍යාපන ලේකම්වරයාට නිකුත් කිරීමට අමාත්‍ය මණ්ඩලයේ ලේකම් තනතුර දරන අතිරේක ලේකම් විසින් කටයුතු කිරීමද විගණනයේදී අතාත්ත්වික තත්ත්වයක් ලෙස නිරීක්ෂණය කෙරේ. ඒ අනුව කිසිදු හදිසි ප්‍රසම්පාදන තත්ත්වයක් නොතිබියදී හදිසි තත්ත්වයක් ව්‍යාජ ලෙස ඇති කර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 යටතේ සඳහන් හදිසි ප්‍රසම්පාදන අවස්ථාවන් ලෙස සලකා මෙම ප්‍රසම්පාදන කාර්යය සිදුකර තිබුණි.	මෙම ප්‍රසම්පාදනය පිරිනැමීමට පෙර මෙම සියලු තීරණවලට අදාල යෝජනා ඉදිරිපත් කරන ලද 2024.07.23 දින අංක ED/PRO/24/71 අමාත්‍ය මණ්ඩල සංදේශයේ ඇතුලත් කර ඇති අතර ඊට අදාල අනුමැතීන් 2024.07.29 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ලබාදුන් බවටත් ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරන ලෙසත් 2024.07.30 දිනැති ලිපියෙන් අමාත්‍ය මණ්ඩල කාර්යාලයෙන් දැනුම් දී ඇත. (ඇමුණුම 45) එසේම, අදාල ප්‍රසම්පාදනය පිරිනැමීමට පෙර මුල් අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ සිදුකරන ලද සංශෝධනයන් සඳහා ද 2024.07.29 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.	ප්‍රසම්පාදන මූලධර්මවලට සමපාත වන අයුරින් ප්‍රසම්පාදන සැලසුම් කර ක්‍රියාත්මක කර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතු වීම හා ඊට පටහැනිව කටයුතු කල නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කල යුතු වීම.
c)	සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් මුල් අවස්ථාවේ දී රු.මිලියන 1,658.69 ක මිල ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණු අතර මිල කේවල් කිරීමෙන් පසු රු.මිලියන 1,493.31 ක් ලෙස ඇස්තමේන්තුව සංශෝධනය	ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව (STC) රාජ්‍ය ආයතනයක් ලෙස ලාභ ලැබීමේ පරමාර්ථයෙන් පිහිටුවා ඇති රාජ්‍ය ව්‍යවසායක් වන අතර, ඔවුන් විසින්ද ලාභයක් සහිතව මිල ගණන් ඉදිරිපත් කර ඇත. නමුත්, තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශය අනුව, SCAPC විසින්	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව ඍජු ප්‍රසම්පාදන කටයුතු සිදු නොකල යුතු වීම.

	කර තිබුණි. ඒ අනුව කේවල් කිරීමෙන් පසු රු.මිලියන 165.38 කින් ඇස්තමේන්තු වටිනාකම අඩු වී තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 10ක් වී තිබුණි. ඒ අනුව රාජ්‍ය ආයතනයක් වශයෙන් සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මුල් අවස්ථාවේදීම සර්ව සාධාරණ මිල ගණන් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.	මිල ගණන් අඩුකර ගැනීමට සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඔවුන් විසින් අදාල නිෂ්පාදන ආයතනය සමඟ සාකච්ඡා කර රු.මිලියන 165.38 කින් මිල අඩු කිරීමක් සිදුකර ඇති බව.	
d)	ලංසු ලියවිල්ලෙහි 14.1 හා 14.2 ප්‍රකාරව වසර 03 ක ස්ථානීය සවිස්තර වගකීමක් සහ අවශ්‍ය සේවා සහ නඩත්තු කටයුතු නිෂ්පාදකයා සහ දිවයින පුරා සිටින නිෂ්පාදකයාගේ බලයලත් නියෝජිතයන් සැපයිය යුතු බවත්, පශ්චාත් වගකීම් අමතර කොටස් සැපයීම (Post - warranty – spare – supply) වසර 05 ක කාලයක් සඳහා සහතික කල යුතු බවත් සඳහන් කර තිබුණද වගකීම් කාලය අතුරින් දෙවන සහ තුන්වන වසර තුළ නඩත්තු කටයුතු වෙනුවෙන් US$ 293,732 ක් හෙවත් රු.මිලියන 91 ක ඉහල මිල ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. තවද ලංසු ලියවිලිවල සඳහන් අවුරුදු 03ක වගකීම් කාලයට සැපයුම්කරු එකඟ නොවූ බැවින්, සැපයුම්කරු ලබාදෙන වර්ෂයක වගකීම් කාලයට අමතරව ලංසු ලියවිලිවල සඳහන් පරිදි වර්ෂ 03ක වගකීම් කාලය ලබාගැනීමට සැපයුම්කරුට රු.මිලියන 91ක අමතර ගෙවීමක් සිදුකල යුතු බවට වූ මූල්‍ය තොරතුරු අමාත්‍ය මණ්ඩල සංදේශයේ වෙන් වෙන්ව ඉදිරිපත් නොකර ප්‍රසම්පාදනයේ මුළු වටිනාකම පමණක් ඉදිරිපත් කරමින් අමාත්‍ය මණ්ඩලය නොමඟ	සැපයුම්කරු විසින් ලබා දී ඇත්තේ සාමාන්‍ය වෙළඳ නීතිය අනුව වසරක වගකීම් කාලයක් වන අතර, ලංසු ලියවිලිවලට අනුව වසර 03 කට අදාළව වගකීම් කාලයක් අවශ්‍ය බැවින් ඉදිරි වසර 02 සඳහා US$ 293,732 හෙවත් රු.මිලියන 91ක් අමතර ගෙවීමක් ලෙස සඳහන් කර මිල ගණන් ඉදිරිපත් කර ඇත. එම මිල ගණන් අඩු කිරීම සඳහා සැපයුම්කරු විසින් එකඟ නොවීම මත අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ප්‍රසම්පාදනය පිරිනමා ඇති බව.	කැබිනට් සංදේශය නිවැරදිව තොරතුරු සහිතව පිළියෙල කර ඉදිරිපත් කිරීමට බලධාරින් කටයුතු කළ යුතු වීම.

	යවන සුළු තොරතුරු ලබාදීමට අතිරේක ලේකම් (තොරතුරු තාක්ෂණ) ඇතුළු අදාළ වගකිව යුතු නිලධාරීන් කටයුතු කර තිබුණි.		

(iv) නිලධාරීන් පුහුණු කිරීම

a)	2024 දෙසැම්බර් 31 දිනට පෙර 2024 දෙසැම්බර් පාසල් නිවාඩු කාලයේදී ඉංජිනේරුවරයෙකු හා පුහුණුවලත් කණ්ඩායමක් මඟින් පාසල් 20ක සුහුරු පුවරු සවිකිරීමට සැලසුම් කර තිබුණි. සුහුරු පුවරු ස්ථාපනයට අදාලව මෙරටට ගෙන්වාගෙන ඇති ඉංජිනේරුවරයා සති 06ක පමණ කාලයකට පැමිණ තිබුණද මෙරටට පැමිණි ඉංජිනේරුවරයාගෙන් අදාල කාර්යයන් ඉටුකරවා ගැනීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණු අතර සුහුරු පුවරු 1,000ක්, 2024 දෙසැම්බර් 31 දින වන විටත් පත්තලගෙදර ගබඩාවේ පාසල්වල ස්ථාපනය කිරීමකින් තොරව පැවතුණි. 2024 ඔක්තෝබර් මාසයේ ලද සුහුරු පුවරු 2024 නොවැම්බර් මහ මැතිවරණය පසුවී 2025 මැයි 31 දින වන විට මාස 06ක් ගත වී තිබියදීත් ස්ථාපනය නොකර පැවතීම හේතුවෙන්, මැතිවරණ තත්ත්වයන් මත පාසල් තුල සුහුරු පුවරු ස්ථාපනය කිරීමට නොහැකි වූ බවට වූ පිළිතුර විගණනයේදී පිළිගත නොහැකි විය.	මැතිවරණ කාලසීමාවන් තුළ මෙම භාණ්ඩ බෙදාහැරීම නොකරන ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් දැනුම් දී තිබුණු බැවින් සුහුරු පුවරු බෙදාහැරීම නොකරන ලදී. පසුව එළැඹුණු තත්ත්වය යටතේ මෙතෙක් අදාල උපකරණ බෙදාහැර නොමැත. මෙම ප්‍රසම්පාදනයට අදාලව මිලදී ගැනීම ,බෙදා හැරීම ස්ථාපනය, පුහුණුව හා නඩත්තුව යන සියළු කාර්යයන් සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මගින් සිදුකර ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. සී/ස රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව මගින් තෝරාගන්නා ලද පද්ධති ස්ථාපනකරු (System Integrator) මගින් එම පද්ධති ස්ථාපනයට අදාල පුහුණුව ගුරුභවතුන් සඳහා ලබා දී ඇති බව.	අපේක්ෂිත ඉලක්ක නියමිත කාලරාමු තුල ළඟාකර ගැනීමෙන් අරමුණු ඉටුකර ගැනීමට බලධාරීන් කටයුතු කල යුතු වීම.

(v) නඩත්තු කටයුතු

a)	සුහුරු පුවරු මිලදීගැනීමේදී, ඉහළ ජීවන චක්‍ර පිරිවැය යන නිර්ණායකය පදනම්ව ඇගයීම් සිදුකර නොතිබුණි. මෙම උපකරණවල නඩත්තු වියදම් වෙනුවෙන් රු.මිලියන 254 ක මුදලක් සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත	අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ මෙම සියළු කාර්යන් සඳහා මිල ගණන් කැඳවා ඇති අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේම ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි නඩත්තු වියදම්ද ඇතුළුව රු.මිලියන 1,493.31 (වැට් රහිත) මුදලකට මෙම ප්‍රසම්පාදනය රාජ්‍ය වාණිජ	ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කිරීමේදී නඩත්තු හා සේවා පහසුකම් පිළිබඳ අවධානය යොමු කරලීම මගින් ව්‍යාපෘතිය තුලින් අපේක්ෂිත අරමුණු බිඳවැටීමකින් තොරව අඛණ්ඩව සිදුකරගෙන යාමට හැකි

	සංස්ථාව විසින් ඉල්ලුම් කර තිබුණු අතර ඒ අනුව මෙම ව්‍යාපෘතියේ නඩත්තු හා සේවා පහසුකම් සඳහා ඉතා අධික පිරිවැයක් දැරීමට සිදුවන බව නිරීක්ෂණය වූ අතර වසර 03 ක වගකීම් කාලයෙන් පසු ඉහත නඩත්තු වියදම් දැරීම සම්බන්ධව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තව දුරටත් දායකත්වය ලබාදෙන්නේද යන්න පිළිබඳ වූ නිශ්චිත එකඟතාවයකට එළඹ නොතිබුණි.	(විවිධ) නීතිගත සංස්ථාව වෙත පිරිනමා ඇත. අදාල ඇණවුම් ලිපිය පිරි නැමීමට පෙර මෙම සම්පූර්ණ වියදම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, ඉන් පසුව ඇණවුම ප්‍රදානය කර ඇත. ඒ අනුව නිශ්චිත එකඟතාවය ලැබීමෙන් පසුව පමණක් අදාල කටයුතු සිදු කර ඇති බව.	පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම.
c)	ආනයනය කරනු ලබන සුහුරු පුවරු 1000 සඳහා අඛණ්ඩව විදුලිය සපයා ගැනීම සඳහා අවශ්‍ය වන UPS 1000 සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මඟින් දේශියව මිලදීගැනීමට ස්ථාවර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් යෝජනා කර තිබුණි. ඒ අනුව රු.මිලියන 18 ක ඇස්තමේන්තු වටිනාකමට UPS 1000ක් මිලදීගැනීම සඳහා සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත ලංසු පිරිනමා තිබුණු අතර එය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ යොමුව 3.5 හා 3.6 යටතේ ඇතුලත් සෘජු ප්‍රසම්පාදන මුලධර්මයන්ට අනුකූල වී නොතිබුණි.	මෙම ව්‍යාපෘතියට අදාල පිරිවිතරවල UPS ඇතුලත්ව මිල ගණන් කැඳවූ නමුත් විදේශීය නියෝජිත ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ CIF මිල ගණන් තුල UPS මිල ගණන් ඇතුලත්ව නොතිබූ බැවින්, අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ මිල දී ගැනීමට කටයුතු කර ඇත. එසේම, රු.මිලියන 50 ට වඩා අඩු මිල දී ගැනීම් සඳහා සෘජු ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් (STC) මිල දී ගැනීමට වෙනම අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා දී ඇත. (ඇමුණුම 46) තවද, 2024.05.14 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් ඉදිරිපත් කර ඇති යෝජනා අංක 3.3 යටතේ ද අනුමැතිය ලැබී ඇති බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ යොමුව 3.5 හා 3.6 යටතේ ඇතුලත් සෘජු ප්‍රසම්පාදන මුලධර්මයන්ට අනුකූලව කටයුතු කල යුතු වීම.

(vi) පාසල් තුල අවශ්‍ය යටිතල පහසුකම්

a)	අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතිය සම්බන්ධව පාසල් වෙත දැනුම් දීම සිදුකරන අවස්ථාව වන විටත් සුහුරු පුවරු ආනයනය කර අවසන් වී තිබුණි. එම ලිපිය ප්‍රකාරව සුහුරු පුවරු ස්ථාපනය සඳහා පාසලෙහි පැවතිය යුතු යටිතල පහසුකම් හා මානව සම්පත් පිළිබඳ අවධාරණය කර තිබුණු අතර රැහැන් සහිත Fiber	උපකරණ මෙරටට ලැබීමට පෙර පාසල් දැනුවත් කිරීම,අවශ්‍ය උපදෙස්,මාර්ගෝපදේශ ලබා දුනි. ඒ අනුව මැතිවරණ කාලයේදී පාසල් සඳහා සුහුරු පුවරු ලබා දීම දැනුවත් කිරීම සිදු නොවිය. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පාර්ශවකරු විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වන හෙයින් මෙම පාසල් 1000 ප්‍රමුඛ සේ සලකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සපුරාගැනීමට ඇති හැකියාව පිළිබඳව අවධානය යොමු කිරීමට කටයුතු කල යුතු වීම.

	අන්තර්ජාල පහසුකම් පැවතිය යුතු බව ද සඳහන් කර තිබුණි. එසේ වුවද තෝරාගන්නා ලද පාසල් 1000 අතුරින් පාසල් 121 ක Fiber අන්තර්ජාල පහසුකම් නොතිබුණි.	හා ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන ෆයිබර් (Fiber)ව්‍යාපෘතියට ෆයිබර් සම්බන්ධව ගැටළු පවතින පාසල් ලේඛනයක් මුල් අවස්ථාවේ ඉදිරිපත් කර තිබුණි. අන්තර්ජාල පහසුකම් ගැටළුකාරී තත්ත්වයන් පවතින පාසල් 26 ක් සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම සමග මේ වන විටත් කටයුතු කරමින් පවතින අතර අන්තර්ජාල පහසුකම් ලබා දීමට අදාල සංවර්ධන කටයුතු සිදු කර විකල්ප ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	
(vii)	අරමුණුගතව නොයොදවා නිෂ්කාර්යව පැවතීම		
a)	සාමාන්‍ය අධ්‍යාපනය ඩිජිටල් පරිවර්තනයකට ලක් කිරීමේ ව්‍යාපෘතියක් සඳහා රු.මිලියන 1,493.31 ක මුදලකට සුහුරු පුවරු 1,000ක් මිලදීගැනීමේදී එම සුහුරු පුවරු අරමුණුගතව යෙදවීමට අවශ්‍ය යටිතල පහසුකම් සපයා ගැනීම්ද ඇතුළුව දීර්ඝකාලීන මෙහෙයුම් සැලැසුමක් සකස්කර නොතිබීම හේතුවෙන් මිලදීගැනීමට සමගාමීව අනෙකුත් යටිතල පහසුකම් ඇතුළු මෙහෙයුම් කටයුතු සම්පූර්ණ වී නොතිබීම තුල රටක් ලෙස ඒ සම්බන්ධයෙන් ආවස්ථික පිරිවැයක් දරන අතර 2024 ඔක්තෝබර් 07 දින ගබඩාවට ලැබී තිබුණු සුහුරු පුවරු 2025 මැයි 31 දින වන විටත් මාස 08ක් උපයෝජනයකින් තොරව පැවතුණි. 2025 මැයි 31 දින වන විටත් උපකරණ ලැබී මාස 08ක කාලයක් උපයෝජනයකින් තොරව පැවතීම තුල අවුරුදු 01ක වගකීම් කාලයෙන් මාස 08ක් ගබඩාව තුලම ගත වී ඇත. උක්ත සඳහන් සියළුම විධිවිධාන උල්ලංඝනය	මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාල යටිතල පහසුකම් සකස් කර මධ්‍යගත පද්ධතිය ක්‍රියාත්මක තත්වයට පත් කර අදාල මානව සම්පත් පුහුණු කිරීම පිළිබඳ විධිමත් සැලැස්මක් තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් අධ්‍යාපන අංශය ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතියට අදාලව නිර්දේශ ලබා ගැනීම සඳහා පත්තරන ලද විශේෂඥ කමිටුව විසින් අවස්ථාවන් දෙකකදී අදාල වාර්තාවන් ද ලබා දී ඇත. ජනාධිපතිවරණය හා මහ මැතිවරණය පැවැත්වීම හේතුවෙන් අදාළ බෙදාහැරීම් සිදු නොකරන ලෙස මැතිවරණ කොමිසම විසින් දන්වා තිබුණි. පසුව මේ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා විශේෂ කමිටුවක් මා විසින් පත්කර තිබුණු අතර, අදාළ කමිටුවේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා බෙදාහැරීම් තාවකාලිකව නතර කර තිබුණු අතර, තවදුරටත් මේ පිළිබඳව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය කරුණු සොයා බලමින් පවතී.	දීර්ඝකාලීන මෙහෙයුම් සැලැස්මක් සකස් කිරීමට කටයුතු කිරීමත්, යටිතල පහසුකම් ලබා දී භාණ්ඩ නියමිත පරිදි වහාම පාසල් වෙත සවි කිරීමට කඩිනම්ව සිදු කල යුතු වීම.

කරමින්, චීන ආධාර යටතේ සුහුරු පුවරු 500ක් ලබා නොගනිමින් සිදුකරන ලද සුහුරු පුවරු මිලදීගැනීමේ හදිසි ප්‍රසම්පාදන සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී, අතිරේක ලේකම් (තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් අධ්‍යාපන) තාක්ෂණ ඇගයීම් කමිටු සාමාජිකයින් වගකීමට යටත් වන අතර මෙම ව්‍යාපෘතිය ඉටුකරගත නොහැකි වීමේ තත්ත්වයක් තුල රජයට සිදුවන මුල්‍යමය හානිය ඉහත නිලධාරීන් දැරිය යුතුව පැවතුණි.

(ඇ) NEMIS දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරිම සඳහා ලැප්ටොප් පරිගණක 328ක් මිලදීගැනීම

a) NEMIS දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරිම වෙනුවෙන් දත්ත කළමනාකරණ ශාඛාව සඳහා ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යටතේ වටිනාකම රු.මිලියන 78.4 ක් වූ ලැප්ටොප් පරිගණක 328 ක් කොන්ත්‍රාත් සමාගමෙන් මිලදීගැනීමට කටයුතු කර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2024 මාර්තු 08 දිනට භාණ්ඩ සැපයීම සිදුකර නොතිබුණු අතර ගිවිසුම ප්‍රකාරව ලැප්ටොප් පරිගණක සැපයීම, බෙදාහැරීම හා ස්ථාපනය කිරිම යන සියලුම කාර්යයන් පිරිනමා තිබුණද පිළිතුරෙහි සඳහන් පරිදි ප්‍රසම්පාදන කාර්යය මිලදීගැනීමට පමණක් සිදුකල ලෙස සඳහන් කිරිම ලංසු ලියකියවිලි හා ඒ ආශ්‍රිත ලියවිලි අනුව නිවැරදි නොවුනු අතර අමාත්‍යාංශයේ මධ්‍යම ගබඩාව වෙත 2024 මාර්තු 13,14,15 යන දිනයන්හී භාණ්ඩ සැපයීම සිදුකර තිබුණුණි. එම සපයා ඇති ලැප්ටොප් පරිගණක ලංසු

ලංසු ලියවිලි ප්‍රකාරව මෙම ප්‍රසම්පාදනය සිදු කර ඇත්තේ භාණ්ඩ මිලදීගැනීම සඳහා පමණක් වන අතර, මේ තුළ ස්ථාපනය හා බෙදාහැරීම ඇතුළත්ව නැත. ලංසු ලියවිලි ප්‍රකාරව අදාළ භාණ්ඩ භාරදිය යුතු ස්ථානය අමාත්‍යාංශයේ මධ්‍යම ගබඩාව ලෙස සඳහන් කර ඇත. ලංසු ලියවිලි ප්‍රකාරව අදාළ භාණ්ඩ මධ්‍යම ගබඩාවට සැපයීමට පෙර සැපයුම්කරුගේ ගබඩාවේදී පරීක්ෂා කිරීමට අවස්ථාව ලබාදිය යුතු වුවත් සැපයුම්කරු විසින් එම අවස්ථාව ලබා නොදී සෘජුව ඇණවුම් ලිපියේ සඳහන් භාණ්ඩ භාරදීමේ ස්ථානය ලෙස සඳහන් කර ඇති ගබඩාවට භාණ්ඩ පරීක්ෂා කිරීමේ කොන්දේසියට යටත්ව අදාළ පරිගණක භාර දී ඇත. නමුත් අදාළ තාක්ෂණික තහවුරුව ලැබෙන තෙක් මෙම පරිගණක ගබඩා පොත්වලට ඇතුළත් කර නොමැත. මේ සම්බන්ධයෙන් අදාළ ආයතනය විසින් නඩුවක් ගොනු කර ඇති බැවින් නඩුවේ තීන්දුව ලැබෙන තෙක් නීත්‍යානුකූල පියවර ගැනීමට අතිරේක ලේකම්

ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග නොගත් නිලධාරීන්ට හා භාණ්ඩ පිරිවිතරවලට අනුකූල බව පිළිගත නොහැකිව තිබියදීත් භාණ්ඩ භාර ගැනීමට කටයුතු කල නිලධාරීන් සම්බන්ධයෙන් නිසි අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වීම.

ඇගයීමේදී ඉදිරිපත් කළ සාම්පල අනුව වූ පිරිවිතරවලට අනුකූල ම බව පිළිගත නොහැකිව තිබියදී අමාත්‍යාංශය විසින් භාණ්ඩ භාරගැනීමට කටයුතු කර තිබුණද, ගිවිසුම ප්‍රකාරව නියමිත දිනට භාණ්ඩ නොසැපයීම හා භාණ්ඩ සැපයීමට පෙර සැපයුම්කරුගේ ගබඩාවේදී තත්ත්ව පරීක්ෂාවක් සිදුකිරීම යන ගිවිසුම් කොන්දේසි උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත් සමාගමට නීත්‍යානුකූල පියවර ගැනීමට අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) ඇතුළු නිලධාරීන් කටයුතු කර නොතිබුණු අතර අදාල සමාගම මුදල් නොගෙවීම සම්බන්ධයෙන් නඩු පැවරීම සිදුකර තිබුණි. 2025 සැප්තැම්බර් 30 වන විටද එම නඩු කටයුතු අවසන් වී නොතිබුණු අතර රු.මිලියන 78.4 ක් වටිනා ලැප්ටොප් පරිගණක 328 අවුරුදු 2ක පමණ කාලයක සිට ගබඩාවේ තාක්ෂණික තත්ත්වයන්ගෙන් බැහැර වෙමින් පැවතුණි.	(ප්‍රසම්පාදන) වෙත බලයක් නොමැත. නමුත් නඩු පැවරීමට පෙර අදාළ භාණ්ඩ රැගෙන යන ලෙස අදාළ ආයතනයට දැනුම් දුන් අතර, ලංසු ලියවිලි ප්‍රකාරව කාර්ය සාධන ඇපකරය පවරා ගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී. මේ සම්බන්ධයෙන් නඩු කටයුත්තක් පවතින බැවින් එම නඩුවේ තීන්දුව ලැබෙන තෙක් තවදුරටත් කටයුතු සිදු කිරීමට නීතිමය හැකියාවක් අමාත්‍යාංශයට නොමැත.	

(ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවීම

2006 භාණ්ඩ හා වැඩ පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 හා 4.3.2 ප්‍රකාරව ප්‍රසම්පාදනයට අදාළව සියලුම ආශ්‍රිත වියදම් ඇතුළුව ප්‍රසම්පාදනයේ සූදානම් වීමේ කටයුතුවල වියදම්, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසු කටයුතුවල වියදම්, අවිනිශ්චිත ප්‍රතිපාදන ඇතුළත්ව අදාළ වැට් බදු වෙන් වශයෙන් දක්වමින් වඩාත් නිවැරදි ලෙස මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ සඳහන් අදාල අධිකාරිය විසින් අනුමත කළ යුතු වුවත්, අමාත්‍යාංශයේ	2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රසම්පාදන අංශයෙන් සිදුකරන ලද ප්‍රසම්පාදනයන් සංඛ්‍යාව 36 ක් වේ. ඉදිකිරීම් සඳහා ඔබ පෙන්වා දී ඇති පරිදි සියලුම වියදම් ඇතුළත්ව මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කළ යුතු වුවද ප්‍රසම්පාදන අංශයෙන් 2024 වර්ෂය තුළ සිදුකර ඇත්තේ භාණ්ඩ හා සේවා, උපදේශන සේවා ප්‍රසම්පාදනයන් බැවින් ඒ සඳහා ද ඒකක පිරිවැය ඇතුළත් (බදුද ඇතුළත්ව) දළ ඇස්තමේන්තුවක් සකස් කර ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර අනුමතවීමෙන් පසුව අදාල මිලදීගැනීම් සිදුකර ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් පරිදි නිවැරදිව මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කළයුතු බව හා එය අදාල අධිකාරිය විසින් අනුමත කළයුතු වීම.

	ප්‍රසම්පාදන කාර්යයන් සඳහා නිවැරදි ආකාරයේ මුළු පිරිවැය ඇස්තමේන්තු ඒ ඒ අංශ විසින් සකස් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී එවැනි භාණ්ඩ, වැඩ, සේවාවන්ට අදාල ප්‍රසම්පාදන කාර්යයන් 136ක් හඳුනාගත හැකිවිය. ඒ හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රමය, අධිකාරී සීමාව ඉක්මවීම් වැනි ප්‍රසම්පාදනයේ වැදගත් පියවරයන් බිඳවැටීම සිදුවී තිබුණි.	එසේම අදාළ ප්‍රසම්පාදනයන් පිරිනමා ඇත්තේ සෘජුව සැපයුම්කරුවන් විසින් අදාළ ස්ථානයට බෙදාහැරීම සඳහා වන බැවින් සියළු පිරිවැය ඒකක පිරිවැය තුළ අතුළත් කර ඇස්තමේන්තු පිරිවැය සකස් කර ඇති බව.	
(ඊ)	2023 අප්‍රේල් 19 දිනැති PED/චක්‍රලේඛ 08/2019(I) දරන චක්‍රලේඛය අනුව රු.මිලියන 200ට වැඩි ප්‍රසම්පාදන කාර්යයන් අනිවාර්යයෙන්ම e-GP පද්ධතිය හරහා සිදුකළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබුණු රු.මිලියන 200ට වැඩි ප්‍රසම්පාදන කාර්යයන් 05ක් සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි.	නමුත් ඉදිරියේදී ඔබ පෙන්වා දී ඇති පරිදි පුවත්පත් දැන්වීම් පළ කිරීමට අමතරව ඉලෙක්ට්‍රොනික් පද්ධතියේ ද පළ කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනයට සටහන් කර ගත් බව.	ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය තහවුරු වන පරිදි රජය විසින් හඳුන්වා දී ඇති e-GP පද්ධතිය හරහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කළයුතු අතර යොමුගත චක්‍රලේඛය අනුව කටයුතු සිදුකළ යුතු වීම.
(උ)	වෙනිවැල්කොළ ශිෂ්‍යෝදා මධ්‍යස්ථානය		
	2024 ප්‍රසම්පාදන සැලැස්මට අනුව ශ්‍රවණාබාධිත දරුවන්ගේ ශ්‍රවණ මට්ටම මැන බැලීම සඳහා වෙනිවැල්කොළ ශිෂ්‍යෝදා මධ්‍යස්ථානය සඳහා මිලදීගෙන තිබුණු ශ්‍රවන මීටරය (Audio Meter) ඉන්වෙන්ට්‍රි ගතවීමක් සිදුවී නොතිබියදී 2024 ජූලි 26 දින රු.මිලියන 1.75ක් ගෙවීම් කිරීමට ප්‍රසම්පාදන අංශයේ ගණකාධිකාරී විසින් කටයුතු කර තිබුණු අතර එය 2025 අප්‍රේල් 21 දින දක්වා ශිෂ්‍යෝදා මධ්‍යස්ථානය වෙත භාරදීමෙන් තොරව මාස 9 කට අධික කාලයක් විශේෂ අධ්‍යාපන ඒකකයේ රඳවාගෙන 2025 අප්‍රේල් 22 දින වෙනිවැල්කොළ ශිෂ්‍යෝදා මධ්‍යස්ථානයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර තිබුණි. තවද, මෙම උපකරණය භාවිතයට සුදුසු පරිදි සවිකිරීමේ ඉදිරි කටයුතු සම්බන්ධයෙන් අදාළ සැපයුම්කරු	ශ්‍රවණ මීටරය (Audio Meter) ශිෂයෝදා ආයතනයේ බඩු වට්ටෝරු පොතට ඇතුලත් කර ඇති අතර, මෙම වර්ෂයේ අළුත්වැඩියා වියදම් සඳහා වෙන්ව ඇති ප්‍රතිපාදන මඟින් ශිෂයෝදා ආයතනයේ ශ්‍රවණ පිරික්ෂණ කාමරය ශබ්ද නිරෝධනය කිරීමට කටයුතු සැලසුම් කර ඇත. එමෙන්ම මෙම උපකරණය භාවිතා කිරීම සඳහා පුහුණුවක් ලබාදීමට අදාළ ආයතනය සමඟ සාකච්ඡා කර ඇති බව.	අවශ්‍යතාවය හා ප්‍රමුඛතාවය අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් උපරිම ආර්ථික වාසි ලබාගත හැකිවන පරිදි භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කළයුතු බව හා ගෙවීම් කිරීමට පෙර අදාල අංශ වෙත ලැබුණු බවට හා ඉන්වෙන්ට්‍රි ගතකළ බවට තහවුරු කිරීම් ලබාගත යුතු වීම.

	සමඟ ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණු අතර එම උපකරණය භාවිතයට අදාළව පුහුණුවක්ද ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.		
(ඌ)	ඕස්ට්‍රේලියාවේ Flinders විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පර්යේෂණ, ඇගයීම් හා තක්සේරුකරණය පිළිබඳ අධ්‍යාපන උපාධිය හැදෑරීමට ලෝක බැංකු TSEP ව්‍යාපෘතියේ රු.මිලියන 8ක මූල්‍යාධාර යටතේ විභාග දෙපාර්තමේන්තුවේ සේවය කළ නිලධාරිනියකු තෝරාගෙන තිබුණද අමාත්‍යංශ ප්‍රසම්පාදන කමිටු තීරණය ප්‍රකාරව මෙම පාඨමාලාව හැදෑරීමෙන් පසු විභාග දෙපාර්තමේන්තුවට තම සේවය ලබාදෙන බවට සේවා ගිවිසුමකට එළඹී නොතිබුණි. එම නිලධාරිනිය විභාග දෙපාර්තමේන්තුවෙහි කෙටි කාලසීමාවක් සේවය කර විදුහල්පති තනතුර සඳහා නිදහස් කිරීමට කටයුතු කර තිබීම හේතුවෙන් රජය එම මුදල් වියදම් කළ අරමුණේ අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට විභාග දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	ප්‍රසම්පාදන කමිටු තීරණවලට හා ඊට අදාල නීතිරීතිවලට පටහැනිව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

4.10 කොන්ත්‍රාත්තුවල ඉදිකිරීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	ඉසුරුපාය ගොඩනැගිලි සංකීර්ණය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය		
(අ)	ඉසුරුපාය ගොඩනැගිලි සංකීර්ණයේ 6,7 මහල් පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2013 අගෝස්තු 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ඉදිකිරීම් ආශ්‍රිත වැඩ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරා තිබුණි. ඒ අනුව, 2014 අප්‍රේල් 20 දින වැඩ ආරම්භ කර දින දීර්ඝ කිරීම් සහිතව 2018 සැප්තැම්බර් 15 දින වැඩ අවසන් කර 2019 පෙබරවාරි 26 දින භාරදී	ඉසුරුපාය ගොඩනැගිල්ල පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ 1 වන අදියර 2014 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති අතර 2019 වර්ෂයේ කොන්ත්‍රාත්තුව නිම කර ඇත.එහෙත් එම ආයතනය වෙත අවසන් බිල්පත නිරවුල් කිරීමේ කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ස්ථාවර මිල කමිටුව වෙත ලබාදිය යුතු ලියකියවිලි ලබාදීමට ඇති වූ ප්‍රමාදය හේතුවෙන් ස්ථාවර	කොන්ත්‍රාත් පරිපාලනයේ හා කළමනාකරණයේ පවතින දුර්වලතා මඟ හරවාගෙන වැය කරන ලද මුදලට සරිලන පරිදි පූර්ණ ලෙස උපයෝජනය කළහැකි වන පරිදි ඉදිකිරීම් කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළයුතු වීම.

	තිබුණි. ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුවේ පූර්ව අනුමැතිය ලබානොගෙන විචලනයන් සඳහා රු.මිලියන 65.49 ක් හා වර්තමාන වටිනාකම් (Provisional Sum) සඳහා රු.මිලියන 6.15ක් වශයෙන් එකතුව රු.මිලියන 71.63 ක් ගෙවා තිබුණි. කොන්ත්‍රාත් කොන්දේසි අනුව ගිවිසුමට මිල විචලතා සඳහා අදාල Input Percentages ඇතුලත් කර නොතිබියදී රු.මිලියන 6.73 ක් ගෙවීම් කර තිබුණු අතර 2023 නොවැම්බර් 29 දිනැති ගෙවීම් සහතික 55 අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත රු.මිලියන 6.76ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.	මිල කමිටුවේ මිල ගණන් අමාත්‍යාංශය වෙත ලබාදීමේ ප්‍රමාදය මත බිල්පත් නිරවුල් කිරීමට නොහැකි වී ඇත.කෙසේවුවද එම කමිටුව මඟින් අදාල වාර්තාව සකස් කිරීමට ගෙවිය යුතු මුදල දන්වා ඇති අතර එම ගෙවීම සිදු කිරීමට කටයුතු කර ඇත. එම ගෙවීම් සිදුකල පසු අදාල මිළ ගණන් වාර්තාව ලබාදීමෙන් පසු අවසන් බිල්පත සකස් කිරීමට අපේක්ෂා කරන බව.	
(ආ)	ඉසුරුපාය ගොඩනැගිලි සංකීර්ණය පුළුල් කිරීමේ ව්‍යාපෘතියෙහි පළමු අදියරට අදාල විචලනයන්හි “රේට” සඳහා ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුවේ පූර්ව අනුමැතිය ලබාගෙන ගෙවීම් කලයුතු වුවද, අනුමැතිය ලබාගෙන නොතිබියදී ගෙවීම් බිල්පත් (IPC) 54ක් ඇතුළතදී විචලනයන් (Variations) වලට අදාලව රු.මිලියන 65.49 ක් හා වර්තමාන වටිනාකම ලෙස (P.S.) රු.මිලියන 6.15 ක් සඳහා නිර්දේශය අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉංජිනේරු විසින්ද, සහතික කිරීම අධ්‍යක්ෂ (ඉංජිනේරු) විසින්ද, අනුමැතියද අතිරේක ලේකම් (ඉංජිනේරු) විසින්ද 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලසීමාවේදී සිදුකර තිබුණු අතර ඒ සඳහා වගකිව යුතු නිලධාරීන් අධිකාරී බලයක් නොතිබියදී එසේ සිදුකර තිබුණි. එමෙන්ම විගණිත දිනය වූ 2025 මාර්තු 31 දින දක්වාම අදාල රේට සඳහා ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතිය ලබාගැනීමට නොහැකි වී තිබුණි.	ඉසුරුපාය ගොඩනැගිල්ල පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ II අදියර වන එහි I වන අදියරේ ඉදිකිරීම් සිදුකර ඇති මහල් දෙකේ අභ්‍යන්තරයේ සිදුකල යුතු වැඩිදියුණු කිරීමකි. එම කොන්ත්‍රාත්තුව 2018 වර්ෂයේ වැඩ ආරම්භ කරන ලද අතර, කොන්ත්‍රාත් කටයුතු අවසන් කිරීම සඳහා 2020 දෙසැම්බර් 31 දන්වා දින දීර්ඝ කර තිබුණු නමුත් එම කාලය තුළ පැවති කොවිඩ් 19 තත්ත්වය හා අධ්‍යාපන අමාත්‍යාංශය ඉංජිනේරු අංශය සම්පූර්ණයෙන්ම කාන්තා හා ළමා සංවර්ධන, පෙරපාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය වෙත මාරුවීමත් සමඟ හදිසියේම මෙහි කටයුතු අතර මග නැවතී ඇත. තවද රටේ පැවති ආර්ථික අර්බුදය හමුවේ අමුද්‍රව්‍ය මිළ අසාමාන්‍ය ලෙස ඉහල යාමත් කොන්ත්‍රාත්තුවේ මිල විචලනයන් සඳහා ගෙවීමේ ක්‍රමවේදයක් නොමැති කම නිසාත් කොන්ත්‍රාත්තුව සඳහා ඉංජිනේරුවරයකු නොමැති වීමත් වැනි කරුණු මත කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩ කටයුතු විධිමත්ව ඉදිරියට කරගෙන යාමට නොහැකි වී ඇත. පසුව ඉංජිනේරු අංශය නැවත මෙම අමාත්‍යාංශය ස්ථාපිත	කොන්ත්‍රාත් විචලනයන්හි රේට සඳහා පූර්ව අනුමැතිය ලබාගෙන ගෙවීම් කළයුතු වීම.

		වුවත් කොන්ත්‍රාත් මිළ ගණන් ඉහළ යෑම සමඟ කොන්ත්‍රාත්කරු විසින් තවදුරටත් පැරණි මිළ ගණන් යටතේ ඉතිරිවැඩ කටයුතු කරගෙන යාම සඳහා එකඟ නොවීය. මේවන විට නව මිළ ගණන් යටතේ ඉතිරි වැඩ කොටස් ඉටු කරවා ගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කරගෙන යමින් පවතින බව.	
(ඇ)	2020 දෙසැම්බර් 28 දිනට අදාළ කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු බිල්පත අනුව වැඩබිමේ පවතින අමුද්‍රව්‍ය වලින් සියයට 80ක් ලෙස රු.මිලියන 21ක් අධ්‍යාපන අමාත්‍යාංශයේ සිවිල් ඉංජිනේරුගේ නිර්දේශය මත ගෙවීම් කර තිබුණද එම අමුද්‍රව්‍ය වැඩබිමේ සත්‍ය වශයෙන් පවතින බවට හා ඒවායේ ගුණත්වය සම්බන්ධයෙන් අධීක්ෂණ ඉංජිනේරුවරයාගේ සහතිකයක් ලබාගෙන නොතිබුණි. ඒ යටතේ රු.මිලියන 8 ක් වූ Sound system එකක් හා රු.මිලියන 17.55 ක්වූ Auditorium chairs 859ක් සඳහා ගෙවීම් කර තිබුණි. එම උපකරණ ලබාගෙන වසර 5 කට ආසන්න කාලයක් ගත වී තිබුණද අදාළ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා ඇති බැවින් එම උපකරණවල වගකීම් කාලය අවසන් වීම හා උපකරණවලට හානි වීම මෙන්ම තාක්ෂණිකව යල් පැන තිබුණි. මේ සඳහා නිර්දේශය, අනුමැතිය ලබාදී ගෙවීම් කල ඉංජිනේරු හා ගිණුම් යන අංශවල නිලධාරීන් වගකිව යුතුව පැවතුණි.	විචලනයන්ට අදාළ මිළගණන් ස්ථාවර මිළ කමිටු අනුමැතියට කිහිප විටක් යොමුකරන ලද නමුත් ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව විසින් යොමුකරන ලද විවිධ ගැටළු හේතුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය තුල මේ සඳහා කාර්යමණ්ඩලය 2021 සහ 2022 වසර වල නොසිටීම හේතුවෙන් ස්ථාවර මිළ කමිටුවේ අනුමැතිය ලබාගැනීමට නොහැකි වී තිබුණු බව සත්‍යයකි. එසේ නමුත් ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාවේ උපදේශන අංශයේ ඉංජිනේරු (මෙම කර්මාන්තයට අදාළ අභිනව ඉංජිනේරු) විසින් මෙම මිළ ගණන් පරීක්ෂා කර අප වෙත යොමු කර තිබුණද මෙම අමාත්‍යාංශයේ කාර්මික නිලධාරීන් නොමැති වීම නිසා බිල්පත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙතද යොමුකර නිර්දේශ ලබාගෙන ඇත. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් විටින් විට ගෙවීම් ඉල්ලීම් ඉදිරිපත් කරන විට නිවැරදිව විචලන අනුමැතියකින් තොරව ඔවුන් හට ගෙවීම් කිරීම නොහැකි බැවින් එවකට තොරතුරු වලින් උපදේශනයේ අනුමැතිය ලද විචලන වලින් සියයට 80 ප්‍රතිශතයක් ගණනය කර රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත රු.මිලියන 6.15ක් වැඩිපුර ගෙවා ඇති බව පෙන්වා දීමක් පමණක් සිදුකර ඇත.	නිවැරදි අධිකාරී බලය යටතේ නිසි ක්‍රමවේදයන්ට අනුව ගෙවීම් කිරීමට කටයුතු කළයුතු වීම හා කාලීනව අරමුණු ඉටු කර ගැනීමටද වසර 6කට අධික කාලයක් නිම් උපකරණ තාක්ෂණිකව යල්පැනීමට වගකිව යුතු ඉංජිනේරු අංශය හා ගෙවීම් සම්බන්ධයෙන් ගිණුම් අංශයේ නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගතයුතු වීම.

4.11 වත්කම් කළමනාකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අධ්‍යාපන අමාත්‍යාංශයේ අකුණු සන්නායක පද්ධතිය හා සම්බන්ධ රු.මිලියන 7 ක ඇස්තමේන්තුගත වටිනාකමක් ඇති තඹ තහඩු හා අනෙකුත් උපාංග පද්ධතිය අස්ථානගත වීම 2023 අප්‍රේල් මාසයට පෙරදී සිදුවී තිබුණු බව විගණනයට නිරීක්ෂණය වුවත් 2024 නොවැම්බර් 11 දින සිට ප්‍රමාදව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු ආරම්භ කර තිබුණි. ඒ අනුව මුදල් රෙගුලාසි 103(1) හි නැතිවීම සිදුවන කල්හි ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ සාරාංශය ප්‍රකාරව 2025 මාර්තු 28 විගණිත දින වන විට මෙම අස්ථානගතවීම සිදු වී මාස 03 ක කාලයක් ඉක්මවුවද මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු සිදුකර නොතිබුණි.	අමාත්‍යාංශයේ අකුණු සංන්නායක පද්ධතියේ තඹ කම්බි හා අනෙකුත් උපාංග අස්ථානගත වී ඇති අවස්ථාව වන විට මේ අදාළ කොන්ත්‍රාත් සමාගම විසින් නිමකර අමාත්‍යාංශය වෙත විධිමත්ව භාර දී තිබුණු පද්ධතියක් ද යන්න සහ තඹ පටි අස්ථානගත වන අවස්ථාව වන විට මෙම අකුණු සන්නායක පද්ධතිය ක්‍රියාත්මක තත්වයේ පැවතියේ ද යන්න සම්බන්ධයෙන් අදාළ අංශ වෙතින වාර්තා කැඳවා ඇති බව හා මේ සම්බන්ධයෙන් තලංගම පොලිසිය වෙත අංක GCIB-358/102 යටතේ පැමිණිල්ලක් සිදුකර ඇත. මූ.රෙ 104 යටතේ අලාභයක් පිළිබඳව ප්‍රාරම්භක වාර්තාවක් සකස් කළ ද ඒ සඳහා මූලික පරීක්‍ෂණයක් සිදුකිරීම මේ වන විට ආරම්භ කර ඇත	මුදල් රෙගුලාසි 103(1) ප්‍රකාරව භාණ්ඩ නැතිවීම සිදුවන කල්හි ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව කටයුතු කර, අලාභ අයකර ගැනීමට කටයුතු කල යුතු වීම.
(ආ)	අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නමට ලියාපදිංචි කරන ලද මෝටර් රථ 139 ක් අමාත්‍යාංශය සතුව නොපැවතුණි.	වාහන 139ක තොරතුරු දැනට සොයා ගැනීමට හැකියාව ලැබී නැත.එම වාහන 139 අතරින් වාහන 129ක් වසර 30කට වඩා පැරණි ඒවාය. එම කාලසීමාව තුළ නව පළාත් සභා පිහිටුවීම හේතුවෙන් කලාප කාර්යාල මගින් එම වාහන පළාත් පාලන ආයතන වෙත ලබාදීම හා ඉන් අනතුරුව ඇතැම් වාහන අපහරණ ක්‍රියාවලීන්ට යොමුකිරීම සිදු වූවාද විය හැක. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ආයතන, ව්‍යාපෘති වෙත හෝ වෙනත් ආයතන වෙත පවරාදීමේදී හෝ තාවකාලිකව ලබාදීමේදී ඒ පිළිබඳ තොරතුරු සටහන් වූ ලේඛන දැනට සොයා ගැනීමට නොහැකි වීම මත එම වාහන පිළිබඳ තොරතුරු සොයා ගැනීමට අපහසුය. .	අමාත්‍යාංශ ලේකම්ගේ නමට ලියාපදිංචි වී ඇති වාහන නිවැරදිව හඳුනාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගතයුතු බව හා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපනය කළ යුතු වීම.

4.12 **පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පිරිවෙන් අංශයේ සවිකර තිබුණු CCTV කැමරා 02 ක් අස්ථානගත වී තිබුණද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.	පිරිවෙන් අංශයේ CCTV කැමරාව අස්ථානගත වීම සම්බන්ධයෙන් මු.රෙ. 103 යටතේ ප්‍රාරම්භක පරීක්ෂණයක් සිදුකල අතර එම වාර්තාවේ CCTV කැමරා මිලදී ගෙන හෝ රජයේ ප්‍රදානයක් ලෙස ලැබී නොමැති බවත්, වෙනත් ආයතනයකින් පරිත්‍යාග කිරීමට අදාල ලේඛන නිලධාරීන් ලඟ නොමැති බව නිර්දේශය කර ඇත. ඒ අනුව රජයට මුල්‍යමය පාඩුවක් සිදුව නොමැති බව.	මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කලයුතු වීම හා පරිත්‍යාග ලෙස ලැබුණු පසු එම වත්කම රජයේ වත්කමක් වන බැවින් රජයේ නීති හා රෙගුලාසි අනුව පූර්ණ උපයෝජනයකින් යුතුව භාවිතා කළ යුතු බව .
(ආ)	මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල පොත්වලින් කපා හැරීමේ ප්‍රකාශයෙහි ආරම්භක ශේෂය ලෙස පෙන්වන රු.මිලියන 16 ක වටිනාකමක් ඇති හානි 07 කට අදාළව අලාභ අයකර ගැනීමක් හෝ ඉදිරි පියවර ගැනීමක් ගිණුම් වර්ෂය තුල දි සිදුකර නොතිබුණු අතර එම ශේෂවලට අදාළ අයිතම 5 කින් 2023 වර්ෂයේදී ද කිසිදු මුදලක් අයකර ගැනීමට කටයුතු සිදුකර නොතිබුණි.	නිරීක්ෂණය සමඟ එකඟ වී තිබුණි.	-එම-

4.13 **විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත 2021-2023 කාලසීමාවේදි නිකුත් කරන ලද පිළිතුරු සැපයීමේ ප්‍රමාද කාලය අවමය මාස 16 ක් හා උපරිමය මාස 42 ක් වු විගණන විමසුම් 15 ක්ද සමාලෝචිත වර්ෂයේ නිකුත් කරන ලද පිළිතුරු සැපයීමේ ප්‍රමාද කාලය මාස 16 ක් වු විගණන විමසුම් 66 ක් ද 2023 වර්ෂයේදි නිකුත් කරන ලද පිළිතුරු සැපයීමේ ප්‍රමාද කාලය මාස 18 ක්	විගණන විමසීම් ඉදිරිපත් කර පිළිතුරු ලබා ගැනීම මෙම අමාත්‍යාංශ අභ්‍යන්තරයේ පවතින අනෙකුත් ශාඛාවන් මඟින් ද, අමාත්‍යාංශයට අනුබද්ධ අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනයන් මඟින්ද අමාත්‍යාංශය යටතේ පවතින ජාතික පාසල් මඟින්ද සිදුකල යුතුව පවතී. මෙම ක්‍රියාවලිය සඳහා දීර්ඝ කාලයක් ගත වන අතර මේ සඳහා දැනට	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන හා මුදල් රෙගුලාසි විධිවිධාන අනුව කටයුතු කර කාලීනව පිළිතුරු නොසැපයීම තුළ විගණනය නිරීක්ෂණය කරන ලද දෝෂයන් නිවැරදි නොවීම හේතුවෙන් එවැනි දෝෂ සිදුකිරීමට අනෙකුත් නිලධාරින්ද පෙළඹවීම තුළ අධ්‍යාපන පද්ධතියට සිදුවන

වූ "ජාතික පාසල් දහසක් දක්වා වැඩිකිරීමේ විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව" සඳහාද වශයෙන් විගණන විමසුම් 82 ක් සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් පිළිතුරු ලබාදීමට කටයුතු කර නොතිබුණි.	සිටින කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම අදාළ විගණනයෙන් පෙන්වා දී ඇති පිළිතුරු ලබාදීමේ ප්‍රමාදයට හේතු පාදක වී ඇත. ඒ අනුව ඉදිරියේ දී මෙම ගැටලුව වලක්වා ගැනීම සඳහා මා විසින් කාර්ය මණ්ඩලයේ අවශ්‍යතාවය පෙන්වා දෙමින් තනතුරු අනුමැතිය ලබාගැනීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ED/12/01/14/2024-12 හා 2025 මාර්තු 28 දිනැති ලිපිය යොමු කර ඇත.	අහිතකර බලපෑම සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සෘජුවම වගකීම දරන අතර එම කාර්යයභාරය කාලීනව ඉටු නොකිරීම සම්බන්ධයෙන්ද වගකීමට යටත්වන බව හා විගණන විමසුම් පිළිබඳව අප්‍රමාදව ක්‍රියාකොට ඒවාට සම්පූර්ණ පිළිතුරු සැපයීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් ඉටු කළ යුතු වීම.

4.14 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශයේ ලැබීමට ඇති ණය/ අත්තිකාරම් ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයේ සාරාංශයට අනුව ස්ථාන මාරු වී ගිය, මිය ගිය විශ්‍රාම ගිය, වැඩ තහනම් කර ඇති සහ සේවය හැරගිය නිලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු මුළු ණය ශේෂය රු.මිලියන 149.63 ක් වන අතර ඉන් රු.මිලියන 3.96 ක මුදලක් 2025 මාර්තු 31 දින වන විට නිරවුල් කර තිබීම හේතුවෙන් එම ශේෂය රු.මිලියන 145.67ක් වූ අතර ඉන් රු.මිලියන 19,06ක් වර්ෂ 20ට වැඩි කාලයක සිටද, රු.මිලියන 26.78 ක් වර්ෂ 10ත් 20ත් අතර කාලයක සිටද, රු.මිලියන 20.96ක් වර්ෂ 5ත් 10ත් අතර කාලයක සිටද, රු.මිලියන 78.87 ක් වර්ෂ 5කට අඩු කාලයක සිටද පැවතුණි.	නිරීක්ෂණ හා එකඟ වී ඇත.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කල යුතු වීම.

(ආ)	2024 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී පැමිණි, අනෙකුත් නිලධාරින්ගෙන් වැඩිපුර ගෙවීම් ලෙස අය කර ගැනීමට ඇති ණය ශේෂය රු.මිලියන 28.82 ක් වන අතර 2025 මාර්තු 31 දින වන විට රු.20,000ක මුදලක් නිරවුල් කර ඇති අතර ශේෂය රු.මිලියන 28.8 ක් විය. ඉන් රු.මිලියන 7.61 ක් වසර 20කට වැඩි කාලය සිටද රු.මිලියන 11.84 ක් වසර 10ත් 20ත් අතර කාලයක සිටද රු.මිලියන 1.62 ක් වර්ෂ 5ත් 10ත් අතර කාලයක සිටද රු මිලියන 7.72 ක් වර්ෂ 5ට අඩු කාලයක සිට ද පැවතුණි.	2024.12.31 දිනට ස්ථාන මාරු වී පැමිණි සහ නිලධාරීන්ගෙන් වැඩිපුර ගෙවීම් ලෙස අයකර ගැනීමට ඇති ණය ශේෂයෙන් රු. 20,000.00ක මුදලක් නිරවුල් කර ඇති අතර එය වර්ෂ 5කට අඩු කාලයකට අදාළව වේ.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ණය ශේෂයන් අයකර ගැනිමට කටයුතු කල යුතු වීම.
(ඇ)	පාසල් ආදි ශිෂ්‍ය සංගම්වල කාර්යයන් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය චක්‍රලේඛයක් නිකුත් කර වර්ෂ 30 ක් ගත වී තිබුණද ආදි ශිෂ්‍ය සංගම් සම්බන්ධයෙන් පොදු උපදෙස් ඇතුළත් කර වර්තමානයට ගැළපෙන පරිදි චක්‍රලේඛය සංශෝධනය කිරිමට කටයුතු කර නොතිබුණි.	ආදි ශිෂ්‍ය සංගම් චක්‍රලේඛය අවශ්‍ය සංශෝධන සහිතව කෙටුම්පත් කර ඇති අතර ඉදිරියේ දී එය නිකුත් කිරීමට කටයුතු කරමි.	ආදි ශිෂ්‍ය සංගම්වල පාසල තුල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් මාර්ගෝපදේශයක් හඳුන්වාදීමට කටයුතු කර එම සංගම්වල ක්‍රියාකාරිත්වය පාසල් පද්ධතියේ උන්නතියට වඩාත් හිතකර අයුරින් යොදවා ගැනීමට කටයුතු කල යුතු බව.
(ඈ)	රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ නේවාසිකාගාර ගිණුමට ලද මුදල්වලින් 2013 වර්ෂයේ සිට වියදම් නොකර ඉදිරියට ගෙන එමින් තිබුණු ශේෂයන්ගේ ඉතිරිවීමක් තිබුණු අතර 2024 දෙසැම්බර් 16 විගණිත දින වන විට රු.මිලියන 6.8 ක ශේෂයක් එම ගිණුමේ පැවතුණි. එම ගිණුමේ ඉතිරි මුදල් අදාළ කාලවකවානුවලදී නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු නොකර නිෂ්කාර්යව නේවාසිකාගාර ජංගම ගිණුමේ රඳවා තබාගෙන පවතින බව නිරීක්ෂණය වී තිබුණි.	නේවාසිකාගාර ගිණුමෙහි රු මිලියන 4 ක ශේෂයක් ඉදිරියට ගෙන එමින් පවතින අතර එම මුදල වියදම් නොකර රඳවා ගන්නා ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වාචිකව උපදෙස් ලැබී ඇත. ඒ අනුව එම මුදල රඳවා ගනිමින් මුදල් වියදම් කරන අතර, විගණිත දින වන විට මිලදී ගත් භාණ්ඩ සඳහා අදාල වවුචර්පත් ඉදිරිපත් නොවීම මත එදිනට රු.මිලියන 6.8 ක මුදලක් පවතින ලදි. නේවාසිකාගාර ගිණුමට මාසිකව වෙන්වන මුදල් ගණනය කර ආහාර කමිටුව විසින් මෙනුපත් සකස්කර වියදම් කරන බැවින් එම ගිණුමෙහි මුදල් ඉතිරි වීමක් නොවන බව.	ප්‍රතිලාභින්ගේ ප්‍රයෝජනයට ගැනීම ඉදිරි අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන වෙන්කරගෙන කළ යුතු බව හා කල් ඉකුත් වූ තැන්පතු රජයේ ආදායමට මු.රෙ. ප්‍රකාරව මාරු කළ යුතු වීම.

4.15 වෙනත් නිරීක්ෂණ

ජාතික පාසල් නියදි පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ)	නියමිත ආකෘතිපත්‍රවල නිවැරදි ලෙසත් සම්පූර්ණ ලෙසත් පුරවා පිළියෙල කරන ලද වවුචර් සියළුම ගෙවීම් සඳහා ඉදිරිපත් කල යුතු වුවද, කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය මගින් 2022, 2023 හා 2024 වර්ෂවල චෙක්පත් මගින් ගෙවූ, එකතුව රු.මිලියන 1.74ක් වූ වියදම් වෙනුවෙන් හා ඉතිරිකිරීමේ බැංකු ගිණුම් දෙකෙන් ආපසු ලබාගත් රු.මිලියන 2.40ක මුදල් වියදම් කිරීම සම්බන්ධයෙන් වවුචර් පිළියෙල කර නොතිබුණි.	විගණන විමසුම ලැබීමෙන් පසුව පැවැත්වූ විධායක රැස්වීමේදී ආදි ශිෂ්‍ය සංගමයේ මුදල් ගණුදෙනු වලදී විදුහල්පතිගේ අත්සන අනිවාර්ය බව අවධාරණය කර සහතික කර ඇති බව.	ආදි ශිෂ්‍ය සංගමයේ සභාපති නිලබලයෙන් විදුහල්පතිවරයා වන බැවින් ඒ අනුව ඔහු විසින් මුදල් රෙගුලාසි 225, 135-140 විධිවිධාන, ආයතන සංග්‍රහය හා අනෙකුත් රජයේ නීති රීති, රෙගුලාසි අණපනත් අනුව කටයුතු කළ යුතු අතර සියළු ගෙවීම් සඳහා වවුචර පිළියෙල කල යුතු වීම.
(ආ)	කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් 2023 දෙසැම්බර් 29 දිනැති අධ්‍යාපන ලේකම්ගේ අංක 52/2023 දරන චක්‍රලේඛයේ 3.3 වගන්තිය ප්‍රකාරව පිහිනුම් තටාක ආදායම පාසල් සංවර්ධන ගිණුමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. ආදායමින් රු.491,332ක මුදලක් චක්‍රලේඛයට පටහැනිව වියදම් කර තිබුණු අතර රු.78,190ක් ආදි ශිෂ්‍ය සංගමයට ලබා දී තිබුණි.	වඩාත් වේගයෙන් හා කාර්යක්ෂමව කටයුතු ඉටු කිරීම සඳහා පිහිනුම් තටාක කළමනාකරු එම ආදායමෙන් වියදම් දරා ඇත. ඒ සියළු වියදම් අධීක්ෂණයට ලක්වෙමින් වියදම් කර ඇති අතර එයද වරදක් ලෙස පිළිගන්නා බවද, සියළුම වියදම් සත්‍ය වශයෙන්ම නිවැරදි වියදම් බවට සහතික කර සියළුම වියදම් කිරීම සංවර්ධන සමිති ගිණුම් හරහා සිදු කිරීමට කටයුතු කර ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම හා පාසල් ප්‍රධානී ලෙස විනිවිදභාවය ආරක්ෂා කරමින් මූල්‍ය පාලනය විධිමත් කිරීමට වග බලා ගත යුතු වීම.
(ඇ)	2015 ජනවාරි 19 දිනැති අධ්‍යාපන ලේකම්ගේ අංක 05/2015 දරන චක්‍රලේඛයේ 2 ඡේදය හා 26/2018 චක්‍රලේඛයේ 7.4 ඡේදය හා 2008/17 චක්‍රලේඛයේ 11 ඡේදයට පටහැනිව ගා/ කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලය හා කොළඹ රාජකීය විද්‍යාලය විසින් උසස්පෙළට සිසුන් ඇතුලත් කිරීමේදී රු.මිලියන 11.61ක්ද කොළඹ රාජකීය විද්‍යාලය 1 ශ්‍රේණියට සිසුන් ඇතුලත් කිරීමේදී රු.මිලියන 2.73ක මුදලක්ද දෙමාපියන්ගෙන් අයකරගැනීමට කටයුතු කර තිබුණි.	උසස් පෙළ සිසුන් ගේ දෙමාපිය මැදිහත් වීමෙන් ඔවුන්ගේ මුලිකත්වයෙන් මුදල් සපයාගෙන "ප්‍රයාම" වැඩසටහන පවත්වන ලද බව දන්වා ඇති බව. කොළඹ රාජකීය විද්‍යාලයට අදාළව පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	පාසල් විදුහල්පතිවරුන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කිරීමට අවධානය යොමු කළ යුතු බව.

(ඇ)	සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට එකම පාසලේ වසර 5 කට වඩා සේවා කාලයක් සම්පූර්ණ වන ගුරුවරුන්ගේ තොරතුරු ඇතුලත් ආකෘතිය නිවැරදිව සම්පූර්ණ කර අදාළ විදුහල්පතිවරුන් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කල යුතු වුවත් බහුතරයක් වූ විදුහල්පතිවරුන් එපරිදි කටයුතු කර නොතිබුණු නමුත්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඒ සම්බන්ධයෙන් ඉදිරි පියවරක් ගෙන නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය නියමිත පරිදි සිදු කිරීමට හැකි පරිදි අමාත්‍යාංශය විසින් ඉදිරි පියවරක් ගත යුතු වීම.
(ඉ)	බස්නාහිර පළාතේ පාසල්වල නියැදි පරීක්ෂාවේදී පාසල්වල අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුලත් කිරීමේදී, 2023 අප්‍රේල් 25 දිනැති අධ්‍යාපන ලේකම්ගේ අංක 17/2023 දරණ චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරිපත් කලයුතු නව හා පැරණි පදිංචිය සනාථ කිරීමේ ලේඛනවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමකින් තොරව විදුහල්පති ඇතුළු සම්මුඛ පරීක්ෂණ කමිටු සාමාජිකයින් විසින් ළමුන් 28 ක් ඇතුලත් කිරීමට කටයුතු කර තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	උලේඛනවල නිවැරදිතාවය සනාථ කර ගැනීමට නිසි ඒකාකාරී ක්‍රමවේදයක් හඳුන්වාදී චක්‍රලේඛ ප්‍රකාරව සුදුසුකම්ලත් සිසුන් පමණක් පාසල් සඳහා ඇතුලත් කර ගැනීමට කටයුතු කල යුතු වීම.
(ඊ)	ගුරුවරයෙකු සතියක් තුළ ඉගැන්විය යුතු කාලපරිච්ඡේද ගණන 40 ක් වුවත් එයින් කාර්ය බද්ධ නිදහස් කිරීම්වලදී හැර ගුරුවරයෙකු විෂයානුබද්ධව ඉගෙනුම් ඉගෙන්වීම් ක්‍රියාවලියෙහි අවම වශයෙන් කාලච්ජේද 30 ක් නිරත විය යුතු වුවත් ඊට අනුකූල වීමට කටයුතු නොකරමින් ර/ඇඹි/ජනාධිපති මධ්‍ය මහා විද්‍යාලයේ හා කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලයේ ගුරුභවතුන් 105 දෙනෙකු නිෂ්කාර්යව සිටින බව නිරීක්ෂණය වී තිබුණි.	ගුරු අතිරික්තය නිසාද අවම කාලච්ජේද ලබාදීමට නොහැකිව වී ඇත. නමුත් ගුරුවරුන් වෙත වෙනත් කාර්යයන් පවරා ඇති බව.	විදුහල්පතිවරුන් විසින් චක්‍රලේඛය ප්‍රකාරව ගුරුවරුන් සේවයේ යෙදවීමට කටයුතු කල යුතු අතර ගරු තුලනයක් සිදුවන පරිදි ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළයුතු වීම.

(ළ)	මහ/උසස් බාලිකා විදුහලේ අනුමැතිය සහිතව විදේශගත වී අනුමත කාලය ඉක්මවා නැවත පාසලට නොපැමිණි සිසුන් 23 ක් සම්බන්ධයෙන් අධ්‍යාපන ලේකම්ගේ අංක HRD/EQD/2002/26 දරන චක්‍රලේඛයේ 2(ii) හා 2(iv) චක්‍රලේඛය ප්‍රකාරව පුරප්පාඩු සඳහා සිසුන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම චක්‍රලේඛයේ v වගන්තිය ප්‍රකාරව යම් ශිෂ්‍යයෙකු වසරකට වඩා වැඩි කාලයක් තුළ නැවත දිවයිනට නොපැමිණියහොත් අදාල සිසුන් සඳහා දිගින් දිගටම පුරප්පාඩු තබා නොගත යුතු බව සඳහන් වුවද මේ සම්බන්ධයෙන් පසු විපරම් නොකිරීම හේතුවෙන් 17/2023 චක්‍රලේඛය අනුව අතරමැදි පන්ති සඳහා පුරප්පාඩු ප්‍රසිද්ධ කර බඳවා ගැනීම් සිදුකිරීමට විදුහල්පතිවරුන්ට නොහැකිව තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	මෙවැනි තත්ත්වයන් කඩිනමින් මනාව අනාවරණය වන පරිදි කඩිනම් වැඩපිළිවෙලවල් හඳුන්වා දී ඒ අනුව හඳුනාගන්නා පුරප්පාඩු මත සුදුසුකම්ලත් සිසුන්ට අවස්ථාව සැලසීමට පියවර ගත යුතු වීම.
(ළු)	කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිති ගිණුමෙන් වියදම් දැරීමේදී රෙගුලාසීන්ට අනුකූලව සිදුකර නොමැති අවස්ථා නිරීක්ෂණය වූ අතර විගණන නියැදි පරීක්ෂාවට ලක්වුණු එකතුව රු.මිලියන 3 ක් වූ වියදම් අවිධිමත් වියදම් වන බව නිරීක්ෂණය විය. ඒ අනුව කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිතියේ සභාපති එනම් පාසලේ විදුහල්පති, පාසල් සංවර්ධන විධායක කමිටුවේ නිලතල දරන සාමාජිකයින් හා වගකිව යුතු නිලධාරීන් විසින් අධ්‍යාපන ලේකම්ගේ අංක 26/2018 දරන හා 2018 ජුනි 22 දිනැති පාසල් පාදක ගුණාත්මක,ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසම්කරණය හා ප්‍රසම්පාදනය පිළිබඳ මාර්ගෝපදේශ අත්පොතේ 16.6 වගන්තියට හා මුදල් රෙගුලාසිවලට පටහැනිව කටයුතු කර තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	යොමුගත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම හා මුදල් රෙගුලාසි 135-140,225,156 විධිවිධානවලට අනුකූලව ගෙවීම් සිදුකිරීමට කටයුතු කළ යුතු බව.

(එ)	අධ්‍යාපන ලේකම්ගේ අංක 26/2018 හා 2018 ජූනි 22 දිනැති චක්‍රලේඛයේ 7.3 ඡේදය ප්‍රකාරව මූල්‍ය පරිත්‍යාගයන් ලබාගැනීමේදී ඒ සඳහා පාසල් සංවර්ධන ගිණුම නමින් විධිමත් අනු අංක සහිත හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ මුද්‍රාව ඇතුළත් ලදුපත් නිකුත් කළ යුතු වුවද මහව විජයබා ජාතික පාසල චක්‍රලේඛයට පටහැනිව කටයුතු කර තිබුණු අතර ර/ඇඹි/ ජනාධිපති මධ්‍ය මහා විද්‍යාලයේ ද 2019 වර්ෂයේ සිට 2024 දක්වා පරිත්‍යාග ලැබීම් අවස්ථා 37කදී ඒ වෙනුවෙන් බිල්පත් නිකුත් කර නොතිබුණි.	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිල මුද්‍රාව ලබාගන්නා අතර ලදුපත් පොත් ප්‍රමාණය අවසන් වූ පසු නැවත කොටසකට මුද්‍රා යොදා ගනු ලබයි. මුද්‍රා තබන තෙක් එම පොත් භාවිතා කරනු නොලබන බව හා ඉදිරියේදී ලැබෙන සියලු පරිත්‍යාග භාණ්ඩ සඳහා බිල්පත් නිකුත් කරනු ලබන බව.	අවශ්‍යතාවය අනුව ලදුපත් පොත් මුද්‍රණය කිරීම හා සියළු පොත් සඳහා අධ්‍යාපන අධ්‍යක්ෂකගේ මුද්‍රාව ලබාගැනීමට කටයුතු කල යුතු බව හා ඒ සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් ප්‍රමාණවත් වැඩපිළිවෙලක් හඳුන්වා දී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව.
(ඒ)	මාතලේ විජය ජාතික පාසලේ 2023 අගෝස්තු මස පවත්වන ලද දානමය හා පිරිත් පිංකම සඳහා 2018 ජූනි 18 දිනැති 26/2018 දරන චක්‍රලේඛයට පටහැනිව රු.මිලියන 1.1 ක් වූ මුදලක් වෙන්කර එම චක්‍රලේඛයට අනුව කටයුතු නොකරමින් රු. 851,175 ක් වැය කිරීමට කටයුතු කර තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	පාසල් විදුහල්පතිවරුන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කල යුතු බව හා ඒ සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් ප්‍රමාණවත් වැඩපිළිවෙලක් හඳුන්වා දී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව.
(ඔ)	පිහිනුම් තටාක ලැබෙන සියලුම ආදායම් පාසල් සංවර්ධන ගිණුමට බැර කර එම ගිණුම මඟින් අදාළ වියදම් සිදුකළ යුතු වුවත් කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලය ඊට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර, කළමනාකරු විසින් රැස්කරනු ලබන දෛනික ආදායම් අවිධිමත් ලෙස පරිහරණය කර එනම් ඔහුගේ මාසික දීමනාව සහ අනෙකුත් විවිධ වියදම් දැරීමෙන් අනතුරුව ඉතිරි මුදල් පමණක් පාසල් සංවර්ධන සමිති ගිණුමට බැර කර තිබුණි. ඒ අනුව විගණන නියැදි පරීක්ෂාවට ලක්වුණු කාලයට අදාළව එකතුව රු. 491,332 ක් අධ්‍යාපන ලේකම්ගේ අංක 52/2023 දරන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවී අවිධිමත් ලෙස වියදම් කිරීමත්, පාසලේ 80 වන සංවත්සර වියදම්	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	අංක 52/2023 දරන හා 2023 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛ ප්‍රකාරව පාසල් සංවර්ධන ගිණුමට මුදල් බැර කිරීම හා වියදම් දැරීම කළ යුතු වීම.

	දැරීම සඳහා රු.78,190 ක් පාසල් ආදි ශිෂ්‍ය සංගමය වෙත ලබාදීමත් සිදු කර තිබුණි.		
(ඔ)	කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලයේ 2024 ඔක්තෝබර් 08 දින පිහිනුම් තටාක ආදායම් වියදම් පිළිබඳ ලේඛණ හා පොත්පත් පරීක්ෂාවට අනුව කළමනාකරු විසින් එකතු කර තිබුණු හා පාසල් සංවර්ධන ගිණුමට බැර කළ යුතු රු.287,540 ක ආදායමින් රු.70,000 ක් කළමනාකරු අතැතිව තිබුණු නමුත් රු.147,540 ක මූල්‍ය ඌණතාවයක් පැවතුණි. අදාළ ඌණතාවයට හේතු එම අවස්ථාවේදී විගණනයට ඉදිරිපත් කිරීමට කළමනාකරු අපොහොසත් වූ අතර, අදාළ මුදල් සාවද්‍ය පරිහරණයට යොදාගෙන ඇති බව විගණනයේදී බැහැර කළ නොහැක.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	චක්‍රලේඛ ප්‍රකාරව පාසල් සංවර්ධන ගිණුමට මුදල් බැර කිරීම හා එම ගිණුම හරහා වියදම් දැරීම කල යුතු වීම හා හඳුන්වා දෙනලද විධිවිධානවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් විදුහල්පතිවරයාවරයා සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II කොටසේ 8.1 හා 8.2 වගන්ති හා මුදල් රෙගුලාසි 119 හා 156 අනුව කටයුතු කල යුතු බව.
(ක)	දික්වැල්ල විජිත මහා විද්‍යාලයේ 2021 නොවැම්බර් 09 දින සිදු වී තිබුණු පරිගණක විද්‍යාගාර සොරකමට අදාළ අලාභයේ වටිනාකම රු.මිලියන 1.34 ක් බවත් උක්ත සිදුවීම සිදු වී, මේ වන විට වර්ෂ 3ක් ඉක්ම ගොස් තිබියදීත් මුදල් රෙගුලාසි 104 (4) අවසන් වාර්තාවක් නිකුත් කර අලාභ අයකර, අදාල වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. .	මාතර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කරනු ලබන විමර්ශනයෙන් පෙන්වා දෙනු ලබන නිර්දේශ ප්‍රකාරව අලාභය අය කර ගන්නා ආකාරය සහ පොත් වලින් ඉවත් කල යුතු ආකාරය පිළිබඳ උපදෙස් දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ විසින් මෙතෙක් ලබා දී නොමැත. ඒ අනුව මෙම කාර්යය කඩිනමින් සිදුකරන ලෙසට 2024 අගෝස්තු 12 සහ 2025 මාර්තු 03 දිනැති ලිපි මඟින් දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ දැනුවත් කරන ලද බව.	මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන වගකිවයුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කිරීම.
(ච)	කො/රාජකීය විද්‍යාලයේ සංවර්ධන සමිති ගිණුමේ 2016 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් මුදල් ශේෂය හා මුදල් පොතේ ශේෂය අතර සැසඳිය නොහැකි රු.මිලියන 3,342 ක් වූ මූල්‍ය ශේෂ වෙනස්කම් සම්බන්ධයෙන් කපාහැරීම සඳහා හෝ කමිටු පත්කිරීමට විධායක කමිටුවට බලයක් නොතිබියදී පාසල් විධායක කමිටුව විසින්	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විමර්ශනයක් සිදුකිරීම හා මෙවැනි තත්ත්වයන්වලදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව පාසල් දැනුවත් කිරීමට පියවර ගැනීම කළ යුතු බව.

පත්කරන ලද විශේෂ කමිටු තීරණයක් මත 2023 දෙසැම්බර් 31 දිනට සකස් කරන ලද පාසලේ මූල්‍ය ප්‍රකාශන තුළින් කපා හැරීමට කටයුතු කර තිබුණු නමුත් මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ශාඛාවේ උපදෙස් හා මග පෙන්වීම් ලබාගෙන නොතිබුණි.

5 යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අධ්‍යාපන අමාත්‍යාංශයේ අභ්‍යන්තර දුරකථන පද්ධතිය (PABX පද්ධතිය) 2023 අප්‍රේල් 07 දින සිට අකුණු සැර වැදීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්‍රියාවිරහිත වී තිබුණු අතර පවතින පද්ධතියද යථා පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් නව පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2018 වර්ෂයේ සිට අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලැබී තිබුණද 2025 වර්ෂය වන තුරුත් නව පද්ධතියක් ස්ථාපිත කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. අභ්‍යන්තර දුරකථන පද්ධතිය බිඳවැටීමට අදාලව කඩිනම් පියවර නොගැනීම හේතුවෙන් මාස 24 ක කාලසීමාවක සිට 2025 ඔක්තෝබර් මාසය දක්වාම දුරකථනය මගින් මහජනයා වෙත සපයන සේවා ඉටුකිරීම මැනවින් සිදුකිරීම නොහැකි වීමට සැලකිය යුතු මට්ටමේ අහිතකර බලපෑමක් වී තිබුණි.	අමාත්‍යාංශයේ අභ්‍යන්තර දුරකථන පද්ධතිය බිඳවැටීම අමාත්‍යාංශයේ සන්නිවේදන කටයුතුවලට අහිතකර ලෙස බලපා ඇත. එහෙත් අමාත්‍යාංශයේ සෘජු දුරකථන 10 අනිවාර්යෙන්ම ක්‍රියාත්මකව පවතින අතර, එමගින් මහජනතාවට අවශ්‍ය අවස්ථාවන්හිදී දුරකථන හුවමාරු ඒකකය හරහා (Telephone exchange) අවශ්‍ය අංශ සමඟ සම්බන්ධ විය හැක. තවද සෑම ශාඛාවකටම එක් අභ්‍යන්තර දුරකථන අංකයක් ක්‍රියාත්මකව පවතී. තවද, අධ්‍යාපන අමාත්‍යාංශය හා සම්බන්ධ බාහිර සේවා ලාභීන්ට මෙන්ම අභ්‍යන්තර නිලධාරීන්ටද දුරකථන නාමාවලිය ඇසුරින් 240 ක් පමණ වන සෘජු දුරකථන මගින් අමාත්‍යාංශයේ අවශ්‍ය අංශ සම්බන්ධ කරගත හැකි බව.	නව අභ්‍යන්තර දුරකතන පද්ධතිය කඩිනමින් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතු වීම හා මහජන සේවාවන් ප්‍රශස්ත අයුරින් ඉටු කිරීමට වග බලා ගත යුතු බව.

5.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අභ්‍යන්තර විගණන අංශයේ 2024 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව, අවදානම් ඇගයීම මත අභ්‍යන්තර විගණනය විසින් හඳුනාගන්නා ලද විගණන ක්ෂේත්‍ර හා විගණන ක්‍රියාකාරකම් 29ක් දක්වා තිබුණද නිකුත් කරන ලද වාර්තා පරීක්ෂාවේදී සැලසුම් කල කාර්යයන් ඉටුකර නොතිබුණු අතර බොහොමයක් අභ්‍යන්තර විගණන වාර්තා ජාතික පාසල්වල මූල්‍ය විගණනයට සීමා වී තිබුණි	2024 වර්ෂයෙහි අභ්‍යන්තර විගණන සැලැස්මෙහි හඳුනාගන්නා ලද විගණන ක්‍රියාකාරකම්වලින් සියයට 80 ක ප්‍රමාණයක් 2024 වර්ෂය තුළ ඉටුකර ඇති අතර විගණන සැලැස්මෙහි ඇතුළත් නොවූ එහෙත් මාගේ නියෝග මත සිදු කළ විශේෂ විගණන පරීක්ෂණ 21 ක් ද එම වර්ෂයේදී සිදු කර ඇත. ඒ අනුව අංශයේ පවතින සීමිත කාර්ය මණ්ඩලය එම විශේෂ පරීක්ෂණ සඳහා යෙදවීමට සිදු වීම මත විගණන සැලැස්ම සියයට සීයක් සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත. එම නිසා 2025 වර්ෂයේ විගණන සැලැස්ම පූර්ණ වශයෙන් සිදු කිරීමට සැලසුම් කර ඇති බව.	අවදානම තක්සේරු කිරීම මත හඳුනාගන්නා විශේෂ කරුණු ආවරණය වන පරිදි ස්ථාපිත අභ්‍යන්තර පාලන පද්ධතියන් තහවුරු වන පරිදි හා නව අභ්‍යන්තර පාලන පද්ධතියන් හඳුන්වාදීමද ඇතුළුව සියළුම පාලනයන්ද සහිතව අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙල කර අභ්‍යන්තර විගණනයන් සිදු කරමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය විනය, ව්‍යාපෘති ඉටුකිරීම, ප්‍රසම්පාදන අරමුණු යනාදී හි අභ්‍යන්තර පාලන පද්ධතීන් කාලීනව සමාලෝචනය කරමින් තහවුරු කල යුතු බව.
(ආ)	මුදල් රෙගුලාසි 133 (1) ප්‍රකාරව අභ්‍යන්තර විගණක විසින් අමාත්‍යාංශයේ මුදල් කටයුතු පිළිබඳව පවත්වන අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගී වී එම කටයුතුවල වැරදි හා වංචා වැලැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳ අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයුමක් පවත්වාගන යාම සිදුකල යුතු බව දක්වා තිබුණද, වැරදි හා වංචා වැලැක්වීමට සහ අනාවරණය කර ගැනීමට, අභ්‍යන්තර පාලන ක්‍රම පරීක්ෂා කිරීමට සහ නව අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වාදීමට අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය ප්‍රමාණවත් කාලයක් වැයකර නොමැති බව අභ්‍යන්තර විගණන සැලසුම් හා වාර්තා අනුව නිරීක්ෂණය විය.	2024 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ජාතික පාසල්වල සිදු වී ඇති වැරදි හා වංචා වැලැක්වීමට හා අනාවරණය කර ගැනීමට අභ්‍යන්තර පාලන ක්‍රම පරීක්ෂා කිරීමට හා නව අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දීමට වැඩි බර තැබීමක් සිදු කර ඇති අතර 2025 විගණන සැලැස්ම මගින් අමාත්‍යාංශයේ මුදල් කටයුතු පිළිබඳව වැඩි අවධානයක් යොමු වන පරිදි සකස් කර ඇත. ඉදිරි වර්ෂ සඳහා පිළියෙල කරන විගණන සැලසුම්වලදී ජාතික පාසල් මෙන්ම අමාත්‍යාංශයේ කටයුතු ද ආවරණය වන පරිදි සැලසුම සකස් කිරීම කටයුතු කරන බව.	නිර්දේශය ඉහත පරිදි වේ.

(ඇ)	2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කලමනාකරණ පනතේ 33 (2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ අභ්‍යන්තර විගණකවරයාගේ තීරණය සඳහන් කරමින් අමාත්‍යාංශ ලේකම්වරයාට වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවත් එවැනි වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.	2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 33(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව අභ්‍යන්තර විගණකවරයාගේ තීරණය සඳහන් කරමින් මා වෙත 2025 වර්ෂයේ සිට වාර්තාවක් ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දෙන ලද බව.	2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කලමණාකරන පනතේ 33 (2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳ අභ්‍යන්තර විගණකවරයාගේ තීරණය සඳහන් කරමින් අමාත්‍යාංශ ලේකම්වරයාට වාර්තාවක් ඉදිරිපත් කල යුතු වීම.

5.3 විගණන හා කළමනාකරණ කමිටුව

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 ජනවාරි 12 දිනැති අංක DMA/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 5.3 ඡේදය අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක්, එනම් වර්ෂයකට 4ක් වන පරිදි පැවැත්විය යුතු වුවද 2024 වර්ෂය සඳහා කළමනාකරණ කමිටු රැස්වීම් 03ක් පමණක් පවත්වා තිබුණි.	මැතිවරණ දෙකක් රටේ පැවැත්වූ අතර ඒ අනුව වර්ෂය තුළ පවත්වා ඇත්තේ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 3ක් පමණි. ඉදිරි වර්ෂවලදී ද විගණන කළමනාකරණ කමිටු රැස්වීම කාර්තුව තුළම පැවැත්වීමට කටයුතු කරනු ඇති බව.	2019 ජනවාරි 12 දිනැති අංක DMA/1-2019 දරණ කළමණාකරන විගණන චක්‍රලේඛයේ 5.3 ඡේදය අනුව විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් පැවැත්විය යුතු වීම.

6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශයේ ගොඩනැගිලි නඩත්තු කටයුතු මනාව පවත්වා ගැනීමට අත්‍යාවශ්‍ය තනතුරක් වූ ගොඩනැගිලි කළමනාකරු තනතුර 2023 දෙසැම්බර් 30 දින සිට පුරප්පාඩු වී තිබුණු අතර එම තනතුර පිරවීම සඳහා 2025 අප්‍රේල් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.	මෙම අමාත්‍යාංශය සඳහා අනුමත ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ බඳවාගැනීම් පටිපාටිය අනුව ගොඩනැගිලි පරිපාලක තනතුර එම සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරක් බැවින් ඒ සඳහා බඳවා ගැනීමට හැකියාවක් නොමැත. ඒ අනුව තනතුරෙහි පුරප්පාඩුව සම්පූර්ණ කිරීම සඳහා අභ්‍යන්තරව උසස් කල හැකි සුදුසුකම් සපුරන ලද නිලධාරියෙකු අමාත්‍යාංශයේ නොමැති වීම හේතුවෙන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හි 06 වගන්තියේ විධිවිධාන අනුව තනතුරට අදාළ සේවාවන් ඉටුකර ගැනීමට කටයුතු කර ඇති බව.	පවතින නීතිමය ප්‍රතිපාදන යටතේ අමාත්‍යාංශයේ ගොඩනැගිලි නඩත්තු කටයුතු සඳහා නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කළ යුතු බව.

(ආ) රජයේ පාසල් සඳහා ක්‍රීඩා පුහුණුකරුවන් බඳවාගැනීම		
i. ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ගුරුවරුන්ගේ අවශ්‍යතා නිසි පරිදි හඳුනා ගැනීමකින් තොරව හා ගුරු සේවයේ ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ගුරු තනතුර යටපත් කොට අමාත්‍යාංශය විසින් ක්‍රීඩා පුහුණුකරුවන් 3,888ක් 2019 වර්ෂයේදී බඳවාගැනීමට කටයුතු කර තිබුණි. ක්‍රීඩා පුහුණුකරුවන් ජාතික පාසල් හා පළාත් සභා වෙත අනුයුක්ත කිරීමට යාමේදී ඇති වූ ගැටළු හේතුවෙන් නැවතත් ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ගුරු තනතුර යටපත් නොකිරීමට තටයුතු කර තිබුණි. මෙලෙස ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් හා ක්‍රීඩා පුහුණුකරුවන් පාසල් වෙත අනුයුක්ත කර තිබියදීත් බොහෝ පාසල් විසින් වෙස්, ක්‍රිකට්, වොලිබෝල් යනාදි ක්‍රීඩා සඳහා බාහිර පුහුණුකරුවන්ගේ සේවය ලබාගෙන ඒ සඳහා පාසල් සංවර්ධන සමිතියෙන් වැටුප් ගෙවීමට හා සිසුන්ගෙන් අමතර මුදල් අයකිරීමට කටයුතු කරන බව නිරීක්ෂණය විය.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ගුරුවරුන් බඳවාගැනීමේදී ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ගුරුවරුන්ගේ අවශ්‍යතාව නිසිපරිදි හඳුනාගෙන අනුමත තනතුරු සංඛ්‍යාව සමාලෝචනය කර පුරප්පාඩු සංඛ්‍යාව සංගණනයක් සිදුකර බඳවාගැනීම සිදුකල යුතු වීම. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිසු දරුවන් හා දෙමාපියන්ගෙන් මුදල් එකතුකරන අවිධිමත් සංවිධාන පාසල් පද්ධතියක් තුළින් ඉවත් වන පරිදි විධිමත් වැඩපිළිවෙලක් හා ක්‍රමවේදයක් හඳුන්වා දී එය අමාත්‍යාංශ මට්ටමින් අධීක්ෂණය කළ යුතු බව.
ii. ක්‍රීඩා පුහුණුකරුවන් බඳවාගැනීමේ පටිපාටිය අනුව අදාළ පුහුණුකරුවන් III ශ්‍රේණියට පත්වී වර්ෂ 03 ක් ඉක්මවා යාමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් වීම හා බඳවාගැනීමේ පටිපාටියේ 8.2 වගන්තිය අනුව වසරකට දෙවරක් කාර්යක්ෂමතා කඩඉම පැවැත්විය යුතු ලෙස සඳහන් වුවද 2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වාම කාර්යක්ෂමතා	2019 වර්ෂය අගභාගයේ සිට 2022 වර්ෂය දක්වා කොවිඩ් වසංගතය හේතුවෙන් ද / රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2022.07.05 දිනැතිව ලබා දී ඇති අනුමැතිය පරිදි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්බන්ධව සංශෝධන ඇතුළත් කර බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම හා බඳවා ගැනීමේ පටිපාටිය අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කෙරේ. වාර්ෂිකව කාර්යක්ෂමතා	නිසි ක්‍රමවේදයන් අනුගමනය කරමින් කාර්යක්ෂමතා කඩඉම් විභාග නියමිත කාලයේදී පැවැත්වීමට කටයුතු කල යුතු වීම හා නියමිත කාලසීමාවන් තුළ කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා ගනිමින් මොවුන්ගේ සේවය මනාව දූවාදරුවන්ට ලබාදීමට කටයුතු කළ යුතු වීම.

	කඩඉම් විභාග එකක් පමණක් පවත්වා තිබුණි. ආයතන සංග්‍රහයේ 15 වන උප වගන්තියේ IX ට අනුව නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීම සඳහා පත්වීම් බලධරයාද/පරිපාලන බලධරයාද එම වගකීමට බැඳී සිටින බව සඳහන් වුවද කාර්යක්ෂමතා කඩඉම් විභාගය නියමිත වාර ගණනක් පැවැත්වීමට අතිරේක ලේකම් (අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා) කටයුතු කර නොතිබුණි. ඒ අනුව ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග නොපැවැත්වීම මත පත්වීම් ස්ථිර කර ගැනීමටද නොහැකි වී තිබුණි.	කඩඉම් පරීක්ෂණය පැවැත්වීමට සූදානම් කෙරේ.	
(ඇ)	අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහ තෘතියික මට්ටමේ නිළධාරින්ගේ පුරප්පාඩු 880 ක් හා ද්විතීයික හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 2,418 ක් පැවතුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	අත්‍යාවශ්‍ය තනතුරු පමණක් හඳුනාගෙන ඒ පිළිබඳව සමාලෝචනයක් සහිතව නව පත්කිරීම් සිදුකරන විශේෂ කමිටුවට පැහැදිලි කිරීම් ලබා දී බඳවාගැනීමට කටයුතු කළ යුතු වීම.
(ඈ)	ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 544ක්, තෘතියික මට්ටමේ පුරප්පාඩු 26ක්, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 262 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 106 ක් පවතින බැවින් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල සමස්ත ක්‍රියාකාරීත්වය කෙරෙහි දැඩිව බලපෑමක් ඇති වී තිබුණු අතර ඉහත පරිදි පුරප්පාඩු පැවතියද අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2025 වර්ෂයේ අපේක්ෂිත බඳවාගැනීම් ලේඛනයට එම පුරප්පාඩු ඇතුලත් කර නොතිබුණු අතර එම පුරප්පාඩු තනතුරුවල අනුමත සංඛ්‍යාව පිළිබඳව සමාලෝචනයක්ද සිදුකර නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව පිළිබඳ සමාලෝචනයක් සිදු කර අත්‍යවශ්‍ය තනතුරු සඳහා නියමිත අනුමැතිය යටතේ බඳවා ගැනීමට කටයුතු කළ යුතු වීම.

(ඉ)	ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට අදාළ විස්තරාත්මක කාර්යමණ්ඩල තොරතුරු අනුව ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ අනුමත කථිකාචාර්ය තනතුරු සංඛ්‍යාව 1,080 ක් බවත් 2025 අප්‍රේල් 30 දිනට සත්‍ය තනතුරු අප්‍රේල් 539 ක් බවත් නිරීක්ෂණය වූ අතර ඒ අනුව පුරප්පාඩු කථිකාචාර්ය තනතුරු සංඛ්‍යාව 541 ක් වී තිබුණු අතර බොහෝ විද්‍යාපීඨවල වයස අවුරුදු 63ත් 70ත් අතර වයසේ පසුවන බාහිර කථිකාචාර්යවරුන් මාස 06න් 06ට කාලය දීර්ඝ කරමින් සේවයේ නිරතව සිටින බව නිරීක්ෂණය වුණි. එය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ශික්ෂණලාභීන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය කෙරෙහි දැඩි බලපෑමක් කළද, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඒ සම්බන්ධව නිසි අවධානය යොමු කර නොතිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත.	ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව පිළිබඳ සමාලෝචනයක් සිදු කර අත්‍යවශ්‍ය තනතුරු සඳහා නියමිත අනුමැතිය යටතේ බඳවා ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ඊ)	ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා නේවාසිකාගාර අධිකාරී (පිරිමි/ගැහැණු) තනතුරු 73 ක්ද, නේවාසිකාගාර සහකාර අධිකාර(පිරිමි /ගැහැණු) 74 ක්ද, අනුමතව තිබුණු නමුත් 2025 අප්‍රේල් 30 දිනය වන විට නේවාසිකාගාර අධිකාරී (පිරිමි/ගැහැණු) තනතුරු 58 ක් සහ නේවාසිකාගාර සහකාර අධිකාරී (පිරිමි/ගැහැණු) තනතුරු 33 ක් පුරප්පාඩු වී පැවතුණි.	සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරී තනතුරට 80ක් සීමිත පදනම මත බඳවාගැනීමට අනුමැතිය දී ඇත. ඒ සඳහා වූ විභාගයෙන් 47ක් සමත් වුවද අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මත 27ක් සඳහා 2025 ජූලි මස පත්වීම් ලබාදීමට කටයුතු කරයි. තවද රාජ්‍ය සේවයේ බඳවාගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද කමිටුව වෙත නව බඳවාගැනීම් නිර්දේශ කර 2025 මාර්තු 27 දිනැතිව ඉල්ලීමක් කර ඇත.	ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව පිළිබඳ සමාලෝචනයක් සිදු කර අත්‍යවශ්‍ය තනතුරු සඳහා නියමිත අනුමැතිය යටතේ බඳවා ගැනීමට කටයුතු කළ යුතු වීම.
(උ)	ජාතික පාසල්වල කාර්යමණ්ඩල තොරතුරු අනුව පාසල් සඳහා අනුමත සංවර්ධන නිලධාරී I, II, III ශ්‍රේණි තනතුරු සංඛ්‍යාව 1,297 ක් වන අතර 2024 දෙසැම්බර් 31 දිනට සත්‍ය කාර්ය මණ්ඩල සංඛ්‍යාව 2,313 ක් වීමෙන් කාර්යමණ්ඩලය 1,016 ක්	2022 වර්ෂයේ ස්ථිර පත්වීම් ලබාදුන් උපාධිධාරී අභ්‍යාසලාභීන් පුහුණුව සඳහා අනුයුක්ත කරන ලද සේවා ස්ථානයේහිම ස්ථිර පත්වීම් ලබාදෙන ලෙස උපදෙස් ලබා දී ඇත. එබැවින්, එම නිලධාරීන් පුහුණුව ලද ස්ථානවලටම අනුයුක්ත කිරීමේ දී ජාතික පාසල්වල තත්‍ය	අමාත්‍යාංශ මට්ටමින් අතිරික්ත හා ඌන තනතුරු අනුව නිලධාරීන් නිසි අනුමැතියක් මත ඵලදායීව අනුයුක්ත කළ යුතු වීම.

	අතිරික්තව ද ගුරු මධ්‍යස්ථාන සඳහා ප්‍රාථමික මට්ටමේ තනතුරු 111 ක් අනුමතව තිබුණු අතර සත්‍ය කාර්ය මණ්ඩල ප්‍රමාණය 123 ක් වීමෙන් අතිරික්ත සේවකයන් 12ක් ද ගුරු විද්‍යාලවල ද්විතියික හා ප්‍රාථමික මට්ටමේ අතිරික්ත සංඛ්‍යාව 40ක් ද ලෙස නිලධාරීන් 1,068 ක් අතිරික්තව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුයුක්ත කර තිබුණි. 2022 වර්ෂයේදී පත්වීම් ලබාදෙන ලද සංවර්ධන නිලධාරීන් අතිරික්තයක් ඇති නොවන පරිදි අනුයුක්ත කිරීමට ප්‍රමාණවත් පියවර ගැනීමක් අමාත්‍යාංශය මඟින් සිදු වී නොමැති බව පිළිතුර අනුව නිරීක්ෂණය වන අතර එම නිලධාරීන්ට ගෙවන ලද වැටුප් හා දීමනා නිෂ්කාර්ය වී තිබුණි.	සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව අනුමත සංඛ්‍යාව ඉක්මවා ඇත. ගුරු විද්‍යාල සඳහා ද්විතික හා ප්‍රාථමික මට්ටමේ තනතුරු අනුමත වී ඇත්තේ 2019 වර්ෂයේය. ඒ වනවිටද එම ආයතනවල සේවයකළ නිලධාරීන්ද කාර්ය මණ්ඩලය තුළට ඇතුළත්ය. අවුරුදු 05ට වැඩි නිලධාරීන් පිළිබඳ තොරතුරු වාර්ෂික ස්ථාන මාරුවලදී සලකා බැලීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරනු ලබයි. ගුරු මධ්‍යස්ථාන සඳහා සංවර්ධන නිලධාරී තනතුරු 336ක් අනුමත වීම නිසා මෙම අතිරික්ත සංවර්ධන නිලධාරීන් එම මධ්‍යස්ථාන සඳහා අනුයුක්ත කිරීම. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1868 හා 2024.03.06 දිනැති ලිපිය මඟින් ගුරු සංවර්ධන මධ්‍යස්ථාන සඳහා සංවර්ධන නිලධාරී තනතුරු 336ක් අනුමත කිරීම අනුව මේ වන විට දිවයින පුරා ජාතික පාසල්වල සිටින අතිරික්ත සංවර්ධන නිලධාරී කාර්යය මණ්ඩලය ආසන්න ගුරු සංවර්ධන මධ්‍යස්ථාන වෙත අනුයුක්ත කිරීමට අදාළ කටයුතු සිදුකරමින් පවතී. කෙසේ වෙතත් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩු අංක 77-2023, 78-2023, 88-2023 හා 95-2023 අනුව මෙම තුලනය කිරීම් තාවකාලිකව නතර කර ඇති බව.	
(ඌ)	ජාතික පාසල් සඳහා නේවාසිකාගාර පාලක පාලිකාවන් 258ක් අනුමත කර තිබුණද සත්‍ය ප්‍රමාණය 80ක් වීමෙන් තනතුරු 178 ක් පුරප්පාඩු වී පැවතුණි. පාසල් තුල නේවාසිකව සිටින දරුවන්ගේ කටයුතු පාලනය, අධීක්ෂණය වෙනුවෙන් අවශ්‍ය මෙම තනතුර විශාල ලෙස පුරප්පාඩු වීම කෙරෙහි අධ්‍යාපන අමාත්‍යාංශය අවධානය යොමු කර නොතිබුණි.	කළමනාකරණ සේවා අංක 02/2020 හා 2020 ඔක්තෝම්බර් 26 දිනැති චක්‍රලේඛය අනුව රජයේ බඳවාගැනීම් අත්හිටුවීම සිදුකරන ලදී. නිලධාරීන්ගේ විශ්‍රාම යාම, සේවය හැර යාම, වෙනත් තනතුරුවලට මුදාහැරීම වැනි හේතු නිසා මෙම තනතුරේ පුරප්පාඩු ඇති වී ඇත. රාජ්‍ය සේවයේ බඳවාගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සම්බන්ධ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිලධාරී කමිටුව විසින්	ආයතනික අරමුණු ප්‍රශස්ත ලෙස ඉටුකර ගැනීමට හැකිවන පරිදි මානව සම්පත් කළමනාකරණය කර ගැනීමට කටයුතු කල යුතු වීම.

		සහකාර ශිෂ්‍ය නිවාසාධිකාරී තනතුරට 80ක් සීමිත පදනම මත බඳවාගැනීමට අනුමැතිය දී ඇත. නව බඳවා ගැනීම් නිර්දේශ කර 2025 මාර්තු 27 දිනැතිව ඉල්ලීමක් කර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලැබීමෙන් පසු එම තනතුරු සඳහා නව බඳවා ගැනීම් සිදු කර මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ.	
(ඌ)	ජාතික පාසල් සඳහා තාක්ෂණපීය සහකාර තනතුරු 338ක් අනුමතව තිබුණද සියළුම තනතුරු ප්‍රමාණය පුරප්පාඩු වී පැවතුණි. එමෙන්ම රසායනාගාර සහකාර තනතුරු 554 ක් අනුමත වී තිබුණු අතර ඉන් තනතුරු 390 ක් පුරප්පාඩු වී පැවතුණි. ඒ අනුව දරුවන්ට ප්‍රයෝගික විද්‍යාත්මක දැනුම නිසි පරිදි ලබා දීම, පාසල් විද්‍යාගාර පාලනය, නඩත්තුව, මෙහෙයවීම පිළිබඳ ගැටළු මතුව තිබුණි.	රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුව වෙත නව බඳවා ගැනීම් නිර්දේශ කර 2025.03.27 දිනැතිව ඉල්ලීමක් කර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලැබීමෙන් පසු එම තනතුරු 338ම බඳවා ගැනීමට අපේක්ෂා කෙරේ. රසායනාගාර සහකාර තනතුර සඳහා කළමනාකරණ සේවා අංක 02/2020 හා 2020.10.26 දිනැති චක්‍රලේඛය අනුව රජයේ බඳවා ගැනීම් අත්හිටුවීම සිදුකර ඇත. නිලධාරීන්ගේ විශ්‍රාම යාම, සේවය හැර යාම, වෙනත් තනතුරු වලට මුදාහැරීම වැනි හේතු නිසා මෙම තනතුරේ පුරප්පාඩු ඇති වී ඇත.	ආයතනික අරමුණු ප්‍රශස්ත ලෙස ඉටුකර ගැනීමට හැකිවන පරිදි මානව සම්පත් කළමනාකරණය කර ගැනීමට කටයුතු කිරීම සහ චක්‍රලේඛ මගින් බඳවාගැනීම් පොදුවේ නතර කරනු ලැබුවද අත්‍යවශ්‍ය තනතුරු පිළිබඳව සමාලෝචනයක් සිදු කර ඒ අනුව රාජ්‍ය සේවයේ අත්‍යවශ්‍ය තනතුරු සඳහා බඳවාගැනීම් සිදුවූ බැවින් මෙම තනතුරු පිළිබඳව ද සමාලෝචනයක් සහිතව කරුණු දක්වමින් විශේෂ කමිටුවේ අනුමැතිය මත බඳවා ගැනීමට පියවර ගෙන නේවාසිකාගාර සිසු දරු දැරියන්ගේ සුරක්ෂිතතාවය තහවුරු කල යුතු බව.